# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 නොවැම්බර්
23 වෙළුම 08 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"අපි මුල පිරීම පටන් ගතිමු. කිනම් රටක නිර්ධන පංතිය විසින් කිනම් දවසක හා කිනම් වෙලාවක මේ ක්‍රියා දාමය සම්පූර්ණ කරනු ලබතිද යන්න වැදගත් නොවේ. වැදගත් දෙය නම්, අවහිරය මඟහරවා, මාර්ගය විවෘත කර, මාවත පෙන්වා දී තිබීමය ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**12වැනි වෙළුම,**
**41 පිටුව**



## නොමියෙනා මිනිසුන්ය ඔබ සැම...

**නොලැබ අහරක්**
**වේදනා දෙන කුසින් යුත්**
**පැතු නමුත් යුක්තිය**
**අයුක්තියටම බල කරන**
**ලද...**
**අහිමි කර අයිතීන්**
**මිනිසත් බවට උරුම ලද**
**පියවූ දෑස්, ගොළු කරන**
**ලද මුව**
**වසන ලද සවන්පත්**
**පිටිතලා හයා බඳින ලද**
**දෑත්**
**ඇති මිනිසුන් සිටි බිමක...**

**උරුම කළ ඉරණම**
**ගසා විසිකොට ඉවතට**
**දිනා ගනු වස් යුක්තිය**
**පෙරට ආ මිනිසුන්ය ඔබ**
**සැම...**
**සයින් පරිපීඩිතව**
**අසල සිටිනා මිනිස් කැළ**
**වෙත**
**ප්‍රේමයෙන්**
**නැගිටුවා මැළි දුරලන**
**අඬහැරය වූයෝය ඔබ**
**සැම...**
**දිනාගනු වස් සැමට**
**හිමිකම්**
**අහිමි කරගත්තෝය සැම**
**දෙය**
**කිසිවක්ම නොපැතූ**
**හිලව්වට**
**දිනූ දිවි වුව දෙවෙනි**
**කොට**
**පිළිගත් උණ්ඩ ළයකට**
**නොමියෙනා මිනිසුන්ය ඔබ**
**සැම...**

(2017 ඉල්මහ විරු සමරුව වෙනුවෙනි)

# විධායක ජනාධිපති ධුරය රැකගැනීමේ වෑයමක්

## පොරොන්දු ඉටුකරන ලෙස ජ.වි.පෙ. බලකරයි

**නව ව්‍යවස්ථාවක් අනවශ්‍ය බවට මේ වන විට නැගෙමින් ඇති ඝෝෂාව පිටුපස හුදු ජාතිවාදී කොටස් පමණක් නොව විධායක ධුරය වෙනස් නොකර තබා ගැනීමේ අවශ්‍යතාවය ඇති කොටස්ද සිටින බවට මේ වන විට අනාවරණය වෙමින් තිබේ.**

ජේ.ආර්. ජයවර්ධන විසින් 1978දී හඳුන්වා දෙන ලද ව්‍යවස්ථාවේ ප්‍රධානතම කරුණක් වූයේ ලොව කිසිදු රටක දක්නට නොමැති බලතල සහිත විධායක ජනාධිපති ධුරයය. එ.ජා.ප.යේ කුප්‍රකට 17 වසරක පාලනය තුළ එම ධුරයට එරෙහිව නැගුණු ජනතා විරෝධය හේතුවෙන් ඉන් පසුව බලයට පැමිණි සෑම ජනාධිපතිවරයෙක්ම ජනාධිපතිවරණ සමයේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට පොරොන්දු වී තිබිණි. විශේෂයෙන් 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක, 2005දී මහින්ද රාජපක්ෂ, 2015දී මෛත්‍රීපාල සිරිසේන යන සියලු දෙනා තමන්ගේ මැතිවරණ පොරොන්දුවලින් ප්‍රධාන එකක් බවට 'විධායක ජනාධිපති ධුරය අහෝසි කරනු ඇත' යන්න පත්කර ගත්හ.

කෙසේ වුවද බලයට පැමිණි පසු ඔවුන් විවිධ කරුණු දක්වමින් මෙම පොරොන්දුව ඉටුකිරීම පසෙක දමා කටයුතු කළ බව සනාථ වූ අතර වර්තමානයේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ හැසිරීමද ඊට වෙනස් නොවේ. විශේෂයෙන් රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ඒකාධිපති පාලනය පරාජයට පත්කිරීම සිය ප්‍රධානතම සටන් පාඨය බවට පත් කරගැනීමේදී මෛත්‍රීපාල සිරිසේන පොදු අපේක්ෂකයා විසින් තමන් අවසාන විධායක ජනාධිපතිවරයා වනු ඇති බව කිහිප විටක්ම ප්‍රකාශ කරනු ලැබීය.

කෙසේ වුවද මෙහි සරදම වනුයේ, මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ධුරය සඳහා ඉදිරිපත් වන විට ඔහුගේ ප්‍රතිවාදී අපේක්ෂකයාගේ ආධාරකරුවන්ව සිටි නිමල් සිරිපාල අමාත්‍යවරයා වැනි බොහෝ දෙනා මේ වන විට විධායක ජනාධිපති ධුරය අහෝසි නොකළ යුතු බව ප්‍රකාශ කරමින් ඔහුගේ ආරක්ෂකයින් ලෙස පෙනී සිටීමය. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාද පැරණි රාජ්‍යත්වය පෙන්නුම් කෙරෙන වප් මඟුල වැනි වැඩසටහන් සංවිධානය කරමින් විධායක ජනාධිපති ධුරය අහෝසි වීම පිළිබඳ සංවාදය නවතා නැවත ජනාධිපතිවරණයකට ඉදිරිපත්වීමේ ***02 වැනි පිටුවට***




### 05 ආණ්ඩු විරෝධයේ ඇත්ත...



රාජපක්ෂ කල්ලිය පාර්ලිමේන්තුවේ ඝෝෂාකර ඇත්තේ තමන්ගේ...

### 07 අයවැය කයිවාරු...



බොහෝවිට ආණ්ඩුවේ සැලැස්ම විය හැක්කේ ඡන්දය වෙනුවෙන්...

### 11 නීතිය: පංතිමය උපකරණයක්...




නීතිය යනු ඕනෑම රටක රජයේ එක් පාර්ශවයකි. ලොව පුරාම ධනවාදය...


සංවාදය........................ 03
තරුණ........................... 04
ආවර්ජනා...................... 06
ජාත්‍යන්තර..................... 08
ආර්ථික.......................... 09
කාන්තා.......................... 10
වේදිකාව........................ 13
විශේෂාංග....................... 14


***යුක්තිගරුක දේශයක්!    සාධාරණ සමාජයක්!!    නිවහල් මිනිසෙක්!!!***



# සටන් බිම

## ලංකා ගුරුසේවා සංගමයේ 19වැනි සමුළුව මුළුදෙයි



''එකම හඬක් - එකම තැනක්'' යන පාඨය පෙරදැරි කර ගනිමින් ලංකා ගුරුසේවා සංගමයේ 19වැනි වාර්ෂික සමුළුව ඔක්තෝබර් 13වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබීය. ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ඇතුළු ගුරු සේවයේ නියෝජිතයින් සහභාගි වූ මෙම සමුළුවේ ආරාධිතයින් ලෙස ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා සහභාගි වී සිටියහ.

ගුරු හා විදුහල්පති සේවාවන්ට අදාළ වෘත්තීය අභියෝග පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ මෙම සමුළුවේදී ඉදිරි වර්ෂයේදී ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධ යෝජනා ගණනාවක් සම්මත කර ගන්නා ලදී. එමෙන්ම මෙරට හතළිස්පන්ලක්ෂයක් පමණ වූ සිසු දරුවන්ගේ නිදහස් අධ්‍යාපන අයිතිය වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටීමටද සමුළුව තීරණය කරන ලදී.

## කෙනෙහිලිකම්වලට එරෙහිව සංවර්ධන නිලධාරීහු සටනට



සංවර්ධන නිලධාරින් මුහුණපාමින් සිටින වෘත්තීය ගැටලු සම්බන්ධව සංවර්ධන නිලධාරින්ගේ සංගමය අවස්ථා කිහිපයකදීම ස්වදේශ කටයුතු අමාත්‍යවරයා සමග සාකච්ඡා කිරීමෙන් පසු නිකුත් කරන ලද 07/2017 චක්‍රලේඛය මගින් සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව අදාළ ආයතන දැනුවත් කර තිබේ.

එහෙත් ඇතැම් ආයතන එම චක්‍රලේඛය නොසලකා හැරීම නිසා සංවර්ධන නිලධාරින්ගේ වෘත්තීය ගැටලු තවත් උග්‍ර අතට පත්වෙමින් තිබෙන බව සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා පවසා සිටී.

රාජ්‍ය සේවය තුළ සිටින ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා විවිධ තලයන්හි රාජකාරින්හි නිරත වන සෑම රාජ්‍ය සේවකයෙකුගේම වෘත්තීය හිමිකම්, වෘත්තීය ගරුත්වය ආරක්ෂා විය යුතු බව සංගමයේ ස්ථාවරය බවත්, එයට අනුව රාජකාරි කිරීමේ පසුබිම සකස් කර ගැනීම වෙනුවෙන් තම සංගමය අරගලයක නියැලී සිටින බවද සූරියආරච්චි සහෝදරයා පවසයි. එමෙන්ම ඔහු වැඩිදුරටත් නියමුවා වෙත පැවසුවේ, මේ සම්බන්ධයෙන් නැවතත් සවිස්තරාත්මක කරුණු සහිත ලිපියක් ස්වදේශ කටයුතු අමාත්‍යවරයා වෙත යොමු කර ඇති බවය. කෙසේ වුවද විසඳුම් නොලැබුණහොත් වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද ඔහු අවධාරණය කළේය.

## පෞද්ගලික අංශයටත් විශ්‍රාම වැටුපක් ඉල්ලයි



මෙරට පෞද්ගලික අංශයේ ආයතනවල සේවය කරන හැට ලක්ෂයකට අධික සේවක සේවිකාවන්ට විශ්‍රාම වැටුපක් හිමිවිය යුතු බව අන්තර් සමාගම් සේවක සංගමය ප්‍රකාශ කරයි.

සංගමය කැඳවා තිබූ මාධ්‍ය හමුවකදී එහි සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා ප්‍රකාශ කළේ, විශ්‍රාම වැටුපක් ලැබීම යනු සේවකයාගේ ජීවිතය සුරක්ෂිත කිරීමක් වන අතර එය පෞද්ගලික අංශ සේවකයාගේ දීර්ඝකාලීන අපේක්ෂාවක් බවය. මෙයට පෙර පැවති විවිධ ආණ්ඩු විසින් විවිධ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ගෙන ආ අතර 2011 වසරේ රාජපක්ෂ ජනාධිපතිවරයාද අර්ථසාධක අරමුදල වංචා කිරීමේ අරමුණින් විශ්‍රාම වැටුප් යෝජනාවක් ගෙන ආවද පෞද්ගලික අංශයේ සේවක සටනින් එම පටු අරමුණ පරාජයට පත්කළ බවත් ඔහු මතක් කර සිටියේය.

එබැවින් පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ට විශ්‍රාම වැටුපක් හිමිවන පරිද්දෙන් නීති සකස් කිරීම හා පවතින පනත් සංශෝධනය කරමින් ඒ සඳහා ප්‍රතිපාදන ඇති කරන ලෙස ආණ්ඩුවට බලකරන බවත්, මෙය 2018 අයවැය යෝජනාවක් ලෙස ආණ්ඩුවට ඉදිරිපත් කර ඇති බවත් එය සැලකිල්ලට නොගනිමින් ආණ්ඩුව අයවැය යෝජනා සකස් කරන්නේ නම් 80%ක් වන පුද්ගලික අංශයේ සේවක කොටස් සමග ඊට එරෙහිව රට පුරා විරෝධතා පෙළගස්වන බවද වසන්ත සමරසිංහ සහෝදරයා පවසා සිටී.

## විශ්‍රාමික ගැටලු ගැන වෘත්තීය සමිති මධ්‍යස්ථානයට පැමිණිලි

2016.01.01න් පසු රාජ්‍ය සේවයේ සිට විශ්‍රාම ගිය අයට ගැටලු සහගත තත්වයන් උද්ගත වී ඇති බවට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයට ඉල්ලීම් ලැබෙමින් පවතී.

විශ්‍රාම පාරිතෝෂිකය ලබාදෙනුයේ අදාළ වර්ෂයට අනුව ලබමින් සිටි වැටුප ගණනය කිරීමෙනි. නමුත් 3/2016 වැටුප් චක්‍රලේඛය අනුව ඔවුන් 2020 සිට ඇරඹෙන නව වැටුපට අනුව අඩුකළ විශ්‍රාම වැටුප ලෙස 10%ක් අඩු කරන්නේ නව වැටුපෙනි. ඒ අනුව ඔවුන්ට අඩු පාරිතෝෂික මුදලක් ලබා වැඩිපුර ගෙවීමක් සිදු කළ යුතුව තිබේ.

මීට අමතරව 2015 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරින් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා නිකුත් කළ චක්‍රලේඛය (අග්‍රහාර) මගින් 2016.01.01න් පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුපෙන් රු. 200ක් අයකර ගන්නා අතරම ඔවුන් අනිවාර්යයෙන් මෙහි දායකත්වය දැරිය යුතුය යන්නද දන්වා තිබේ. මේ කරුණු ඇතුළු ගැටලු ගණනාවක් සම්බන්ධව විසඳුම් අවශ්‍ය බැවින් කඩිනම් සාකච්ඡාවක් ලබාදෙන මෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ අත්සනින් යුත් ලිපියක් රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර තිබේ.

# එතෙරින්...

## දකුණු කොරියාවේ 'එතෙර අපි' මහා සභාව




පසුගියදා දකුණු කොරියාවේ සංචාරයක් සිදු කළ ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා දකුණු කොරියාවේ එතෙර අපි ප්‍රථම මහා සභාවට සහ තවත් ප්‍රදේශ කිහිපයක රැස්වීම්වලට සහභාගි විය. මහා සභා රැස්වීම සෝල් ප්‍රධාන නගරයේ පැවැති අතර එහිදි තෝරා ගනු ලැබූ පිරිසක් සඳහා විශේෂ ප්‍රණාම සම්මාන පිදීමක්ද සිදුවූ අතර නව නිලධාරි මණ්ඩලයක්ද පත්කරගනු ලැබීය. මීට අමතරව කිමී, ඉල්දෝන් සහ තේගු විහාරස්ථානයේ රැස්වීම් පැවැති අතර, යෝෂු ප්‍රදේශයේ ධීවර ගැටලු සඳහාද මැදිහත් විය.

## රුසියාවේ සෝචිහි ජ.වි.පෙ. හඬ රැව්දෙයි




සෝවියට් ඔක්තෝබර් විප්ලවයේ ශත වර්ෂය සැමරීම උදෙසා රුසියාවේ සෝචි නුවර පැවැති ලෝක තරුණ උළෙලේ 19වැනි සැසිවාරයට සහභාගි වූ ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී තරුණ සංගමයේ පිරිසේ ඉතා ක්‍රියාශීලී මැදිහත්වීම තරුණ උලෙළ පුරාම කැපී පෙනෙන මට්ටමේ ඇගයීමට ලක්ව ඇත. එහිදී වෙනිසියුලාව, කියුබාව, උතුරු කොරියාව හා පලස්තීනය යන රටවලට සහාය පළ කරමින් පැවැති සම්මන්ත්‍රණවලට ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරුන් අදහස් පළ කරමින් සම්බන්ධවී ඇති අතර රටවල් බොහෝමයක දේශපාලන සංවිධාන සමඟ නව සබඳතා ගොඩනගා ගැනීමටද  සමත් වී ඇත. පහත දැක්වෙන්නේ එවැනි අවස්ථාවකි.

## එතෙර අපි - අබුඩාබි පොත් ප්‍රදර්ශනයක්



එතෙර අපි සංවිධානයේ අබුඩාබි ශාඛාව සාහිත්‍ය මාසයට සමගාමී පැවැත්වූ පොත් ප්‍රදර්ශනයක් අබුඩාබිහි තානාපති කාර්යාල පරිශ්‍රයේදී පසුගිය සැප්තැම්බර් 28වැනි දින පවත්වන ලදී. එයට අබුඩාබිහි ශ්‍රී ලංකා තානාපති සුනිලයිමාන් මොහිදීන් මහතා ඇතුළු ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් සහභාගි වී ඇති අතර, මෙවැනි පොත් ප්‍රදර්ශනයක් අබුඩාබිහිදී පවත්වන ලද ප්‍රථම අවස්ථාව මෙය වේ.

## එතෙර අපි ක්‍රිකට් තරගාවලිය රෝමයේදී




එතෙර අපි සංවිධානයේ රෝම ශාඛාව සංවිධානය කරන ලද ක්‍රිකට් තරගාවලියක් පසුගියදා රෝමයේ Compo sportivo lago penstina හිදී පවත්වන ලදී. ප්‍රථම වතාවට සංවිධානය කරන ලද මෙම තරගාවලියට ක්‍රිකට් කණ්ඩායම් 18ක් සහභාගි වී ඇති අතර නාපොලි ප්‍රදේශයෙන්ද කණ්ඩායමක් ඉදිරිපත් වී ඇත. ශ්‍රී ලාංකිකයිනට නවමු අත්දැකීමක් වූ මේ අවස්ථාවට විශාල ලාංකිකයින් පිරිසක්ද සහභාගි වී තිබේ.

## හඳුන්නෙත්ති - කොරියානු තානාපති හමුවක්



පසුගියදා දකුණු කොරියානු සංචාරයකට එක්වූ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති මනේෂා ගුණසේකර සහ තානාපති නිලධාරීන් සමග දකුණු කොරියාවේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන ගැටලු පිළිබඳව සාකච්ඡාවක් කර ඇත. මෙම සාකච්ඡාවට එතෙර අපි කොරියානු ශාඛාවේ සභාපති ජානක නාගහවත්ත ඇතුළු නියෝජිතයින් එකතු වී තිබේ.

## නාපොලි චිත්‍ර හා අත්කම් දැක්මක්!



එතෙර අපි නාපොලි ශාඛාව සංවිධානය කරන ලද චිත්‍ර හා අත්කම් ප්‍රදර්ශනයක් පසුගියදා නාපොලිහිදී පැවැත්විණි. පසුගිය ඔක්තෝබර් 14 දින පැවැති මෙම උත්සවයේදි ශ්‍රී ලාංකික තරුණ තරුණියන් ඉදිරිපත් කළ විශිෂ්ට අත්කම් හා චිත්‍ර මෙන්ම කලා සංස්කෘතික අංගයන්ද එක්කර තිබුණි.

## විධායක ජනාධිපති ධුරය...

මුල් පිටුවෙන්

සූදානමක්ද ප්‍රදර්ශනය කරමින් සිටියි.

වර්ධනය වන මෙම තත්වය පිළිබඳව නියමුවා වෙත අදහස් දැක්වූ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පැවසුවේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති අපේක්ෂකයා විසින් විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට ජනතාවට ලබාදුන් පොරොන්දුව වෙනුවෙන් හැටදෙලක්ෂයක ජනවරමක් ලබාගෙන ඇති බැවින් ඔහුට කිසිසේත් එය නොතකා හැරිය නොහැකි බවය. "ඔහු වෙනස් ආකාරයකින් පත්වූ ජනාධිපතිවරයෙක්. ඔහුට තිබුණෙ අවම පෞද්ගලික ඡන්ද පදනමක්. ජනතාව ඔහුට ඡන්දය ප්‍රකාශ කළේ, ඔහු නියෝජනය කළ එකාධිපතිවාදයට, දූෂණයට එරෙහි සටන් පාඨ වෙනුවෙන්. ඒ පොරොන්දුවලට පිටුපාලා ඔහුට ගමනක් නැහැ; අනිවාර්යයෙන්ම පොරෙන්දු ඉටු කළ යුතුයි. ලංකාවේ නැවත වරක් ජනාධිපතිවරණ පවත්වන්න බැහැ." විජිත හේරත් සහෝදරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ඉල්මහේ නොමියෙන මතකය

"මිනිසාගේ අති උතුම් වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ, එක් වරක් පමණකි. අරමුණක් නැතිව ජීවත්වීම නිසා කටුක වේදනාවක් ඇති නොවනසේ, නීච සහ නොවැදගත් අතීතයක් නිසා ලැජ්ජාවීමට සිදු නොවනසේ ඔහු ජීවත් විය යුතුය. ඔහු මියයන විට ඔහුට මෙසේ කීමට පුළුවන්කමක් තිබිය යුතුය; මගේ මුළුමහත් ජීවිතයත් මුළුමහත් ශක්තියත් ලෝකයේ අතිශයින්ම උදාර හා සුන්දර පරමාර්ථය උදෙසා, එනම් මිනිස් සංහතියට විමුක්තිය ලබාදීමේ සටන උදෙසා කැප කරන ලදී" මානව වර්ගයාගේ විමුක්තිය උදෙසා සටන් කරන අව්‍යාජ විප්ලවවාදීන්ගේ ආදර්ශ පාඨය බවට පත් එම අනගිතම වැකිය ලියුවේ, සුප්‍රසිද්ධ සෝවියට් ගත්කතුවර නිකොලායි ඔස්ත්‍රොව්ස්කිය. ඔස්ත්‍රොව්ස්කිගේ ආදර්ශ පාඨයට අනුව ජීවත්ව, මානව විමුක්තිය වෙනුවෙන් සටන් කොට දිවි පිදූවන් සිහිපත් කරන මාස දෙකක් අපට තිබේ. ඒ, අප්‍රේලය හා නොවැම්බරයයි. නැතිනම් බක් මාසය හා ඉල් මාසයයි.

ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු අපගේ ප්‍රේමණීය සහෝදර සහෝදරියන් රැසක් ජනතාව වෙනුවෙන් දිවි පිදු 1989 ඉල් මාසයේ සිට මේ ඉල් මසට වසර 28ක කාලයක් ගතවී තිබේ. ඉල් මාසය එක් අතකින් අඳුරුය. ඒ අපට අපගේ නායකයින් හා සගයන් දහස් ගණනක් අහිමිවූ නිසාය. අනෙක් අතට ඉල්මාසය සොඳුරුය. ඒ කැපකිරීමේ, පරිත්‍යාගයේ, වීරත්වයේ හා මනුෂ්‍යත්වයේ පරමාදර්ශයන් ඒ තුළ ගැබ්ව පවතින නිසාය. මරණයෙන් උපන් සැබෑ මිනිසුන්ගේ මාසය නිසාම ඉල්මහද අමරණීය වී ඇත.

ඉල්මහේ විරුවන් වීරවරියන් අමරණීය වන්නේ ඇයි? ඔවුන් මුහුණ දුන් කටුක මරණය උත්තම පූජාවක් වන්නේ ඇයි? ජීවත්වන අප කෙරේ ඔවුන් මෙතරම්ම බලපාන්නේ ඇයි? ඒ අන්කිසිවක් නිසා නොව ඔවුන්ගේ ජීවිතය තුළ තිබූ උත්තම අරමුණ නිසාය. ඉල්මහේ විරුවන් දිවි පිදුවේ, තම පටු පෞද්ගලික වුවමනාවන් වෙනුවෙන් නොවේ. ඔවුන් ජීවිතයෙන් පැරදී දිවිනසාගත්තවුන්ද නොවේ. ඔවුන්ගේ ජීවිතය තුළ තිබූ එකම අරමුණ වූයේ, තම සහෝදර ජනතාව වෙත නිදහස් හා සාධාරණ සමාජයක් නිර්මාණය කර දීමේ පරම පවිත්‍ර චේතනාවමය. ඒ වෙනුවෙන් ජීවත් වූ ඔවුහු, ඒ වෙනුවෙන් දිවා රෑ නොබලා වෙහෙස වූ ඔවුහු, ඒ වෙනුවෙන් නින්දා අපහාස හා වද වේදනාවලට මුහුණදුන් ඔවුහු, ඒ වෙනුවෙන්ම සිය ජීවිතද පූජා කළෝය. ඔවුන් මිනිසුන් අතර පරමාදර්ශී වන්නේ ඒ නිසාය.

ලාංකේය පසුගාමී ධනවාදය තුළ ධනවාදී පීඩාවේ වියගසට ගෙල දී, වහල්කම දෛවයක් ලෙස පිළිගෙන නම්බුකාර විරෝධයක් හෝ නොපා, යදමින් බැඳී ජීවත්වූ මිනිසුන් අතර ධනවාදී වහල් බව ප්‍රතික්ෂේප කරමින් ඊට එරෙහිව නැගී සිට, නිදහස සහ සාධාරණත්වය වෙනුවෙන් සටන් වැදුන පරපුරකට ඉල්මහේ විරුවෝ අයත් වෙති. වේලාසන අවදි වූ ඔවුන් සිය වහල්කම ප්‍රතික්ෂේප කළා පමණක් නොව සහෝදර ජනතාව වහල්කමින් මුදා ගැනීමේ භාරධූර වගකීමද සිය දෙවුර මතට කැමැත්තෙන්ම පවරා ගත්හ. දුෂ්ට ධනවාදය වෙනුවට එය පෙරළා දමා ඒ වෙනුවට ප්‍රභාෂ්වර නව සමාජවාදී සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් ඔවුහූ දැනුවත්ව කටයුතු කළහ; සටන් කළහ. සතුරන් විසින් ඔවුන් අපෙන් උදුරාගනු ලැබුවේ එම සටන තුළය.

ඔවුන්ගේ මරණයෙන් වසර 28ක් ගෙවෙන මේ මොහොත ලාංකේය ධනවාදී සමාජය සකලාකාර අර්ථයෙන්ම පිරිහී කුණුවී දුගඳ හමන තත්වයට පත්ව තිබේ. රටේ නිෂ්පාදන මාර්ග බිඳ වැටී ඇති අතර ලංකාව ලෝකය හමුවේ ණයකරුවෙක් කරනු ලැබ තිබේ. ජනතාව අතර දරිද්‍රතාවය, ආර්ථික අසමානතාවය පැතිරෙද්දී පාලක කණ්ඩායම් කොල්ල කල්ලි බවට පත්ව මහජන මුදල් කෝටි ගණනින් හොරකම් කරමින්, වංචා කරමින්, නාස්ති කරමින් සිටී. අනෙක් අතට මානව සමාජයක පවතින මානවීය ගුණයන් සියල්ල දිනපතා සුණු විසුණු කරමින් තිබෙන බංකොලොත් ධනවාදය මිනිසුන් අතර ජාතිවාදය, ආගමික අන්තවාදය, කුලබේදය පතුරුවමින් ගෝත්‍රික සාමාජයක ලක්ෂණ පලකරමින් සිටී. එසේම අපරාධ, මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, ලිංගික හිංසන හා මනුෂ්‍යත්වය වෙනුවට කෲරත්වය ආදේශ වෙමින් පවතින අතර සමාජය යළි ම්ලේච්ඡත්වය වෙත ගමන් කරමින් සිටී.

දරුවන්ට ළමා කාලය අහිමි කළ අධ්‍යාපනයක්, තරුණයන්ට බලාපොරොත්තු අහිමි කළ අධ්‍යාපනයක් නිර්මාණය කර තිබෙන අතර දිළින්දන් අධ්‍යාපනයෙන් පිටමං කරමින් මුදලට අධ්‍යාපනය අලෙවි කෙරෙමින් තිබේ. සෞඛ්‍ය, ගමනාගමන සේවා බිඳවැටී බේදවාචක බවට පත්ව තිබේ. රටම අයාලේ ගමන්කරන අතර දේශපාලක කවටයෝ හා විකටයෝ "දෙවියන් පය නොතබන තැන්වල" පිනුම් ගසමින් සිටිති. මේ සියල්ල පවසන්නේ, ධනවාදය තුළ මානව වර්ගයාට අනාගතයක් නොමැති බවය. මීට වසර 28කට පෙර ඉල්මහේ දිවි පිදුවන් හඬගා තිබූ සත්‍යයද මෙයමය. එම සත්‍යය අද යළි යළිත් තහවුරු වෙමින් තිබේ. ඔවුන් ඇරඹූ කාර්යය අප නිමාකළ යුත්තේ ඒ නිසාය.



# ජනතාව හරි දේ හරි විදියට කරනවා නම් ලංකාවේ සමාජවාදය දුර නැහැ

**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික**
**කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා**

***නියමුවා:- සයිටම් සටනේ වර්තමාන තත්වය කොහොමද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** සයිටම් වහන්න කියලා බලකරමින් නොවැම්බර් 06 මාරාන්තික උපවාසයක් පටන් ගන්නවා. ජීවිත බිලි නොගෙන සයිටම් වහන්න කියල රට පුරාම උද්ඝෝෂණ පැවැත්වෙනවා. උපවාසය සංවිධානය කරන්නේ, රජයේ වෛද්‍ය පීඨ අටේ ඉගෙන ගන්න දරුවන්ගේ දෙමව්පියන්. අපේ පක්ෂයත් අපේ වෘත්තීය සමිති ව්‍යාපාරයත් "සයිටම් විරෝධී ජන පවුර" සංවිධානය තුළ ක්‍රියාත්මක වෙමින් සයිටම් වසා දමා, සියලු දරුවන්ට සාධාරණය ඉටුකර ගැනීමේ සටනේ ක්‍රියාත්මක වෙනවා.

මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියත් ටිකෙන් ටික අධ්‍යාපනය විකුණන එක. ලංකාවේ සමාජවාදී විප්ලවය ජය ගන්නකම් අධ්‍යාපනය, සෞඛ්‍ය වගේ සේවාවන් විකිණීම නවත්තන්න බැහැ. සයිටම් විරෝධී සටන දිගින් දිගටම නොනැවතී කරගෙන යන නිසා ආණ්ඩුව හදන්නෙ රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් බවට සයිටම් එක පත්කරන්න. සයිටම් ගැටලුව සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ යෝජනා මාලාව ජනතාව රැවටීමක් මිස ප්‍රශ්නයට විසඳුම නොවෙයි. ජනතාව තේරුම් ගන්න ඕන දෙයක් තියෙනවා. සියලු දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන ආණ්ඩුවක්, රජයක් බිහිකර ගන්නෙ නැතිව. මේ ප්‍රශ්නයට අවසන් උත්තරයක් ලබාගන්න බැහැ කියන එක තමයි ඇත්තම කතාව. දුප්පත් පොහොසත් පදනම මත දරුවන්ට ඉගෙන ගන්න නොලැබෙන, ලැබෙන එක තීරණය වෙන සමාජයක් මේ තියෙන්නෙ. මේක වැරදියි. මේ වැරැද්ද හදන්න ඕනෑ. ජනතාව හරි දේ හරි විදියට කරනව නම් ඒක කරන්න පුළුවන්.

***නියමුවා:- වෘත්තීය සමිති ව්‍යාපාරය ආණ්ඩුවේ ආර්ථික ක්‍රියාකාරීත්වයට එරෙහිව පෙළගැස්වීම සම්බන්ධයෙන් ඔබගේ පැහැදිලි කිරීම කුමක්ද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය මේ ආණ්ඩුවේ ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධවයි වැඩ කරන්නෙ. එහෙම වැඩකරන ගමන් සමාජවාදී රජයක් ඇතිකර ගන්න අපි වැඩකරගෙන යනවා. එදිනෙදා පැමිණෙන ආණ්ඩුවේ ආර්ථික ප්‍රහාරයන්ට විරුද්ධ වෙමින් ජනතාවගේ පැත්තෙ ඉඳන් අපි එක දිගට සටන් කරනවා. මේ ආණ්ඩුව ආවට පස්සෙ වැඩිවුණ ජීවන වියදම ඉල්ලලා අපි වැටුප් සටනක් මේ දැනුත් කරගෙන යනවා. ස්ථිර වැටුපකින් ජීවත් වෙන ජනතාවගේ ජීවන තත්වය පහළට වැටෙන්නෙ නැතිවෙන්න නම් වැඩිවෙන ජීවන වියදමට ගැලපෙන වැටුප් වැඩිවීමක් ඕනෑ. ඒක ප්‍රතික්ෂේප කරන්න කිසිවෙකුට බැහැ. රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය මේ වගේ සටන්වලදී එකතු කරගන්න අපි කැමතියි. නමුත් සමහර සමිති එහාට මෙහාට වැනෙන නිසා තමයි මේ සටන් දිනාගන්න වෙලාව ගත වෙන්නෙ. එකිනෙකාගේ වෙනස්කම් පිළිගනිමින් ඒවාට ගරු කරමින් පොදු අරගලයට පොදුවේ එකඟ වෙමු කියලයි අපි, අපේ නොවන සමිතිවලට කියන්නෙ. එකඟවීම වැදගත් වගේම එක්ව සටන් කිරීම කළ යුතුයි. මෛත්‍රී-රනිල් හවුල දැනට ඉතිරිවී තිබෙන සියල්ල විකුණන සැලැස්ම කරගෙන යනවා. ජනතාවගේ සටන් නිසා සමහර දේවල් බේරගෙන තියෙනවා. උදාහරණයක් "එට්කා" නමින් ආව විකිණීම පස්සට තල්ලු කළේ පොදුජන අරගලයේ ශක්තියෙන්. ඒ වගේම සටනේ ශක්තිය දුර්වල වෙලාව බලලා විකිණීම කරගෙනත් කියෙනවා. උදාහරණයක් විදිහට හම්බන්තොට වරාය සහ ඉඩම් චීනයට පැවරීම දක්වන්න පුළුවන්. මේ රටේ ජනතාව 2020දීවත් ප්‍රගතිශීලී ආණ්ඩුවක් ඇතිකර ගන්න ඕනෑ. එතකන් විකිණීම ප්‍රමාදකර ගැනීම වුණත් වැදගත්. මේ ධනවාදය ඇතුළේ විකිණීම නවත්තන්න බැහැ. වැදගත්ම තැන් අල්ලාගෙන සිටීම. විකිණීම ප්‍රමාද කිරීම තමයි දැනට කරගන්න වෙන්නෙ.

***නියමුවා:- 2020 ඉලක්ක කරගත් ජ.වි.පෙ. වැඩපිළිවෙළේ වර්තමානය කෙබඳුද?***


***ලාල්කාන්ත සහෝදරයා:-*** මේ ප්‍රශ්නයට උත්තරය ටිකක් දිගයි. පැහැදිලි කරන්න ගොඩාක් දේවල් තියෙනවා. අනිවාර්ය කරුණු කිහිපයක් කියන්නම්. 2020 මහ මැතිවරණයෙන් ජනතාව දිනන්න ඕනෑ.

> ජීවත්වෙන්න ඕන දෙයක් කරන්න සූදානම්, ජරාවැඩක් කරන සමාජයක් දැනටම ඇවිත්. බල්ලො මරල සල්ලි හොයපු කාලෙ දැන් ඉවරයි. මිනී මරල සල්ලි සොයන කාලෙ මේ. මිනියෙනුත් සල්ලි හොයනවා. ගන්න දෙයක් මේ සමාජයේ දැන් නැහැ. කුණු වෙලා ඕජස් ගලනවා. අලුත් සමාජයක් නැතිව මේකෙ ඉන්න බැහැ කියල තේරුම් අරන් අලුත් සමාජයක් හදන්න බලයක් හදමු. සමාජවාදය විතරයි උත්තරේ.

යූ.ඇන්.පී.-ශ්‍රී ලංකා පක්ෂ දෙකෙන්ම ජනතාව ගැලවෙන්න ඕනෑ. ජනතාව අලුත් වෙන්නෙ නැත්නම් රට අලුත් කරන්න බැහැ. පරණ ජනතාවක් එක්ක පරණ ජරා දේශපාලනයට යන්නයි වෙන්නෙ. අලුත් ජනතාවක් එක්ක විතරයි අලුත් දේශපාලනයකට යන්න පුළුවන් වෙන්නෙ. ඒ නිසා ජනතාවට නිවැරදි දේශපාලන මඟ පෙන්වීම කරන පක්ෂය විදියට අපි ජනතාවගෙන් ඉල්ලනවා, දේශපාලනයේදී අලුත් වෙන්න කියලා. 2020න් එහාට ඉදිරියට ඕන කරන "අලුත් රට" වෙනුවෙන් අපිත් විද්වතුනුත් එකතුවෙලා ආර්ථික ප්‍රතිපත්තියක් හදාගෙන යනවා. රටේ තියෙන සියලු බරපතළ ගැටලුවලට දිගුකාලීන, මැද කාලීන, කෙටිකාලීන "ජාතික සැලැස්මක්" විද්වතුන් විසින් හදනවා. ඒ වැඩපිළිවෙළ තමයි අපි ජනතාවට ඉදිරිපත් කරන්නෙ. ඒක ජනතාවට ඉදිරිපත් කරන්නේ, එය ක්‍රියාත්මක කිරීමට බලය ඉල්ලන ජනතා ව්‍යාපාරයක් මගින්. ඒ කියන්නෙ අලුත් ජනතා ව්‍යාපාරයක් මගින් තමයි අපි බලය ඉල්ලන්නෙ. ඒ ජනතා ව්‍යාපාරය හදන්න ඕන අමුද්‍රව්‍ය, උපකරණ, මානව සම්පත් අපි එකතු කරමින් ඉන්නවා. ඉදිරි පළාත් පාලන ඡන්දයත් අපි පාවිච්චි කරනවා යම් යම් අත්හදා බැලීම් කරන්න.

***නියමුවා:- එළඹෙන පළාත් පාලන මැතිවරණයට ජ.වි.පෙ.න් අපේක්ෂකත්වය ලබාදීමට විවෘත ආරාධනාවක් කිරීමට අදහස් කළේ ඇයි?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** එහෙම කළේ 2020 වැඩපිළිවෙලේ තවත් පියවරක් විදියට. අපි යහපත් දේශපාලන සංස්කෘතියක් පවත්වාගෙන යන පක්ෂයක්. රට හදන්න ඒක අත්‍යාවශ්‍ය කාරණයක්. පළාත් පාලන ඡන්දයේ කොට්ඨාස ක්‍රමය ගමට හොඳ දේශපාලන සංස්කෘතියක් ගේන්න පාවිච්චි කරගන්න පුළුවන්. මනාප ඡන්ද ක්‍රමය නිසා දේශපාලන බලු පොරයට වැටෙන්න අකමැති උගත් බුද්ධිමත් පුරවැසියො දේශපාලනයට එන්න අකමැති වුණා. ගම් ඇතුළෙ එවැනි අය දේශපාලනයෙන් හුදකලා වුණා. මුළු පළාත් පාලන බල ප්‍රදේශයක් පුරා ඡන්දෙට දුවන්න ඕනෑ. ලොකු මුදලක් නැතිව ඒක කරන්නත් 15 වැනි පිටුවට



# YES WE CAN

# වර්තමානයටද වැදගත් ඉල්මහ විරුවන්ගේ ආදර්ශය

1948 ලාංකේය භූමිය බ්‍රිතාන්‍ය පාලකයන්ගෙන් ලබාගත් නාමික නිදහසින් පසුව නව යටත්විජිත වහල්භාවයට ඇද දැමීමට කටයුතු කළ අප රටේ ධනපති පාලකයන් තමනට අවැසි පරිදි සූරාකමින්ද අධිරාජ්‍යවාදීන්ට වුවමනා පරිදි සූරාකෑමට ඉඩ සලසමින්ද කටයුතු කළේය. මෙකී තත්වය හමුවේ රටේ බොහෝ දෙනෙකුන් පීඩාවට ලක්වුවද මීට එරෙහි සටන් කිරීමට නිවැරදි නායකත්වයක් නොමැතිවීම හේතුවෙන් ධනපති පාලකයන්ට තමන්ට අවශ්‍ය පරිදි කටයුතු කිරීමට ඉඩ ලැබුණි.

මෙවන් වටපිටාවක ලාංකේය දේශපාලනය මුළුමනින්ම වෙනස් මඟකට යොමු කළ ඒ යුග පුරුෂයා අන්කවරෙකු නොව අප පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයායි. ඔහුත් සමග දහස් ගණනක් වූ සටන් සගයින් අපෙන් උදුරා ගෙන එලැඹෙන නොවැම්බර් 13වැනිදාට වසර 28ක් ගෙවී ගියද ඔවුන්ගත් මඟ ගනිමින් වත්මන් ධනපති පාලනයට එරෙහි සටන් වදින සටන් සගයන් දහස් ගණනක් නිර්මාණය කිරීමට ඔහුගේ ආදර්ශයන් ඉවහල් විය.

අප රටේ පීඩිත ජනතාව පැරණි වමේ දේශපාලන පාවාදීම් හමුවේ අයුක්තියට අසාධාරණයට එරෙහි හඬ නැගීම අතහැර දමා සිටි යුගයක තමන් පිඩාවට ලක්වන තමන් මුහුණ දෙන ප්‍රශ්න වල සැබෑ වගකිවයුත්තා පවතින වැරදි සමාජ ආර්ථික ක්‍රමය බව ක්‍රමානුකූලව අවබෝධ කරමින් ඊට එරෙහි සටනක් කිරීම සැබෑ මිනිසුන්ගේ වගකීම බව රෝහණ සහෝදරයා පෙන්වා දුන්නේය. ලාංකේය තාරුණ්‍ය අරගල මාවතට ගැනීම උදෙසා ඔහු කළ කැපකිරීම් අප්‍රමාණය. තමන් ඉදිරියේ වූ අභියෝග, දුෂ්කරතාවයන් හමුවේ තම අරමුණ කිසිවිටෙක අත්නොහල ඔහු මිනිසුන් දේශපාලන සටන් මඟට ගැනීම වෙනුවෙන් ඔවුන් සමග උරෙනුර ගැටී වැඩ කළේය. වැඩපලේ මෙන්ම ගොවිබිමේද සිටි තරුණයන් තමන් මුහුණදෙන පීඩාවට එරෙහි සටන් කරන සටන් සගයන් බවට පත්කළේය. පුද්ගලික අරමුණු වෙනුවෙන් තම ජීවියම කැපකර සිටි මිනිසුන් පොදු අරමුණු වෙනුවෙන්, සමාජය වෙනුවෙන් වැඩකරන අය බවට පත් කළේය. එම කටයුත්තේදී ඔහු අන් අයට වඩා ඉදිරියෙන් සිට ගත්තේය. ආර්ථික දුෂ්කරතා හමුවේ නිවැරදි දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම වෙනුවෙන් මුට්ට කර ගැසුවේය. එවන් පළල්තම ආදර්ශයක් ඔහු තම සගයින්ට ලබා දුන්ණේය.

වර්මානය වන විටද අප ජීවත්වන සමාජය ධනපති දේශපාලනයේ ගොදුරක්ව වඩා වේගයෙන් පරිහානියට පත්වෙමින් ඇත. එවන් වටපිටාවක මෙකී සමාජ ක්‍රමය වෙනස් කිරීම උදෙසා වැඩකරන දේශපාලන ව්‍යාපාරයක කොටස්කරුවන් වන අප ඉල්මහ විරුවන්ගේ එකී භාවිතය ආදර්ශයට ගෙන වර්තමානයේ අප ඉදිරියේ වන අභියොගයන් ජය ගැනීමට ධෛර්ය සම්පන්නව කටයුතු කළ යුතුව ඇත.




# අහිමි කළද පරාජය කළ නොහැකි මිනිසා චේ...

මිනිස් ඉතිහාසයේ මිනිසාගේ යහපැවැත්ම වෙනුවෙන් මිනිසුන් සමග සටන් කළ වීරයෝ බොහෝ වෙති. ඔවුන් අතුරින් පීඩිතයින් වෙනුවෙන් පෙනී සිටිමින් පීඩිතයින්ට විමුක්තිය උදාකරලීමට තම තරුණ ජවය, ශක්තිය, දැනුම, අවසන තම ජීවිතයම කැප කළ තාරුණ්‍යයේ වීරයා චේ ගුවේරාය. තාරුණ්‍යයේ නොනිවෙන රතු තරුව ලෙස හඳුන්වන චේ සහෝදරයා ඝාතනය කොට වසර පනහක් ගෙවෙන මේ ඔක්තෝබරයේ ඔහුගේ ගුණ කදම්භය සිහිකරමින් චේ සැමරුවෙමු. ඔක්තෝබර් 08වැනි දින හොරණ, මොරගහහේන, චේ උද්‍යානයේ චේගේ දෑතින් සිටවූ මහෝගනී වෘක්ෂය අසළදී චේ ගුවේරා සහෝදරයාට පුෂ්පෝපහාර දැක්වීමක් සිදුවිය.

ඒ සඳහා ශ්‍රී ලංකාවේ කියුබන් තානාපතිනි එලීනා රාමෝස් මැතිණිය, ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා, පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, කියුබානු ශ්‍රී ලංකා සහයෝගීතා පදනමේ ලේකම් සහෝදරයා ඇතුළු චේ සහෝදරයාට ආදරය කරන බොහෝ දෙනෙක් එක්වූහ.

චේ සැමරුම් ප්‍රධාන උත්සවය තිස්සමහාරාම, දෙබරවැව මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එහි පළමු අංගය වූයේ, චේ සහෝදරයාගේ සංචාරක ජීවිතය සිහිගන්වමින් පැවැත්වුණු මෝටර් සයිකල් පෙළපාළියයි. මාතර නගරයෙන් ආරම්භ වූ එය දෙවන අදියර ලෙස තංගල්ල නගරයෙන්ද සිය ගණනක් වූ මෝටර් බයිසිකල් දෙබරවැව මහජන ක්‍රීඩාංගනයෙන් ගමන අවසන් කළේ රතු ධජ ගුවනේ ලෙලදෙවමින් චේ සහෝදරයාගේ දකුණු ඇමරිකානු සංචාරක ජීවිතයට උත්තමාචාර පුදකරමිනි.

සටන් කරන තාරුණ්‍යයට FORWARD පුවත්පත, 'චේ: නොනිමි අරගලයේ අඩසියවසක් 1967-2017' මුල්පිටෙන් චේ රුව රැගත්, ලාංකේය සටන් සගයන් වෙත සෙනෙහසින් පිළිගන්වනු ලැබිණි. සමාජවාදී තරුණ සංගමයේ එරංග ගුණසේකර හා බන්දුල සහෝදරයන්ගේ දෑතින් සමන්ත විද්‍යාරත්න සහෝදරයාට FORWARD මංගල කලාපය පිළිගන්වන ලදී.

'අහිමි කළද පරාජය කළ නොහැකි මිනිසා චේ'. චේ ගුවේරාගේ ජීවිතයේ සුවිශේෂී බොහෝ දේ කැටිකොට චේ චරිතය ඉගෙන ගන්නට අත්වැලක් සපයන චේ චරිතාපදානය සමාජවාදී තරුණ සංගමයේ එරංග ගුණසේකර සහ අංජන සහෝදරවරුන්ගේ දෑතින් ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනි එරිනා රාමෝස් මැතිනියට පිළිගන්වන ලදී.

ලෝක තරුණ හා ශිෂ්‍ය උලෙළ වෙනුවෙන් දැල්වූ පහන් ආලෝක රැගත් බකට් සිය ගණනක් දෙබරවැව මහජන ක්‍රීඩාංගණයේ අහස විචිත්‍රවත් කරමින් චේ සැමරුම් උලෙළ ආලෝකමත් කළේය.

ඒ අතර සමන්ත විද්‍යාරත්න සහෝදරයාගේ ප්‍රධාන දේශනය සහ ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනියගේ විශේෂ දේශනයකිනුත් යුතු චේ සැමරුම් උලෙළ CHANGE සංගීත කණ්ඩායම ඉදිරිපත් කළ සංස්කෘතික ප්‍රසංගයෙන් අවසන් විය.






























# ලෝක තරුණ උළෙලට සමගාමීව තරුණ සංගමයට ජයග්‍රහණ රැසක්

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය (WFDY) විසින් සංවිධානයක කෙරුණු 19වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල පසුගිය ඔක්තෝබර් 15-22 දක්වා දින 07ක් පුරා රුසියාවේ සෝචි නුවරදී ඉතා සාර්ථකව නිමාවට පත්විය. ලොව පුරා 150කට වැඩි රටවල් ප්‍රමාණයකින් තරුණ හා ශිෂ්‍ය සංවිධාන හා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 20,000කට අධික තරුණ තරුණයින් පිරිසක් එයට සහභාගි විය.

මේ සඳහා සමාජවාදී රාජ්‍යයන් නියෝජනය කරන තරුණ සංවිධාන මෙන්ම, ප්‍රගතිශීලී අධිරාජ්‍යවිරෝධී හා වාමාංශික තරුණ හා ශිෂ්‍ය සංවිධානවලින් විශාල පිරිසක් සහභාගි වූහ. ඔවුන් ලෝකයේ විවිධ කලාපවලින් පැමිණියද එක් අරමුණක් වෙනුවෙන් සටන් කරන්නා වූ පිරිසක් නිසාම විවිධත්වය මැද ඒකත්වයක් උළෙලට සහභාගි වූ තමන්ට අත්දකින්නට ලැබුණි. එකිනෙකාගේ සංස්කෘතිය, භාෂාව, විලාසිතාවල වෙනස්කම් පැවතියද ඒවා උළෙල තවත් විචිත්‍රවත් කළා මිස. බාධාවක් නොවුණි. එහෙයින් එක් එක් රටවල සටන් ව්‍යාපාරයන් පිළිබඳවත් ඔවුන්ගේ අත්දැකීම්, දැනුම බෙදාගැනීමටත් ගෝලීය දේශපාලන හා සමාජ තත්වයන් පිළිබඳව පුළුල් සාකච්ඡා ඇතිකර ගැනීමත් හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධවද සාකච්ඡා කෙරුණු අතර ජාත්‍යන්තර වශයෙන් සහෝදර සංවිධාන අතර සම්බන්ධතා ගොඩනගා ගැනීමටත් මිත්‍රත්වය හා විශ්වාසය වර්ධනය කර ගැනීමටත් ඒ තුළින් අරගලය ශක්තිමත් කර ගැනීමටත් අවස්ථාව සැලසුණි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂවල තරුණ හා ශිෂ්‍ය සංවිධාන නියෝජනය කරමින් 320කට ආසන්න පිරිසක් උළෙලට සහභාගි වූ අතර එයින් සමාජවාදී තරුණ සංගමයත් සමාජවාදී ශිෂ්‍ය සංගමයත් උළෙලේ අරමුණු මත කටයුතු කරමින් සුවිශාල ජයග්‍රහණයක් අත්පත්කර ගැනීමට හැකියාව ලැබුණි. මෙවර උළෙළ සඳහා අප පක්ෂය නියෝජනය කරමින් සහෝදර සහෝදරියන් 25 දෙනෙකු සම්බන්ධ වූ අතර ඉන් අඩක්ම පක්ෂයේ විදෙස් කමිටු නියෝජනය කරමින් එහි ඉදිරියෙන් වැඩකරන සහෝදර සහෝදරියන්ගෙන් සමන්විත විය. උළෙල ඉතිහාසය තුළ අප පක්ෂය නියෝජනය කරමින් උළෙලක් සඳහා සහභාගී වූ විශාලම පිරිසද මෙයමෙවර සහභාගි කරවීමට හැකිවීමද ජයග්‍රහණයකි.

මෙරට තරුණයා මුහුණ දී ඇති ගැටලු වෙනුවෙන් පෙනී සිටිමින් තරුණ විරැකියාව, විෂ මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධවත්, නිදහස් අධ්‍යාපනය කප්පාදුව, මුදලට අධ්‍යාපනය විකිණීමට එරෙහිවත් අප සිදුකරන අරගලය පිළිබඳවත් ලොව පුරා විශාල සංවිධාන රාශියක් දැනුවත් කිරීමත් අරගලයේ අත්දැකීම් බෙදාගැනීමටත් හැකියාව ලැබුණු අතර කියුබාව, වෙනිසියුලාව, උතුරු කොරියාව, පලස්තීනය, බටහිර සහරා වැනි රටවල් වෙනුවෙන් පැවැත්වුණු සහයෝගීතා වැඩසටහන් සඳහා ඉහළ මැදිහත්වීමක් සිදුකිරීමටද හැකියාව ලැබුණි. ඊට අමතරව අධිරාජ්‍යවිරෝධී අධිකරණය හමුවේ, ලංකාවේ උතුරු මැද පළාත් වකුගඩු රෝගය පැතිර යාම හා කෘෂි රසායන ද්‍රව්‍යවලින් සිදුවන හානිය සම්බන්ධ නඩුවක් ගොනු කිරීමටත් අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහිව, විශේෂයෙන් සයිටම් අහෝසි කිරීම සඳහා මෙරට සිසු පරපුරේ දැවැන්ත අරගලය පිළිබඳව ලෝකය දැනුවත් කිරීමටත් ඒ සඳහා සහයෝගීතා බැනරයක් අත්සන් කිරීමටත් කටයුතු කළ අතර ලෝක සරණාගත ගැටලුව හා අධිරාජ්‍යවාදය, මාධ්‍ය සහ තොරතුරු සන්නිවේදනයේ අධිරාජ්‍යවාදී හැසිරවීමට 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට වසර 100ක් සපිරීම නිමිත්තෙන් සංවිධානය කර තිබූ වැඩසටහන්, ෆිදෙල්, චේ ගුවේරා සහ කියුබානු විප්ලවය ගැනත් ඇතුළු සම්මන්ත්‍රණ වැඩමුළු, සාකච්ඡා රාශියකට සමාජවාදී තරුණ සංගමය ලෙසත් සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෙසත් සම්බන්ධ වීමට හැකියාව ලැබුණු අතර ඒ තුළින් පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳවත් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳවත් වැඩි අවධානයක් ලැබීම අප ලද ජයග්‍රහණයකි. එමෙන්ම අලුත් සහෝදර සහෝදරියන් ප්‍රමාණයක් තහවුරු කරගැනීමට, හඳුන්වාදීමට හැකිවීමද තවත් ජයග්‍රහණයකි.


සමාජවාදී තරුණ සංගමය ලෙස මෙම උළෙල තුළින් විශාල අත්දැකීම් ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවූ අතර ආසියානු කලාපයේ හා අනෙකුත් කලාපවල තරුණ සංවිධාන සමඟ පැවැත්වූ ද්වීපාර්ශ්වික සාකච්ඡා මගින් මිත්‍රත්වය තහවුරු කරගැනීමටත් ජාත්‍යන්තර සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීමටත් හැකියාව ලැබුණි. පසුගිය වසරක කාලයක් තුළ රට තුළත් ජාත්‍යන්තරය උළෙල තුළත් කළ මැදිහත්වීම් නිසා සමාජවාදී තරුණ සංගමය ශක්තිමත් තරුණ ව්‍යාපාරයක් බවට සැලකිය යුතු තහවුරු කරගැනීමක් කරගෙන ඇත්තෙමු. එබැවින් මෙවැනි ජාත්‍යන්තර අවස්ථාවන් ඉතා වැදගත් වන අතර ඉදිරියේදීත් ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය සමඟ එක්ව ඉතා ප්‍රබල ලෙස කටයුතු කිරීමටත් මැදිහත්වීමටත් අප බලාපොරොත්තු වෙමු.

# ආණ්ඩු විරෝධයේ ඇත්ත හා නැත්ත

මේ වන විට වර්තමාන එක්සත් ජාතික පක්ෂ-ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හවුල් පාලනය ජනතාවට එපා වෙමින් පවතී. ඊනියා යහපාලන ආණ්ඩුවට එරෙහිව ජනතා විරෝධය සතර අතින් මෝදුවෙමින් තිබේ. එහෙත් එම ආණ්ඩු විරෝධය, මීට කලින් බලයේ සිට පරාජයට පත්වූ රාජපක්ෂ කල්ලියට නැවත බලය සඳහා පාර කපන බවක් පෙනෙන්නේද නැත. එම ආණ්ඩු විරෝධය තුළ, සමාජය තුළ දිනපතා ජනතා ප්‍රසාදය වැඩිවෙමින් තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණටය. මේ නිසා පරාජයට පත්ව, බංකොලොත්ව සිටින රාජපක්ෂ කල්ලිය වියරු වැටී තිබේ.

රාජපක්ෂ කල්ලියේ වියරුවට ඉතා පැහැදිලි හේතු තිබේ. ඒ ඔවුනට යළි බලයට ඒම සඳහා පුංචි ඉඩක් හෝ තිබුණේ නම් දිනපතා එය අහෝසි වෙමින් තිබීමය. එක් අතකින් රාජපක්ෂ කල්ලියට එරෙහිව වංචා - දූෂණ නඩු රැසක් වැටී තිබෙන අතර, ඒවා විභාග කිරීමටද පටන්ගෙන තිබේ. රනිල් වික්‍රමසිංහ හා මහින්ද රාජපක්ෂ අතර ඇති පන්තිමය අවබෝධය හා ඒකගතාවය නිසා රාජපක්ෂ පවුලේ අයට කරදරයක් නොවුණත් රාජපක්ෂ මහතා වටේ සිටින දූෂිතයන්ට දඬුවම් විඳීමට සිදුවනු ඇත. ඔවුනට ඉන් මිදිය හැකි එකම මඟ වන්නේ යළි බලටය පත්වීමය. ඒ අනුව ඉක්මනින් බලයට පත්වීමට ඔවුනට අවශ්‍ය අතර ඊට ඇති අවකාශය ජනතා විමුක්ති පෙරමුණ නිසා අවහිර වනවිට ඔවුහු කෝපයට හා වියරුවට පත්වෙති. එහිදී එම කෝපය එල්ල වන්නේ, ධනපති ආණ්ඩුව වෙත නොව ජනතා විමුක්ති පෙරමුණ වෙතය.

රාජපක්ෂවරු යළි බලයට එන බවට පසුගිය කාලයේ දෙඩූ පුරසාරම් දැන් පුස්සක් බවට පත්ව තිබේ. දෙපෝයකින් ආණ්ඩු බලය ගැනීමට කතා කළද සියවස් දෙකකින් වත් බලය ලබාගැනීමට තමන්ට ඉඩ නැති බව ඔවුහු දනිති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැන් දෙකට බෙදී ඇත. එය බෙදනු ලැබුවේ, මහින්ද රාජපක්ෂ හා ඔහු වටා සිටි අනාථ කල්ලියය. යළි මැතිවරණයකින් බලයට ඒමට නොහැකි බව ඔවුහු දනිති. ඒ සඳහා යම් බලාපොරොත්තුවක් තිබුණේ නම් එයද බිඳ වැටිණි. පළාත් පාලන මැතිවරණය සඳහා ද්විපක්ෂ ක්‍රමයක් නිර්මාණය වන විකෘති ඡන්ද ක්‍රමයක් රාජපක්ෂ පාලන කාලය තුළ, බැසිල් රාජපක්ෂලා සකස් කොට තිබුණද පසුගිය අගෝස්තුවේදී පළාත් පාලන පනත සංශෝධනය කොට එම ද්විපක්ෂ මැතිවරණ ක්‍රමය වෙනස් කරනු ලැබීය. එසේම රාජපක්ෂවරුන්ට වාසිදායක ලෙස සකස් කර තිබූ කොට්ඨාස සීමා නිර්ණයද යළි වෙනස් කෙරිණි. එපමණක් නොව සමෘද්ධි නිලධාරීන් වැනි රාජ්‍ය නිලධාරීන් ඡන්දයට ඉදිරිපත් කොට පුංචි ඡන්දයේ වාසි ගැනීමට සිතා සිටියත් ක්ෂේත්‍ර නිලධාරීන්ට තමන් සේවය කරන සහා බලප්‍රදේශයේ ඡන්දය ඉල්ලීමට නොහැකි වන ලෙස නව ඡන්ද සංශෝධනයට වගන්තියක් එක්වීම නිසා එම වාසියද මහින්දට නැතිවිය.



ඉන්පසු මහින්ද කණ්ඩායම කල්පනා කළේ, පළාත් සභා තුනක ඡන්දය ආ විට, පළාත් පාලන ඡන්දයට පෙර පළාත් සභා ඡන්දය ඉදිරියට ගෙන, පළාත් පාලන ඡන්ද කල්දමා පළාත් සභාවක් දිනාගත හැකිදැයි උත්සාහ කිරීමටය. එහෙත් පළාත් සභා පනත සංශෝධනය වී මනාප ඡන්ද ක්‍රමය වෙනස් වීමත්, නව ඡන්ද ක්‍රමයට අනුව කොට්ඨාස නිර්ණය කිරීම සඳහා මාස කීපයකට පළාත් සභා කල්යාම හා පළාත් පාලන ඡන්දය පෙරට ඒමත් නිසා රාජපක්ෂවරුන්ගෙන් අවසන් බලාපොරොත්තුවද බිඳ වැටිණි. රාජපක්ෂ කල්ලියේ වියරුව උග්‍රවූයේ ඒ සමගය.

බලය පිළිබඳ සියලු බලාපොරොත්තු කඩවී පක්ෂය දෙකඩවී බංකොලොත්භාවයට පත්වීම නිසා වේදනාවට හා කෝපයට පත්ව සිටින රාජපක්ෂ කල්ලිය දැන් තෝරාගෙන තිබෙන්නේ, ජනතා විමුක්ති පෙරමුණට මඩ, අවලාද නඟමින් වියරු රංගනයක යෙදීමය. දැන් රාජපක්ෂ කල්ලියේ දේශපාලනයේ ව්‍යාජ සංයමය බිඳී, සැබෑ රකුසා මතුවී තිබේ. තවමත් සකස් කර නැති ව්‍යාවස්ථාවක් ගැන දොඩවමින් රට බෙදන්නට හදනවා යැයි භීතියක් වැපිරීමට රාජපක්ෂ කණ්ඩායමට සිදුව තිබෙන්නේ, මෙම බංකොලොත්කම නිසාය. වර්තමානයේ පවතින, ජේ.ආර්. ජයවර්ධන මහතා රට මත බලෙන් පැටවූ ව්‍යවස්ථාවේ ෆෙඩරල් ආසන්නයටම බෙදා තිබෙන බලය, තම වසර 9ක පාලන කාලය තුළ වෙනස් කිරීමට කිසිදු උත්සාහයක් නොකළ, තමන් සතුව තිබූ තුනෙන් දෙකේ බලය 13වැනි ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කිරීමට යොදා නොගෙන, තමන්ට තුන්වන වරටත් ජනාධිපති වීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා වෙනසකට (18 වන සංශෝධනය) වෙනුවෙන් යොදාගත් රාජපක්ෂ මහතා රට ෆෙඩරල් වීම ගැන කතාකිරීම සැබවින්ම විහිළුවකි.

මහින්ද රාජපක්ෂ 2005දී බලයට පත්වන විට උතුරු - නැගෙනහිර පළාත් තාවකාලිකව එක්කර තිබූ අතර, එම එක්කිරීම සඳහා වසරක් පාසා නිකුත් කරන ගැසට් පත්‍රයට රාජපක්ෂ මහතාද අත්සන් කළේය. අඩු කරමින් උතුරු පළාතෙන් නැගෙනහිර වෙන්කිරීම වැනි පියවරක්වත් ඔහු ගත්තේ නැත. එම පළාත් දෙක වෙන්කරනු ලැබුයේ, අධිකරණ නියෝගයක් මඟින් ජනතා විමුක්ති පෙරමුණ මැදිහත්වීමෙනි.

දැන් තම බංකොලොත්කමේ වියරුව ප්‍රදර්ශනය කරන රාජපක්ෂ මහතාගේ ගෝලයෝ 'නව ව්‍යවස්ථාව' සම්මත වුවහොත් පාර්ලිමේන්තුවට බෝම්බ ගැසීමටද, ව්‍යවස්ථාවට පක්ෂ වන මන්ත්‍රීවරුන්ට වෙඩි තැබීමටද ප්‍රසිද්ධියේ වහසිබස් දොඩවති. එම වහසිබස් හමුවේ ආණ්ඩුවද නිහඬය. මන්ද මෙම ව්‍යවස්ථා ගාලගෝට්ටිය ආණ්ඩුවටද වාසි නිසාය. ඒ, රටේ සැබෑ ප්‍රශ්න ඉන් යටපත් කළ හැකි නිසාය.

> රාජපක්ෂ කල්ලිය පාර්ලිමේන්තුවේ ඝෝෂාකර ඇත්තේ, තම කල්ලියේ වුවමනා එපාකම් සඳහාය. වරක් තමන්ට විපක්ෂ නායකකම ලබා ගැනීමට පාර්ලිමේන්තුවේ කලබල කළ ඔවුහු යළි තමන්ට එරෙහිව වංචා දූෂණ පිළිබඳ නීතිය ක්‍රියාත්මක වන විට එය වළක්වා ගැනීමට ඝෝෂා කළෝය. එසේ නැතිව ජනතාවගේ ප්‍රශ්නවලදී රාජපක්ෂවරු පාර්ලිමේන්තුවේ නිහඬය. සත්‍යය එයයි. එහෙත් එම රාජපක්ෂ කල්ලිය ආණ්ඩු විරෝධී යැයි සමහරු සිතති.

මෙලෙස ව්‍යවස්ථා පිදුරු ගසේ එල්ලී ජාතිවාදය පතුරුවමින් තම අවසන් පණ නල ගැටගසා ගැනීමට උත්සාහ කරන රාජපක්ෂ කල්ලිය, ජනතා විමුක්ති පෙරමුණ රට බෙදීමට උත්සාහ කරනවා යැයි අවලාද නඟමින් ඉන් නොනැවතී ජනතා විමුක්ති පෙරමුණ හා එක්සත් ජාතික පක්ෂය අතර සම්බන්ධතාවයක් පවතින්නේය යන අවලාදය පතුරුවමින් සිටී.

එහෙත් හොඳින් විමසා බැලුවහොත් හරයෙන් සැබෑ ලෙසම ආණ්ඩු විරෝධී ලෙස කටයුතු කරන්නේ, මහින්ද රාජපක්ෂද ජනතා විමුක්ති පෙරමුණද යන්න තේරුම් ගැනීම දුෂ්කර නැත. රනිල් වික්‍රමසිංහලා සමග සැබැවින්ම ඒකගතාවයෙන් කටයුතු කරන්නේ, රාජපක්ෂ මහතා බව තේරුම් ගැනීමද අපහසු නැත. එහෙත් පැහැදිලි සත්‍යය යට කොට රාජපක්ෂවරු මුසාවක් සමාජගත කරමින් සිටිති. ඒ, ජනතා විමුක්ති පෙරමුණ හා එක්සත් ජාතික පක්ෂය අතර පවත්වනවා යැයි කියන ඊනියා එකගතාවය ගැනය.

දැන් පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට සූදානම් වීමත් ඒ තුළ ජනතා විමුක්ති පෙරමුණට වාසිදායක තත්වයන් පෙනෙන්නට තිබීමත් නිසා මෙම මුසාව වැඩි වැඩියෙන් පතුරුවන්නට රාජපක්ෂ කල්ලියට සිදුව තිබෙන අතර එය තමන්ටද වාසි නිසා රනිල් වික්‍රමසිංහද එයට අනියමින් තහවුරු වන ලෙස කටයුතු කරමින් සිටී. එහෙත් සත්‍ය ලෙසම ආණ්ඩු විරෝධීන් කවුද යන්නත්, රනිල් සමග ඩීල් ඇත්තේ කාටද යන්නත් තෙරුම් ගැනීම සිදුවීම් දෙස හොඳින් බලනවිට අපහසු නැත.

මේ වන විට රට පුරාම ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ රැල්ලක් හා විරෝධතා රැල්ලක් පවතී. එහෙත් ඒ කිසිදු ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයක රාජපක්ෂ කණ්ඩායම දකින්නට නැත. ඔවුන්ගේ ඊනියා ආණ්ඩු විරෝධය පුදුම සහගත එකකි. සයිටම් හොර උපාධි කඩය වසා දමන ලෙස රට පුරා දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් පවතී. එය ආණ්ඩු විරෝධී විරෝධතා ව්‍යාපාරයකි. එහි ජනතා විමුක්ති පෙරමුණ විශාල වැඩකොටසක් කරන අතර ඒ තුළ රාජපක්ෂ කණ්ඩායම නැත. එසේම රට පුරා ආණ්ඩුවට එරෙහිව සිදුවන ගොවි උද්ඝෝෂණ රැල්ලේ නායකත්වය පවතින්නේ, ජනතා විමුක්ති පෙරමුණ අත මිස රාජපක්ෂ කණ්ඩායම අත නොවේ. උමාඔය විනාශයට එරෙහි ආණ්ඩු විරෝධී සටනේද රාජපක්ෂවරුන් නැත. එහි නායකත්වයේ සිටින්නේද ජනතා විමුක්ති පෙරමුණය. ආණ්ඩු විරෝධී කිසිදු සටනක නායකත්වයේ තබා දායකත්වයේවත් නැති රාජපක්ෂ කණ්ඩායම 'ආණ්ඩු විරෝධී' ලෙසත් ආණ්ඩු විරෝධී සටනේ සැබෑ ලෙසම නායකත්වයේ සිටින ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට පක්ෂ ලෙසත් විග්‍රහ වන්නේ කුමන තර්කයකට අනුව දැයි පැහැදිලි නැත.

පාර්ලිමේන්තුව තුළදීද එසේය. හැම විටම පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුවට එරෙහි තර්කානුකූල ප්‍රබල දේශපාලන විවේචනය සිදුකරන්නේ, ජනතා විමුක්ති පෙරමුණය. බැඳුම්කර වංචාවේදී, අධිවේගී මාර්ග ඉදිකිරීමේ වංචාවේදී, අයවැය විවාදවලදී ආණ්ඩුවට එරෙහි ප්‍රබල ප්‍රහාරය එල්ල වන්නේ ජනතා විමුක්ති පෙරමුණෙන් මිස රාජපක්ෂ කණ්ඩායමෙන් නොවේ. අයවැය ලේඛන දෙකටම විරුද්ධව ඡන්දය දීමටවත් රාජපක්ෂ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තු ආවේ නැත. අයවැයට එරෙහි

15 වැනි පිටුවට



"ජනතාව මෙම පාඩම ඉක්මනින් ග්‍රහණය කරතිද, නැතහොත්, ඔව්හු කොතරම් ඉක්මනින් එය ක්‍රියාත්මක කරතිද යන්න අපි නොදනිමු. නමුත් මෙම පාඩමට අමතරව, නොවිසඳියහැකි අවුලෙන් මිදීමේ වෙනත් මඟක් නොමැති බවත්, ප්‍රතිවිප්ලවවාදීන් දැක්විය හැකි චපලකම් හෝ මිලේච්ඡකම්වලින් හෝ කිසිම සෙතක් නොවන බවත්, අපි මැනවින් දන්නෙමු.
පොදු ජනතාව තමන්ගේ නායකයා වන නිර්ධන පංතිය කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම හැර වෙනත් ගැලවීමේ මඟක් නොමැත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**158 පිටුව**

# ජ.වි.පෙ. ගුරු සමුළුව අභිමානවත්ව

වෘත්තීය ඉල්ලීම්වලට පමණක් සීමා වී පැවති වෘත්තීය සමිති ව්‍යාපාරය ඉන් ඔබ්බට පොදුජන අරගල සඳහාද යොමු කරවන ලද්දේ ජ.වි.පෙ. විසිනි. ඒ අනුව යමින් ජ.වි.පෙ.ට අනුබද්ධ ලංකා ගුරුසේවා සංගමය ගුරුවරයා තම වෘත්තීය ගැටලුවලින් ඔබ්බට ගොස් ජාතික මට්ටමේ අරගල සඳහාද යොමු කරවන ලදී. රට තුළ ඇතිවූ සුනාමි, ගංවතුර ආදී ස්වාභාවික ආපදාවලදී මෙන්ම රටේ ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදුවට එරෙහිව කරන පොදුජන අරගලයන්හිදීත් ලංකා ගුරුසේවා සංගමය ප්‍රමුඛතාවය ගත් අතර මෑත කාලයේදී සයිටම් අහෝසි කරන ලෙස ආණ්ඩුවට බල කරමින් සිදු කරන උද්ඝෝෂණ ක්‍රියාවලිය සඳහාත් සක්‍රිය දායකත්වයක් ලංකා ගුරුසේවා සංගමය විසින් දරනු ලබයි.

එසේම ගුරුවරුන්ට සහන පදනම මත ණය ලබාදෙන අධ්‍යාපන සමුපකාර සමිතියේ බලය හිමි කරගෙන සිටින ගුරුසේවා සංගමය ඒ මගින් බහුතරයක් ගුරු ප්‍රජාවේ විශ්වාසය දිනාගනිමින් ගුරු සුභසාධන කටයුතු සඳහාද මැදිහත් වී සිටී. එවන් පසුබිමක් යටතේ ලංකා ගුරු සේවා සංගමය තම 19වැනි වාර්ෂික සමුළුව පසුගිය ඔක්තොම්බර් 13 වෙනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී මහත් අභිමානයෙන් පවත්වන ලදී. "එකම හඬක් එකම තැනක්" යන තේමාව යටතේ පැවති මෙම සමුළුවේ ප්‍රධාන දේශනය පවත්න ලද්දේ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසිනි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයා විසින්ද සමුළුව අමතන ලද අතර ඉදිරි වර්ෂය සඳහා නිලධාරි මණ්ඩලයක් මෙන්ම ඉදිරි ක්‍රියාමාර්ග සඳහා වන යෝජනාද මෙහිදී සම්මත කර ගැනුණි.



සංගමයේ ප්‍රධාන ලේකම් ලෙස මහින්ද ජයසිංහ, සභාපති ධම්මික අලහප්පෙරුම, භාණ්ඩාගාරික ප්‍රියන්ත ලියනගමගේ යන සහෝදරවරුන් තෝරා පත්කර ගැනුණු අතර දිවයිනේ නන් දෙසින් පැමිණි ගුරුවර, ගුරුවරියෝ විශාල සංඛ්‍යාවක් සමුළුවට සහභාගි වී සිටියහ.

# වෙනසකට වෙනස් වන ජනතාව වෙනුවෙන්




2015 වර්ෂයේ රාජපක්ෂ පාලනය බිඳදැමීමට රටේ ජනතාව පෙළගැසුණේ පෙනුමෙන් වෙනස් වුවත් ඒ ආකාරයේම තවත් ආණ්ඩුවක් සාදා ගැනීමට නොවේ. නමුත් රාජපක්ෂ වරුන්ගෙන් පසු බිහි වුණු යහපාලන ආණ්ඩුවෙන්ද ඔවුන් ජනතාවට කී ආකාරයේ සහ ජනතාව බලපොරොත්තු වූ ආකාරයේ වෙනසක් සිදු නොවන බව ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබේ.

රාජපක්ෂ පාලනය තුළ වංචා, දූෂණ සිදුකළවුන්ට දඩුවම් දීම පසෙක තබා යහපාලන ආණ්ඩුවේ නියෝජිතයින් එවැනි දූෂිත ආකාරයෙන් කටයුතු කරන බව මහ බැංකු බැඳුම්කර වංචාව වැනි සිද්ධි මගින් කදිමට තහවුරු වී තිබේ. එසේම ධනපති ආණ්ඩු විසින් මෙතෙක් කලක් අනුගමනය කරගෙන ආ වැරදි ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් රට විශාල ණය උගුලක සිර වී ඇති අතර ඔවුන්ට මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට විසඳුමක් ඇත්තේද නැත.

වසර 70කට අධික කාලයක් මෙම ධනපති දේශපාලන පක්ෂ විසින් සිදු කරන ලද පාලනයන්හි තාර්කික ප්‍රතිඵලය මෙම තත්වය බව පවසන ජ.වි.පෙ. රටට නව වෙනසක් ලබාදීම සඳහා පෙළගැසෙන ලෙස ජනතාවට ආරාධනා කරමින් සිටී. මේ සඳහා "ගමට දිරියක් - රටට බලයක්" යන තේමාව යටතේ ජ.වි.පෙ. විසින් දිරිය පුරවැසි දිසා සමුළු මාලාවක් පසු ගිය මාස කිහිපය තුල දිවයිනේ ප්‍රධාන දිස්ත්‍රික් ආවරණය කරමින් පැවැත්වනු ලැබීය.

ඒ අතුරින් පසුගිය ඔක්තොම්බර් 22වැනිදා හම්බන්තොට දිස්ත්‍රික් දිරිය පුරවැසි දිසා සමුළුව තංගල්ල බස් නැවතුම්පොළ භූමියේදී විශාල ජන සහභාගිත්වයකින් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මේ අවස්ථාව සඳහා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ජ.වි.පෙ. මධ්‍යම කාරකසභික නිහාල් ගලප්පත්ති සහෝදරයා, ජවිපෙ මධ්‍යම කමිටු සාමාජික පළාත් සභා මන්ත්‍රී සිසිර කුමාර වාහලතන්ත්‍රී සහෝදරයා ඇතුළුව ජ.වි.පෙ. ප්‍රාදේශීය නායක නායිකාවන් මෙන්ම රුහුණු විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ ප්‍රධානි මහාචාර්ය ධර්මා රාජපක්ෂ, ආර්ථික විද්‍යා අධ්‍යාපන අංශ ප්‍රධානි ආචාර්ය ශාන්ත සුමනරත්න, සිංහල අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විමලසිරි පුංචිහේවා, තංගල්ල බන්ධනාගාර රෝහලේ වෛද්‍ය අධිකාරි ප්‍රසන්න සෙල්ලහේවා, හම්බන්තොට දිසා රෝහලේ වෛද්‍ය රිසිනි දලුබුරගම, අගුණුකොලපැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නීතීඥ ජයන්ත රෝහණ, හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.වී. වීරසේන, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රධාන ගණකාධිකාරී එච්.කේ. සෝමසිරි යන මහත්ම මත්මියන් ඇතුළු ප්‍රදේශයේ උගතුන්, බුද්ධිමතුන් රැසක්ද මෙයට සහභාගි වූහ.

එසේම පසුගිය ඔක්තොම්බර් 23වැනිදා මාතලේදීද, ඔක්තොම්බර් 21 දා ගාල්ලේද දිරිය පුරවැසි සමුළු පැවැත්විණි.

# සියවස් සමරුව අභිමානවත්ව සමරා

ජාත්‍යන්තර කම්කරු දිනය මෙරටදී පීඩකයන් සහ පීඩිතයින් යන දෙකොට්ඨාසයම විසින් සමරනවා අප දැක ඇත්තෙමු. එ.ජා.ප.ය, ශ්‍රීල.නි.ප.ය මෙන්ම ඒවාට ඇලී ගැලී ජීවත්වන දේශපාලන පක්ෂද පීඩකයන් නියෝජනය කළද පීඩිතයින් රැවටීමට හෝ නොමැති නම් එම දිනය මඟහැර යෑමට ධෛර්යය නොමැති කම නිසාදෝ එය සමරන තැනට පත්ව තිබේ. මේ ආකාරයටම ඔක්තොම්බර් විප්ලවයේ සියවස සැමරීමටද රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුව මෙන්ම ඒම පක්ෂවලට මුක්කු ගසන දේශපාලන පක්ෂද කටයුතු කරමින් සිටී.

1917 වර්ෂයේ සිදුවූ ඔක්තෝබර් විප්ලවයෙන් වසර 40ක් පමණ යන විට ලෝකයේ බලවත්ම රාජ්‍යයක් බවට පත් වීමට සෝවියට් දේශයට හැකි වූ අතර 1937 පමණ වන විට රැකී රක්ෂා ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳා දැමීමට ඔවුනට හැකි විය. එහෙත් 1948 බටහිර අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලබා ගත්තා යැයි පවසන අප තවමත් තුන්වැනි ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් හැටියට හඳුන්වන අතර එතෙක් මෙතෙක් මෙරට පාලන කළ වූවන්ට අද දවසේද සිදුව ඇත්තේ රටේ සම්පත් විදේශිය බහු ජාතික සමාගම් විකුණා දමමින් දවස ගෙවාගැනීම පමණි.

එදා 1917 සමාජවාදි විප්ලවය සිදුවන විට රුසියාවේ පැවති සමාජ ආර්ථික අර්බුදයට නොදෙවෙනි අර්බුදයක් මේ මොහොත වන විට මෙරට තුළ පවතී. එනිසා මෙරට ජනතාව ඒ සමාජ ආර්ථික ගැටලුවලින් මුදවා ගැනීම සඳහා ඔක්තොම්බර් විප්ලවයේ පාඩම් වඩා වැදගත් වේ යැයි යන පදනමින් ඔක්තොම්බර් විප්ලවයේ සියවස් සැමරුම් උත්සවය පසුගිය ඔක්තොම්බර් 27 සහ 28 යන දිනයන්හි ජනතා විමුක්ති පෙරමුණේ මෙහෙයවීමෙන් කොළඹ විහාරමහා දේවි එළිමහන් රංග පීඨයේ අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.



තානාපතිවරුන්, රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයින් ඇතුළු විදෙස් නියෝජිතයින් මෙන්ම ජ.වි.පෙ. නායකයින්ගේ ප්‍රධානත්වයෙන් සමරු උත්සය විවෘත වූ අතර වීදි නාට්‍ය, සංස්කෘතික සංදර්ශන, චිත්‍ර ප්‍රදර්ශන, පොත් එළිදැක්වීම්, සාහිත්‍ය සංවාද ආදි අංග රැසකින් මෙම සැමරුම් උත්සවය විචිත්‍ර වී තිබුණි.

# උක් ගොවි සටනට නායකත්වය දෙමින්



ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ මෙහෙයවීමෙන් පසුගිය ඔක්තොම්බර් 06වැනිදා ජාතික වප් මඟුල් උත්සවයක් පවත්වන ලදී. "එක්ව නැගිටිමු - අටුකොටු පුරවමු" යනුවෙන් තේමා පාඨයක්ද මේ සඳහා ලබා දී තිබුණි. සැබැවින්ම රටේ සියලු ක්ෂේත්‍ර බිඳ වැටෙමින් ඇති තත්වයක් තුළ හුදෙකලාව ගොවිතැන පමණක් නඟා සිටුවන බව පෙන්වීමට ජනාධිපතිවරයා මේ කටයුතු කරමින් සිටිනුයේ ඉතිහාසයේ සිටි ජනාධිපතිවරුන් මෙන්ම ජනතාව ගොනාට ඇන්දීමට බව නම් ඉතා පැහැදිලිය.

රටේ සහල් ඒකාධිකාරිය ඇත්තේ පාලකයින් හෝ ඔවුන්ගේ ඥාතීන් අතය. එහෙත් වී සඳහා සහතික මිලක් ලබා ගැනීමට ගොවියෝ අරගලයක නිරතව සිටිති. රටේ කෘෂිකර්ම ඇමතිවරයා හිස් ගොඩනැගිල්ලකට මාස් පතා ලක්ෂ ගණන් වියදම් කරමින් පොහොර සහනාධාර කප්පාදු කරමින්, වගා වන්දි ගෙවීම මග හරිමින් සිටි. ඒ අනුව ජනතාවගේ කෙසේ වෙතත් පාලකයන්ගේ නම් අටු කොටු පිරී යන බව ඉතා පැහැදිලිය.

මෙවන් වට පිටාවක් තුළ ගොවි ජනතාවගේ අයිතිවාසිකම් ලබා ගැනීම වෙනුවෙන් අනවරත අරගලයක යෙදී සිටින සමස්ත ලංකා ගොවිජන සම්මේලනය සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාන ප්‍රදේශවල උක් ගොවීන්ගේ සහ එම කර්මාන්තශාලාවල සේවයේ නියුතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාමාර්ග රැසක් දියත් කරමින් සිටී. ජනාධිපතිවරයාටත් අගමැතිවරයාටත් තම ගැටලු ලිඛිතව ඉදිරිපත් කළද උද්ඝෝෂණ, පා ගමන් සහ පෙළපාලි ආදී ක්‍රියා මාර්ග රැසක් දියත් කළද උක් ගොවීන්ගේ ගැටලු පිළිබඳව පාලකයන්ගේ පාර්ශවයෙන් කිසිදු විසඳුමක් ලැබී නොමැති බව සමස්ත ලංකා ගොවිජන සම්මේලනය අවධාරණය කරයි.

එබැවින් පසුගිය ඔක්තොම්බර් 25වැනිදා සමස්ත ලංකා ඒකාබද්ධ උක් ගොවි මණ්ඩලය හා සමස්ත ලංකා ගොවිජන සම්මේලනය මැදිහත් වීමෙන් හිඟුරාන උක් ගොවියෝ තම ඉල්ලීම් ලැබෙන තෙක් අඛණ්ඩ සත්‍යග්‍රහයක් ආරම්භ කළහ. ගොවිජන සම්මේලනයේ ප්‍රධාන සංවිධායක නාමල් කරුණාරත්න, ජ.වි.පෙ. අම්පාර දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පියතිස්ස යන සහෝදරවරු මේ අවස්ථාවට සහභාගි වූහ.

# අයවැය කයිවාරු සහ ආර්ථික සෝදාපාළුව



"ප්‍රාග්ධනය වූකලී ජාත්‍යන්තර බලවේගයකි. එය පරාජය කිරීමට ජාත්‍යන්තර කම්කරු සන්ධානයක්, ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයක් අවශ්‍ය වන්නේය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**10වැනි වෙළුම,**
**86 පිටුව**

## අයවැයට පෙරවදනක්

මෙම නොවැම්බරය ආරම්භ වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, පළාත් පාලන ඡන්දය සහ අයවැය පිළිබඳ සංවාදය සමගය. එක් පැත්තකින් රට බෙදීමේ තර්ජනයකට සෝෂාවක් නගන බලය අහිමි වූ රාජපක්ෂ කල්ලිය ව්‍යවස්ථාව කරේ තියාගෙන දඟලයි. අනෙක් අතට ආණ්ඩුවට අකමැත්තෙන් වුව නැගී එන ජනතා බලපෑම හමුවේ කල් දමමින් කල් බැලූ මැතිවරණ පැවැත්වීමට සිදුව ඇත. ඒ සියලු අලකලංචි මැද්දේ ආණ්ඩුවට 2018 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සිදුව ඇත. ආණ්ඩුවට අයවැය ඉදිරිපත් කිරීමට සිදුව ඇත්තේ, කැඳයි රැවුලයි දෙකම බේරා ගන්නේ කොහොමදැයි සීරුමාරුවට කල්පනා කරමින්ය.

වැටී ඇති ආර්ථික අර්බුදය හමුවේ ඔළුව එසවීමට නම් ජනතාව මත බදු බර පැටවීම අනිවාර්ය කරුණකි. අනෙක් අතට ආණ්ඩුවට ආදායමම ඉලක්ක කරගත් අයවැයක් ගෙන ඒමට නොහැක්කේ, අයවැය සමගම ඉදිරියට එන නොවැළැක්විය හැකි මැතිවරණවලදී අයවැය මගින් යෙදෙන පීඩනය ඡන්දයට සෘජු ලෙසම බලපාන සාධකයක් වන බැවිනි.

බොහෝවිට ආණ්ඩුවේ සැලැස්ම විය හැක්කේ ඡන්දය වෙනුවෙන් ඉලක්ක කරගත් අයවැයක් ඉදිරිපත් කිරීමයි. අයවැය පිළිබඳව (විශේෂයෙන් අයවැය රහස් පිළිබඳව) දැන් සාමාන්‍ය ජනතාවගේ ඒ තරම් උනන්දුවක් නොමැත. එයටද ප්‍රධාන හේතුව ඒ තරමටම ජනතාව අයවැය මගින් වරින් වර රවටා තිබීමය.

## අයවැය සමාලෝචනය

පසුගිය අයවැය මගින් සිදුකළ යෝජනා සහ ඒ යෝජනා ක්‍රියාත්මක කිරීමට ඒ එක් එක් අමාත්‍යාංශ වෙත මුදල් වෙන් කළ විට එම යෝජනා සැබෑ ලෙසම ක්‍රියාවට නැගුණේදැයි සොයා බැලීමට යාන්ත්‍රණයක් පැවැතීම අත්‍යාවශ්‍යම සාධකයකි. නමුත් ලංකාවේ මේ වනතුරු එවැනි ව්‍යුහයක් ක්‍රියාවට නැගී නැත.

අයවැයක් යනු පුරෝකථනයකි. ඉදිරි වර්ෂයේ රජයේ වියදම කවර ප්‍රමාණයක් වනු ඇතිදැයි සිදුකරන අනුමානයන් අනුව වියදම වෙන් කිරීමත් එම වියදම පියවා ගන්නා ආදායම් මාර්ග පාර්ලිමේන්තුවට පෙන්වා දීමත් මෙම අනුමාන කිරීම මගින් සිදු කරයි. වඩා වැදගත් වන්නේ, එම අනුමාන කරන වියදම සහ ආදායම කොපමණ ප්‍රමාණයකින් ඉලක්ක ළඟා කර ගැනීමට රජයක් සමත් වී තිබේද යන්නයි. ළඟාකර ගත් ඉලක්ක, සහ අයවැය යෝජනා අතර විශාල පරතරයක් ඇති නම් එය යථාර්ථවාදී අයවැයක් නොව පාර්ලිමේන්තුව සහ රටේ ජනතාව නොමඟ යැවීමට සිදුකළ හුදු කයිවාරු



ගැසීමකි. 2017 අයවැය හොඳින් නිරීක්ෂණයේදී ඉතා පැහැදිලිව පෙනී යන කරුණක් වන්නේ "යහපාලනය" රනිල්-මෛත්‍රී හවුල 2017 වසරට ඉදිරිපත් කර ඇත්තේ කයිවාරු අයවැයක් බවයි.

## 2017 අයවැය යෝජනා හා යථාර්ථය

2017 අයවැය මගින් ඉදිරිපත් කළ 2017 වසර තුළ ක්‍රියාත්මක වූ යෝජනා කවරේදැයි විමසා බලන ඕනෑම අයෙකුට අයවැය කෙතරම් ඇස්බැන්දුම් ක්‍රියාවලියක්දැයි තේරුම් ගත හැකිය. ඒ නිසාම එක් එක් ක්ෂේත්‍රවල ක්‍රියාත්මක නොවූ යෝජනා පිළිබඳව විමසා බැලීමක් කරමු.

## කෘෂිකර්මය

1. දැනට භාවිතා නොකරන හිස් ඉඩම් කෘෂිකර්මාන්තයට නිදහස් කිරීම - **ක්‍රියාත්මක නොවීය**
2. වී මෝල් හිමියන්ට සහනදායී ණය ලබාදීම (මිලියන 400) - **ක්‍රියාත්මක නොවීය**
3. ගොවි සමුපකාර සඳහා 75%ක පොලී සහනාධාර සහිත ණය ලබාදීමට මිලියන 50ක් - **ක්‍රියාත්මක නොවීය**
4. වාණිජ මට්ටමේ එළවළු, පලතුරු වගාවට මාදුරුඔය දකුණු ඉවුර හා අනෙක් ප්‍රදේශවල රජයේ ඉඩම් අක්කර 20,000ක් ලබාදීම - **ක්‍රියාත්මක නොවීය**
5. කිලිනොච්චිය, මන්නාරම හා ඇඹිලිපිටිය ධාන්‍යාගාර ඉදිකිරීමට මිලියන 600ක් - **ක්‍රියාත්මක නොවීය**
6. තේ අපනයනකරුවන්ට ඩොලර්වලින් ණය ලබා ගැනීමට තේ මණ්ඩලය ඇපවීම - **ක්‍රියාත්මක නොවීය**
7. කසළ තේ අපනයනය නතර කිරීම - **සිදු නොවීය**
8. පොල් වගාවේ කෘමිහානි පැතිරුණු ප්‍රවේශ සවිස්තරාත්මකව සිතියම් ගත කිරීමට මිලියන 75 - **ක්‍රියාත්මක නොවීය**
9. කිරි නිෂ්පාදනය වැඩි කිරීමට උසස් තත්වයේ කිරි ගවයින් 15,000ක් ආනයනය - **ක්‍රියාත්මක නොවීය**

## අධ්‍යාපනය

1. ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල මූලික පහසුකම සහිත පන්ති කාමර, විද්‍යාගාර, පාසල් පුස්තකාල ඉදිකිරීමට රු:මිලියන 21,000ක් - **ක්‍රියාත්මක නොවීය**
2. පාසල් 1000ක ජලය, විදුලිය, සනීපාරක්ෂ පහසුකම් වැඩි දියුණු කිරීමට මිලියන 2000ක් - **ක්‍රියාත්මක නොවීය**
3. උසස් පෙළට 2017 දී ඇතුළත් වන ළමුන් සඳහා ටැබ් පරිගණක ලබාදීමට රු:මිලියන 5000ක් වෙන් කිරීම. මෙය ළමුන් 175000කට සහ ගුරුවරුන් 28000කට ලබාදීමට වෙන් කළද **ක්‍රියාත්මක නොවීය.**
4. 6වැනි වසරින් ඉහළ සිසුන් 1000කට සුවිශේෂී හැකියාවන් මත එක් සිසුවෙකුට මසකට රු:2500 බැගින් ප්‍රදානයට රු:මිලියන 30ක් වෙන් කිරීම - **ක්‍රියාත්මක නොවීය**

ඉහතින් දක්වන ලද්දේ කෘෂිකර්ම හා අධ්‍යාපන ක්ෂේත්‍රය අදාළ කරගෙන පමණක් පසුගිය අයවැය මඟින් ඉදිරිපත් කළ යෝජනා කිහිපයක් පමණි. මේ එකකුදු යෝජනාවක් හෝ ක්‍රියාවට නංවා නොමැත. නමුත් අයවැය ඉදිරිපත් කළ දිනවලදී පත්තරවල හා විද්‍යුත් මාධ්‍යවල ඇමතිවරුන් මහා ලොකුවට අඬහැර පෑවේ මෙම යෝජනා අයවැය මගින් ජනතාවට ලබාදුන් සහන ලෙස හුවා දක්වමිනි. එසේ හුවා දැක්වූවා පමණක් නොව එම යෝජනා පෙන්වමින් බඩුමිල ඉහළ දැමීමද, බදුබර පැටවීමද සාධාරණීය කරණය කරන ලදී.

## අමාත්‍යාංශ මට්ටමින් වෙන්කිරීම හා ඉටු කිරීම

එක් එක් අමාත්‍යාංශ මට්ටමින් 2017 වසර සඳහා වියදම් කිරීමට ඇස්තමේන්තු කර තිබූ මුළු ප්‍රමාණය බිලියන 2200කි. එය ණය වාරික හා පොලී ගෙවීම බිලියන 1626ට අමතරවය. එම අගයද එකතු කළ පසු රජයේ මුළු වියදම ඇස්තමේන්තු ගත කරන ලද්දේ රුපියල් බිලියන 3827ක් ලෙසිනි. මෙම වියදම්වලින් ණය ඉවත් කළ පසු, වියදමින් බිලියන 1266ක් පුනරාවර්තන වියදම් වූ අතර බිලියන 934ක් ප්‍රාග්ධන වියදම් විය. (එකතුව 2200කි) එයින් 2017 සැප්තැම්බර් 30 වන විට, පුනරාවර්තන වියදම්වලින් වියදම් කර තිබුණේ බිලියන 870ක් පමණි. ප්‍රාග්ධන වියදමින් වියදම් කර තිබුණේ රු. බිලියන 380ක් පමණි.

එක් එක් අමාත්‍යාංශ මට්ටමින් බලන විට ජනතාවට අත්‍යාවශ්‍යම සේවා සපයන අමාත්‍යාංශද ඒ අඩුවෙන් වියදම් කළ අමාත්‍යාංශ අතර විය. අයවැය මගින් වෙන්කළ මුදල් ඉතාම දුර්වල ලෙස වියදම් කළ අමාත්‍යාංශ කිහිපයක විස්තර සලකා බැලීමේන්ද මෙම "අයවැය විකාරය" තේරුම් ගත හැකිය.

| අමාත්‍යාංශය | 2017 අයවැය මගින් වෙන්කළ මුදල රුපියල් මිලියන | සත්‍ය ලෙස 2017 සැප්: 30 වන විට වියදම් කළ මුදල රුපියල් මිලියන | % |
|---|---|---|---|
| 01 බුද්ධ ශාසන අමාත්‍යාංශය | 3023 | 982 | 32. 47 |
| 02 මුදල් අමාත්‍යාංශය | 91660 | 32518 | 35 |
| 03 ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් | 51519 | 14994 | 29 |
| 04 ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා | 65500 | 32626 | 49 |
| 05 අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය | 55473 | 26127 | 47 |
| 06 අධ්‍යාපන අමාත්‍යාංශය | 112878 | 53052 47 | 47 |
| 07 ක්‍රීඩා අමාත්‍යාංශය | 6857 | 2631 | 38 |
| 08 උඩරට සංවර්ධන හා නව ගම්මාන | 4368 | 1005 | 23 |
| 09 වානිජ හා කර්මාන්ත | 15667 | 7613 | 48 |
| 10 ධීවර අමාත්‍යාංශය | 7977 | 3272 | 41 |
| 11 ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය | 9728 | 2177 | 22 |
| 12 ජාතික ඒක අමාත්‍යාංශය | 3532 | 325 | 9 |
| 13 රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 8990 | 1207 | 13 |
| 14 සංචාරක සංවර්ධන අමාත්‍යාංශය | 2849 | 417 | 14 |
| 15 නගර සංවර්ධන හා ජල අමාත්‍යාංශය | 28939 | 11570 | 39.9 |
| 16 වරාය හා නාවුක අමාත්‍යාංශය | 2400 | 356 | 14.8 |
| 17 විදුලි සංදේශ කටයුතු අමාත්‍යාංශය | 17623 | 1107 | 6.2 |
| 18 උපාය මාර්ගික සංවර්ධන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය | 2036 | 624 | 30 |
| 19 විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශය | 5762 | 2494 | 46 |
| 20 ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 3187 | 766 | 24 |

ඉහත වගුව අනුව පැහැදිලි වන්නේ, පාර්ලිමේන්තුව විසින් අයවැය මගින් මුදල් වෙන්කර දුන් අමාත්‍යාංශ 51කින් 21ක්ම (හරි අඩක්ම) අයවැය මගින් වෙන්කළ මුදල්වලින් 50%ක්වත් වියදම් නොකර තිබීමය. නමුත්, එම මුදල් රජයට ගෙවීම වෙනුවෙන් (අය කර දීම වෙනුවෙන්) පනවන ලද සියලු බදු මේ රටේ ජනතාව රජයට ගෙවා ඇත. එසේ නම්, එම මුදල්වලට

15 වැනි පිටුවට

# ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ සියව

## 2017 ඔක්තෝබර් 27-28 විහ




මානව ඉතිහාසය බොහෝ විප්ලවයන් අත්දැක ඇත. එහෙත් සිය ගමන්මගෙහි තීරණාත්මක වෙනසක් සනිටුහන් කළ පළමු විප්ලවය ලෙස ඉතිහාසය විසින් හඳුනා ගනු ලැබුවේ 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයය. එක් පංතියක් විසින් තවත් පංතියක් සූරාකනු ලැබීම අහෝසි කරන ලද භූමියක් ප්‍රථම වරට මිහිපිට බිහි වූයේ එම ශ්‍රේෂ්ඨ විප්ලවය නිසාය; සියවස් ගණනාවක් මිනිසුන්ගේ දහදිය සූරාකනු ලැබ ගොඩනඟා තිබූ අධිරාජ්‍යවාදී රාජ්‍යයන්ට අභියෝගයක් වන දැවැන්ත රටකට පදනම වැටුණේ එම ශ්‍රේෂ්ඨ විප්ලවය නිසාය; විද්‍යාවේ තාක්ෂණයේ ජයග්‍රහණයන් මානව ප්‍රජාවේ උන්නතිය වෙනුවෙන් යෙදවිය හැකි බවට වූ පරමාදර්ශය ගොඩනැගුණේ එම ශ්‍රේෂ්ඨ විප්ලවය නිසාය... මේ කෙටි ලියවිල්ල තවත් දිගු විය යුතු නැත. එම ශ්‍රේෂ්ඨ විප්ලවය නිසා ලෝක ඉතිහාසයේ සිදුවූ වෙනස්කම්, මානව සංහතියට සිදුවූ මෙහෙවර වෙළුම් ගණාවක කෘතියකින් වුවද ලියා හමාර කළ නොහැකි තරම්ය.

ඉදින් මානව ඉතිහාසයේ එතරම් අසිරිමත් මොහොතක් කෙසේ අමතක කරමුද? ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුම වෙනුවෙන් දෙදිනක් පුරා දිගහැරෙන වැඩසටහනක් සංවිධානය කරන ලද්දේ ඒ හේතුවෙනි. පසුගිය ඔක්තෝබර් 27/28 දෙදින පුරා කොළඹ විහාරමහාදේවි උද්‍යාන පරිශ්‍රයේදී දිගහැරුණේ එහි විවිධ පියවරයන්ය.

### විවෘත කිරීම

ඔක්තෝබර් 27වැනි දින පෙරවරු 10.00ට සමරුවේ සමාරම්භක අවස්ථාවේ සාක්ෂිකරුවන් වීම සඳහා දෙස් විදෙස් නියෝජිතයෝ රැසක් එහි පැමිණ සිටියහ. ඒ පිරිස අතරට කියුබානු තානාපතිනිය, වියට්නාම් තානාපතිනිය, චීන තානාපති කාර්යාලයේ දේශපාලන අංශ ප්‍රධානියා මෙන්ම එම ස්ථානයට පැමිණ හදිසි කටයුත්තක් හේතුවෙන් බැහැර යාමට සිදුවූ පලස්තීන තානාපති කාර්යාලයේ උප ප්‍රධානියාද අයත් වූහ.

එසේම විදේශීය නියෝජිතයින්ද ජ.වි.පෙ. ආරාධනය පිළිගෙන එම ඓතිහාසික සමරු වැඩසටහනට පැමිණ සිටියේ ඊට සහභාගි වීම සිය ජාත්‍යන්තරවාදී යුතුකමක් ලෙස තේරුම් ගනිමිනි. රුසියානු කම්කරු සමාජවාදී පක්ෂයේ මධ්‍යම කාරක සභික හා මොස්කව් සෝවියට් සභාවේ සභාපතිනි රුෂේනා පුගචොවා සහ සෝවියට් ලේඛිකා ඉරීනා මලෙන්කෝ යන සහෝදරියෝද බංගලාදේශ සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් කාලි කුසේමාන් සහ එම පක්ෂයේ මධ්‍යම කාරක සභික මොහොමඩ් පිරෝස් යන සහෝදරවරුද ඒ පිරිස අතර වූහ.

මෙම මොහොතට සහභාගි වීම භාග්‍යයක් බවට සලකමින් ආරාධිත අමුත්තන් ලෙස ඊට එක්වූ විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයෝ රැසක්ද එහි පැමිණ සිටියහ. ඔවුන් අතරට ගුණසේන විතාන, ජයතිලක ද සිල්වා, අනුරුද්ධ ජයසිංහ, ඇන්තනි ජීවා, ප්‍රසන්නජිත් අබේසූරිය යන කලාකරුවෝද අශෝක පීරිස්, ඒ.පී.ඒ. ගුණසේකර ඇතුළු හිටපු අමාත්‍යාංශ ලේකම්වරු කිහිපදෙනෙක්ද වෛද්‍ය නිහාල් අබේසිංහ වැනි විද්වත් වෘත්තිකයෝ රැසක්ද අයත් වූහ.

### ප්‍රදර්ශන කුටි

මහත් තොරතුරු සම්භාරයක් කැටි කරගත් ප්‍රදර්ශන දැවැන්ත ප්‍රදර්ශන කුටි පහකින් ඔක්තෝබර් විප්ලවයේ ශ්‍රේෂ්ඨත්වය විදහාපෑමට ගෙන තිබුණේ නොමද උත්සාහයකි. 'විප්ලවයට පෙර රුසියාව සහ පූර්ව විප්ලවීය අවස්ථා', 'ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණ', 'දෙවැනි ලෝක යුද්ධය සහ සමාජවාදී සෝවියට් දේශය', 'ලෝක ජනතාව උදෙසා සෝවියට් දේශයේ දායකත්වය', 'සමාජවාදය: නිතර අසන ප්‍රශ්න හා පිළිතුරු එම කුටිවල තේමාවන් විය. දෙදින පුරා පැවැත්වුණු මෙම ප්‍රදර්ශනය තුන්දහසකට වැඩි පිරිසක් විසින් නරඹනු ලැබ තිබිණි.

# ...වස් සමරුවේ මතක සටහන්...

## ...රමහදේවී උද්‍යාන පරිශ්‍රය




### කෘති එළිදැක්වීම්

සමරුවේ සුවිශේෂී අංගයක් වූයේ එය නිමිති කරගනිමින් කෘති ත්‍රිත්වයක් දොරට වැඩීමයි. 'ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය නැවත කියවීමක්' යනුවෙන් විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගේ ලිපි එකතුවක්ද ඉරීනා මලෙන්කෝ ලේඛිකාවගේ 'සෝවියටිකා' කෘතියේ 'සෝවියට් දිවියක මතක සුවඳ' නමින් වන සිංහල පරිවර්තනයේ දෙවැනි කොටසද 'සෝවියට් දේශයේ බිඳවැටීම' කෘතියේ දමිළ පරිවර්තනයද ඒ අතර විය. එම අවස්ථාව සඳහා ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, සෝවියටිකා කෘතියේ කර්තෘ සෝවියට් ලේඛිකා ඉරීනා මලෙන්කෝ, එම කෘතිය සිංහලයට පෙරළූ ප්‍රසන්න පෙරේරා, ප්‍රවීණ ලේඛක ගුණසේන විතාන, ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි, ප්‍රවීණ නාට්‍යවේදී ඇන්තනි ජීවා ඇතුළු දෙස් විදෙස් ආරාධිත පිරිසක් එම අවස්ථාවට එක්ව සිටියහ. එම කෘති ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් ප්‍රවීණ ලේඛක ගුණසේන විතාන සහෝදරයාටද ප්‍රවීණ කලාකරු ඇන්තනි ජීවා සහෝදරයාටද පරිවර්තක ප්‍රසන්න පෙරේරා සහෝදරයා විසින් කර්තෘ ඉරීනා මලෙන්කෝ සහෝදරියටද පිළිගන්වන ලදී.

ඉන් අනතුරුව ඇරඹි සංවාදයේදී ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි සෝවියට් සාහිත්‍යය ලෝකයට කළ බලපෑම පිළිබඳ සාරවත් දෙසුමක් පවත්වන ලද අතර ටිල්වින් සිල්වා සහෝදරයා විසින් ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණ සහ අත්දැකීම් පිළිබඳ කෙටි දෙසුමක් ඉදිරි කරන ලදී. ඉරීනා මලෙන්කෝ සහෝදරිය සිය ජීවන අත්දැකීම් ඊට එකතු කළාය. අනතුරුව විකල්ප සංස්කෘතික සන්ධ්‍යාවෙන් එදින වැඩකටයුතු හමාර විය.

28වැනි දිනද ප්‍රදර්ශනය ඇරඹුණු අතර පෙරවරු 10.00ට 'ඔක්තෝබරයේ සිතුවම' නමින් ප්‍රවීණ චිත්‍ර ශිල්පීන් විසින් ඔක්තෝබර් විප්ලවය තම තමන්ට දැනෙන ආකාරය කැන්වස් තිර මත සිතුවමට නැගීම නිර්මාණය කළේ මහත් සුන්දර වූ අත්දැකීමකි. ළමා සිත්තරුන්ද මෙම අවස්ථාවට එක්වූ අතර ඔවුනට සහතික පත් ප්‍රදානය කෙරිණි.

### සමරු රැස්වීම

එළිමහන් රංග පීඨයේදී ප්‍රධාන සමරු රැස්වීම ඇරඹුණේ පස්වරු 4.30ට පමණය. ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, ජාතික සංවිධායක බිමල් රත්නායක, ජාතික සංවිධායිකා සමන්මලී ගුණසිංහ, මධ්‍යම කාරක සභික රාමලිංගම් චන්ද්‍රසේකර් යන සහෝදර සහෝදරියෝද රුෂේනා පුගචොවා, ඉරීනා මලෙන්කෝ, කාලි කුසේමාන් යන ආරාධිත විදෙස් නියෝජිත සහෝදර සහෝදරයෝද ඇතුළු විශාල පිරිසක් ඊට එක් වී සිටියහ. රුසියානු සාහිත්‍යය ලාංකේය පාඨකයින්ට සමීප කරවූ ප්‍රවීණ පරිවර්තකයින් දසදෙනෙකු වෙනුවෙන් 'ඔක්තෝබර් විප්ලව සමරු සම්මාන' පිරිනැමීමද මෙම අවස්ථාවේ සුවිශේෂී අංගයක් විය. සමරු දේශනවලට අමතරව විදෙස් නියෝජිතයින්ගේ සුභපැතුම්ද සමරු රැස්වීමට එක්කරනු ලැබිණි.

අවසන් අංගය වූයේ, සංගීතමය ප්‍රසංග වේදිකාවය. මිත්‍ර කපුගේ, එස්. කලාවතී, රොහාන් ශාන්ත බුලේගොඩ, බණ්ඩාර අතාවුද, රන්දිල් ද සිල්වා ඇතුළු ගායක ගායිකාවන්ද විමුක්ති ගී කණ්ඩායමද විසින් ඉදිරිපත් කරන ලද ගී ප්‍රසංගයකින් එය සංගීතවත් විය.

දෙදින තුළම පස්වරුවේ දිගහැරුණේ ඉමහත් මහජන ප්‍රසාදයක් දිනා ගත් වීදි නාට්‍ය සංදර්ශනයන් දෙකකි. අද අප අතර නැති ගාමිණී හත්තොටුවේගමයන් ඇරඹූ 'වීදියේ වේදිකාව' මීළඟ පරම්පරාව විසින් ඉදිරියට ගෙනයාමක් විය. දෙදින පුරාම විවිධ ප්‍රකාශකයින්ගේ සහභාගිත්වයෙන් පොත් ප්‍රදර්ශනයක්ද පැවැත්විණි.

# වත්මන් රුසියාව ගැන සෝවියට් සමාජවාදීනියකගේ හඬ...



ලෝක ඉතිහාසයේ ගමන්මග මහා වෙනසකට ලක් කරනු ලැබූ කාල පරිච්ඡේදයන් අපට වරින් වර හමුවේ. ලෝකයේ සිදු වූ විප්ලවයන් කොතරම් ප්‍රමාණයක් ඇතත් 1917 ඔක්තෝබරයේ සිදු වූ රුසියානු විප්ලවය යනු ලෝක ඉතිහාසයේ ගමන්මග සුවිශාල පරිවර්තනයකට ලක් කළ විප්ලවයකි. ඒ, එරට වැඩවසම්, ධනවාදී පාලනයන්ගෙන් පීඩාවට පත් කම්කරු ගොවි බලවේග එක්ව රුසියානු විප්ලවය ජයග්‍රහණය දක්වා ගෙන ගිය නිසාය; ලෝක ඉතිහාසයේ පළමු වරට එරට නිර්ධන පංතිය රටක පාලන බලය අත්පත් කරගත් නිසාය. ඒ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය අධිරාජ්‍යවාදී කඳවුරේ බලපෑම් හා නිර්ධන පංති පාලනාධිකාරියේ සිදු වූ විවිධ අඩුපාඩු හා අත්වැරදීම් හේතුවෙන් අද දවසේ බිඳ වැටී (බිඳ දමනු ලැබ) තිබුණද ඔක්තෝබර් විප්ලවය විසින් අපට කියා දුන් පාඩම් අදටද වලංගු වේ. ඔක්තෝබර් විප්ලවයට වසර සියයක් පිරීම නිමිත්තෙන් අප පක්ෂය විසින් සංවිධානය කළ සමරුවට රුසියානු කොමියුනිස්ට් කම්කරු පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජිකා, මොස්කව් සෝවියට් සභාවේ සභාපතිනි, රොෂේනා පුගචෝවා සහෝදරිය සහභාගි විය. ඇය සමග සාකච්ඡා කිරීමට අපටද අවස්ථාවක් ලැබුණු අතර පහත දැක්වෙනුයේ සෝවියට් පාලන යුගය හා වර්තමාන රුසියාවේ තත්වය පිළිබඳ ඇය අප හා දැක්වූ අදහස්වල ලිඛිත සටහනය.

ඔක්තෝබර් විප්ලවයේ සියවෙනි සමරුව රුසියානු රජය විසින් වගේම අප පක්ෂය විසිනුත් සමරනු ලැබුවා. රුසියානු රජය විසින් රුසියන් විප්ලවය පිළිබඳව නිර්මාණය කරන ලද සිනමාපට නොමිලයේ පෙන්වනු ලැබුවත් ඒවා පෙන්වූයේ රාත්‍රී කාලයේයි. ඒ නිසා බොහෝ දෙනෙකුට ඒවා නැරඹීමේ අවස්ථාව අහිමි වුණා. රුසියන් විප්ලවයේ ඉතිහාසය, එහි වැදගත්කම විදහා දැක්වෙන ප්‍රදර්ශන වෙනදා නොමිලේ බැලීමට අවස්ථාව දී තිබුණද මෙවර පුටින් පාලනය එම ප්‍රදර්ශන නැරඹීමට මුදල් අය කරනු ලැබුවා.

රුසියාවේ එක්තරා නගරයක විප්ලවයේදී සොල්දාදුවන් ලෙස සේවය කළ අයගේ පින්තූර රැගෙන එම පවුල්වල ඥාතීන් පාගමනක් හා සමරුවක් තනිවම සංවිධානය කර තිබීම විශේෂ සිදුවීමක් වුණා. රුසියන් අගමැති පුටින්ගේ පියාත් විප්ලවයේදී සේවය කළ සොල්දාදුවෙක් නිසා එය වැළැක්වීමට කටයුතු කිරීමට ඔහුට පවා නොහැකි වුණා.

විප්ලවය සමරන අවසන් දිනයේ රුසියාවේ පමණක් නොව විවිධ රටවලින් පැමිණි සමාජවාදයට ආදරය කරන මිලියනක පමණ ජනතාවක් සමරු පාගමනට සහභාගි වුණා. අදටත් ශ්‍රේෂ්ඨ රුසියන් විප්ලවයට නායකත්වය දුන් ලෙනින් සහෝදරයාගේ දේහයට ජනතාව මල් තබමින් ගෞරව දක්වනවා.

සෝවියට් ආණ්ඩුව පැවති කාලයේ ලිංගිකත්වය මත වැටුප් අසමානතා නැති කිරීමට කටයුතු කර තිබුණා. එදා රුසියන් කාන්තාවන්ට පිරිමින්ට හා සමානව රැකියා ලබා ගැනීමේ අවස්ථාවන් හිමි වුණා. ඒත් දැන් කාන්තාවන්ට වැටුප් ලැබෙන්නේ පිරිමින්ට වඩා 25%ක් අඩුවෙන්. ඒ වගේම එදා පවුලකට දෙවෙනි ළමයා ලැබුණු පසුව රූබල් 30,000ක් ලබා දුන්නා. එයින් නිවසක් අරගෙන හොඳට ජීවත් විය හැකිව තිබුණා. එම දීමනාව අද වන විට විශාල වශයෙන් කප්පාදු කර ඇති නිසා එයින් කිසිවක් කර ගත නොහැකි තත්වයක් උදාවෙලා තිබෙනවා. එම නිසා ළමුන් හැදීම පවා අඩුවෙලා තියෙනවා.

සෝවියට් පාලනය තුළ බිළිඳුන්ට ලබා දීමට මව් කිරි නැති වූ විට කිරි වගේම සෑම කෙනෙකුටම පෝෂණ අතිරේකයක් නොමිලේ ලබා දුන්නා. දැන් ඒවා හැමෝටම ලැබෙන්නේ නැහැ. ළමුන්ට, වැඩිහිටියන්ට අවශ්‍ය කරන බෙහෙත් නොමිලේ ලබා දුන්නත් අද වනවිට ඒවාද කප්පාදු කර තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවිකාවන් එදා නිවසට පැමිණ බිළිඳුන් පිළිබඳව සොයා බැලුවද අද බිළිඳුන් රැගෙන සායනයට යාමට සිදුව තිබෙනවා.

මව්වරුන්ට දරුවා බිහි කිරීමට මාසයකට පෙර හා දරුවා බිහි කළ පසු මාස දෙකක් නිවාඩු ලැබුණා. දරුවාට අවුරුදු තුන වන තෙක් රැකියා ස්ථානයේ සිට පැමිණ මව්කිරි ලබා දී යාමට අවස්ථාව ලබා දී තිබුණා. අද ඒ අවස්ථා අහිමිව තිබෙනවා. තවද රජයෙන් පවත්වාගෙන ගිය දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැසී ගොස් ඇති නිසා පුද්ගලිකව පවත්වාගෙන යන මධ්‍යස්ථානවලින් විශාල මුදලක් අය කරනු ලබනවා.

අපි රුසියානු කොමියුනිස්ට් කම්කරු පක්ෂය ලෙස කාන්තාවන්ගේ හා ළමුන්ගේ වගේම පොදු කම්කරු ජනතාවගේ අයිතීන් දිනා ගැනීම සඳහා අරගල කරමින් සිටිනවා. පසුගිය අවුරුදු 7 තුළ වැටුප් වැඩිවීම් කරගනු ලැබුවේ එවැනි අරගල හරහායි. පක්ෂය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. හැමෝටම වඩා හොඳින් ජීවත්වීමේ අවස්ථාව ලැබෙන සමාජවාදී සමාජයක් නැවත ඇති කිරීම අප පක්ෂයේ බලාපොරොත්තුවයි.

# නවන නැවෙන නීතිය

අපේ රටේ ජීවත්වන බහුතරයක් කාන්තාවෝ දිනපතා ආර්ථිකමය, සමාජීයීය, සංස්කෘතිකමය ගැටලු රාශියකට මුහුණ පාමින් පීඩාවට පත්ව සිටිති. එසේ පීඩාවට පත්ව සිටින්නන්ගෙන් යම් අයෙකු අතින් සුළු වැරද්දක් සිදුවූ විට පවා, ඊට හේතු සාධක නොවිමසා කෙලින්ම අධිකරණ ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වන, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විශාල පරිමාණයේ වංචා දූෂණයන්ට හවුල්වන අය සම්බන්ධයෙන් එසේ ක්‍රියා නොකිරීම ඛේදජනකය.

මෑත කාලයේ ආහාරය සඳහා අඹ ගෙඩි තුනක් අසල වත්තකින් කඩා ගත් කාන්තාවකට නීතිය ක්‍රියාත්මක වූ ආකාරයෙනුත්, පාසල් ගාස්තු ගෙවීම සඳහා අසල වත්තකින් පොල් ගෙඩි අටක් අහුලාගත් පාසල් දැරියකට නීතිය ක්‍රියාත්මක වූ ආකාරයෙනුත් මෙය අපට මැනවින් වටහා ගත හැකිය.

රටක නීති අණ පනත් සම්මත කරගෙන ඇත්තේ කුමන හෝ පුරවැසියෙක් නීතියට පටහැණි යම් දෙයක් කළහොත් තරාතිරම නොබලා දඬුවම් ලබාදීමටය. නීතිය කාටත් සමාන විය යුතුය. එය බලය හා මුදල් මත වෙනස් වන දෙයක් නොවිය යුතුය. ලේඛනවල එසේ සඳහන් වුවත් නීතිය ක්‍රියාත්මක වීමේදී තරාතිරම අනුව එක් එක් පුද්ගලයන්ට එය වෙනස් වන බව පසුගිය කාලයේ මෙන්ම මෑත කාලයේ වූ සිදුවීම්වලින්ද පෙන්නුම් කරයි.

රාජපක්ෂලා බලයේ සිටියදී ජනතාවගේ මුදල් විවිධ ආකාරයට මංකොල්ල කෑ අයුරුත්, විවිධාකාරයෙන් දේපළ අත්පත් කරගත් ආකාරයත් සුදු වෑන්වලින් පැහැරගෙන ගොස් විවිධ අය ඝාතනයන්ට ලක් කළ ආකාරයත් මෙරට ජනතාවට නොරහසකි. එසේ රාජපක්ෂ පවුලේ උදව්ය ඇතුළු විවිධ දූෂණ චෝදනාවන් එල්ල වූ ඇතැම්



පුද්ගලයන් සම්බන්ධයෙන් කෙතරම් සාක්ෂි තිබුණත් නීතිය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් ඇත්තේ ගැටලු සහගත බවකි. පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂද එලෙස ඝාතන හා දූෂණ චෝදනා එල්ල වූ පුද්ගලයන් අතරින් කෙනෙකි. ඔහුට අයත් 'හෙලෝකෝප්' නම් සමාග මක සිදුවූ මුදල් විශුද්ධිකරණ චෝදනාවකට එම සමාගමේ සේවය කළ ලේකම්වරියක් ජාත්‍යන්තර පොලීසියේ උදව් ඇතුව පසුගිය දිනෙක අත්අඩංගුවට ගැනුණි. එසේ අත්අඩංගුවට ගත් නාමල්ගේ ලේකම්වරිය පැය 24ක් යාමටත් පෙර නිදහස් කෙරුණි. කෑම සඳහා අඹ ගෙඩි කැඩූ කාන්තාවට දවසක්ම පොලීසියේ ගත කිරීමට සිදුවූ අතර පසුදින ඇය උසාවියටද ඉදිරිපත් කරනු ලැබ දඩ මුදලක්ද නියම කෙරුණි.

එසේම සිරිලිය ගිණුමේ ඇති වංචාවක් පිළිබඳ හිටපු ජනාධිපති බිරිඳ ශිරන්ති රාජපක්ෂට එරෙහිව තවමත් නීතිය ක්‍රියාත්මක වී නැත. මහා පරිමාණයේ හොරකමක් වූ මහ බැංකු බැදුම්කර වංචාවට හසු වූ පුද්ගලයන්ගෙන් මුදල් ලබා ගනිමින් සුඛෝපභෝගී නිවසක් ගත් බවට ඇමති රවි කරුණානායකට චෝදනා එල්ලවුණි. ඒ චෝදනාවට සාක්ෂි ලබාදුන්නේ අනීකා විජේසූරිය නැමැත්තියකි. චෝදනාව ඔප්පුවීම තුළ ඔහුට මුදල් ඇමතිකමද අහිමි වූ අතර රවිට එරෙහිව සාක්ෂි දුන් අනීකා විජේසූරියට ජීවිත තර්ජන නිසා රටින් පිටව යාමට සිදුවිය.


මෙයින් පැහැදිලි වන්නේ කුමක්ද? දූෂණයට එරෙහිව කටයුතු කරන්නන්ට තරාතිරම කුමක් වුවද සිදුවන්නේ එකම දෙයක් බව නොවේද? ආර්ථික හැකියාවන් ඇති අය රටින් පිටව ගොස් හෝ තම ජීවිත රැකගත්තද එසේ නොහැකිවුන්ට නීතිය පැත්තෙන් පවා පිළිසරණක් නොමැතිවීම කනගාටුදායක කරුණකි.

තවද ආර්ථික අගහිඟකම් හේතුවෙන් කරනු ලබන සුළු සුළු හොරකම්වලට පවා නීතිය අකුරට ක්‍රියාත්මක වුවද මහා පරිමාණයේ දූෂණ වංචාවන්ට හවුල් පුද්ගලයන් සම්බන්ධයෙන් සාක්ෂි එළිපිට තිබියදීත් ඔවුහු තවමත් නිදැල්ලේ සිටිති. ඇතැම් විටෙක ජනතාවගෙන් එල්ලවන විරෝධය හේතුවෙන් ඇතැම් පුද්ගලයන් අත්අඩංගුවට ගත්තද ඔවුන් තබන්නේ බන්ධනාගාර රෝහලේය. අත්අඩංගුවට ගන්නා විට ඔවුන්ට නැති ලෙඩ හැදේ. ඇතැම් අයට රෝද පුටු නොමැතිව ඇවිද යාමට පවා නොහැකිය. එහෙත් දවසකින් දෙකකින් ඇප ලබා නිදහස්වන විට ඔවුහු අත් වනමින් මහා වීරයින් සේ එළියට එති.

මෙය ජනතාවට විහිළු සැපයීමක් නොවේද? ධනපති ක්‍රමය තුළ නීතිය ක්‍රියාත්මක වන්නේ එසේය. ජනතාවගේ මුදල් හොරා කන්නන්ට නිදැල්ලේ සිටීමට නීතිය විසින් ඉඩ හැර ඇත. තව තවත් හොරකම් කිරීමට ඉඩ කඩ විවර කර ඇත. නීතියේ රැකවරණය හිමිව ඇත්තේ කාටද යන්න මෙයින් පැහැදිලි නොවන්නේද?


## නොදුටු මුත්තණුවන්ට මිණිපිරියකගෙන්

බිත්ති මත හිනැහෙන
අපේ කුරුටු බලි මිස
වෙනත් කිසිවක් නැති
අපේ ගෙයි බිත්තියක
නොසෙල් වී හිඳින රුව ඔබ...
ඉර බහින හවසටත්
තාත්තා ගෙදර නැති කොට,
උපැස් යුවලට යටින් දිලි
තියුණු ඇස් දෙක යොමා
අපේ දුක් කම්කටොළු
සියල්ලම දුටුව රුව...
මේ වගේ ඉල් මහක
අඳුරු වැසි බර රෑක
පණ පිටින් පුළුස්සා මරා දැමුණු
වග අම්මා හැමදාම මට කියනවා
ඒ ගින්නේ උණුසුම
මගේ හිතටත් තදින් දැනෙනවා
හිස් වැස්මෙ ඇති
රතු තරුව දකින විට
තාත්තා ගෙදර නැති
කාංසිය සිඳෙනවා...
ඔබ ගමන් ගත්ත මග
ඉතිරි අඩ නිමා කර
හොඳම දේ අපිට හිමි කරන්නට
තාත්තා යා යුතුයි, දැනෙනවා
තාම අවුරුදු හතයි
ඒ වුණත් මගෙ ලේත්
රතුම රතු පාට බව හැඟෙනවා...



# නීතිය: පංතිමය උපකරණයක් ලෙස...

මේ දිනවල ලංකාවේ 'නීතිය' හැසිරෙන ආකාරය පිළිබඳව විවිධ කථාබහ මතුව තිබේ. මිලියන 30ක මූල්‍ය වංචාවක් සිදුකොට රටින් පිටව ගොස් අධිකරණය මඟහැර සිටි, රතු වරෙන්තු නිකුත් කොට අවසානයේ අත්අඩංගුවට ගත් කාන්තාව අධිකරණයට ඉදිරිපත් කළ විට ඇය ඇප මත නිදහස් කළ බවට ප්‍රවෘත්ති පළ විය. එම දිනවලම කුසගින්නට කෑමක් හදාගැනීමට අඹගෙඩි තුනක් කැඩූ කාන්තාවක් පැය 24ක් පුරා පොලීසියේ රඳවා සිට ඇප මත මුදාහළ ප්‍රවෘත්තියක්ද වාර්තා විය. මෙම සිදුවීම් දෙකේ දෙදෙනාම කාන්තාවන් වුවත් එක් අයෙක්ගේ වරද විශාල වන අතර අනෙක් කාන්තාවගේ 'වරද' කුඩා වුවත් ඔවුන් දෙදෙනා අයත්ව තිබුණේ සමාජ පංති දෙකකටය. රුපියල් මිලියන 30ක වංචාව කළ කාන්තාව මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ පුත් නාමල් රාජපක්ෂගේ ලේකම්වරියක්ව සිටි අයෙකි. අනෙක් කාන්තාව ඉතාම දිළිඳු වයස්ගත කාන්තාවකි. මෙම අවස්ථාවේ නීතිය ක්‍රියාත්මක වීමේදී බරපතළ වෙනසක් සිදුව තිබෙන බව පැහැදිලිය. එම වෙනසට හේතුව කුමක්ද? එය එම කාන්තාවන් දෙදෙනා අයත්වන පංති දෙකේ වෙනසය. 'නීතිය' පොහොසතුන්ට හා බලවතුන්ට එක් ආකාරයකිනුත් දිළින්දන්ට හා අසරණයන්ට තවත් ආකාරයකිනුත් ක්‍රියාත්මක වන බවට මෙය ජීවමාන උදාහරණයකි.






"නවීන ධනපති ක්‍රමයේ සෑම ජනේලයකින්ම සමාජවාදය අප වෙත බැලුම් හෙළාගෙන සිටියි. මෙම නවීන ධනපති ක්‍රමයේ පදනම අනුව ඉදිරි පියවරක් වන සෑම වැදගත් කටයුත්තක්ම මගින් සමාජවාදයේ කටු සටහන එක එල්ලේම සහ ප්‍රායෝගික වශයෙන් සලකුණු කරනු ලැබේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**263 පිටුව**

### රීතිය වෙනුවට ආ නීතිය

අප දන්නා කරුණු අනුව මානව සමාජය ආරම්භ වූයේ නීති සමග නොවේ. මානව සමාජය එහි දීර්ඝතම කාලපරිච්ඡේදය වූ ප්‍රාථමික සාමූහික ක්‍රමය තුළ පැවතියේද නීතීන් ඇතිව නොවේ. කවුරුත් දන්නා පරිදි සමාජය තුළ නීතීන් බිහිවූයේ පෞද්ගලික දේපළ මත සමාජය පංතීන්ට බෙදී, දේපළ හිමි පංතියේ වුවමනාවන් රැකීම සඳහා රජය බිහිවීමත් සමගය. සමාජය තුළ රජය හා නීතිය බිහිවීමට පෙර වසර 75,000කට වැඩි කාලයක් ප්‍රාථමික මානව සමාජය පාලනය වූයේ රීතීන් හා සම්ප්‍රදායන් ගෙනි. රීතීන් සම්ප්‍රදායන් සමාජය විසින්ම බිහිකරගත් ඒවා විය. ඒවා බිහිවූයේද සමාජයේ පොදු පැවැත්මට අත්‍යාවශ්‍ය වූ නිසාය. ඒ නිසාම සමාජයේ කිසිවෙකු රීතීන් හා සම්ප්‍රදායන් උල්ලංඝනය කිරීමට උත්සාහ කළේ නැත. ඉඳහිට එවැන්නක් සිදු වුවද සමස්ත සමාජ සංවිධානය මැදිහත් වී එය වැළැක්වීය. මිනිසුන් රීතීන් රැක්කේ සිය කැමැත්තෙනි. අද පවා මිනිසුන් රීති උල්ලංඝනය කරන්නේ අඩුවෙනි. මන්ද රීතීන් යනු සමාජය මත බලෙන් පැටවූවක් නොවන නිසාය. එහෙත් නීති සමාජය මත බලෙන් පටවනු ලැබූ දෙයකි. එය නොරැකෙන්නේද ඒනිසාය.

අතීතයේ මිනිසාගේ සරල දිවි පැවැත්ම තුළ ජලය වෙළඳ භාණ්ඩයක් වීමට පෙර, බෝතල් කළ වතුර හෝ නල මාර්ග යෙන් එන ජලය ඒමට පෙර ඇළ දොළ ගංගාවල ජලය පාවිච්චි කළ මිනිසා අතර රීතියක් විය. ඒ, ජල මාර්ග අපවිත්‍ර නොකිරීමය. ඒ නිසා කිසිවකු ජල මාර්ගවලට අපද්‍රව්‍ය නොදැමීය. එහෙත් වර්තමානයේ ජලය වෙළඳ භාණ්ඩයක් වීමත් මිනිසාගේ අධිපරිභෝජනවාදී ජීවන රටාව හා ආත්මාර්ථකාමීත්වයත් නිසා සිදුව තිබෙන්නේ කුමක්ද? ගංගා ඇළ දොළවලට අපද්‍රව්‍ය දැමීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කළ නීතියක් ඇතත් මිනිසුන් දිනපතා මෙම 'නීතිය' කඩමින් ජල මාර්ගවලට කසළ හා අපද්‍රව්‍ය එක්කරති. ඒ මිනිසුන් නීති රකින්නේ බිය නිසා මිස සිය කැමැත්ත අනුව නොවන නිසාය. එහෙත් මිනිසුන් රීතීන් රකින්නේ කැමැත්ත නිසාය. වෙනස එයය.

### නීතියේ ජීවය දේපළ වූ විට

නීතිය යනු ඕනෑම රටක රජයේ එක් පාර්ශවයකි. ලොව පුරාම ධනවාදය තුළත් ඊට පෙර පැවති පංති සමාජයන් තුළත් නීති නිර්මාණය කළේ රජයේ, අවශ්‍යතාවය සඳහා පාලක පංතීන් විසිනි. රජය අයත් වූයේ දේපළ හිමි පංතියටය. එවිට නීතීන්ගේ ජීවය වූයේ දේපළය. 19වැනි සියවසේ විසූ ප්‍රංශ මනෝරාජික සමාජවාදියෙක් හා දාර්ශනිකයෙකු වූ පියෙර් ජෝශප් ෆෘඩන් නැමැත්තා වරක් ප්‍රකාශ කළේ 'නීතියේ ජීවය දේපළ වේ' යනුවෙනි. ඔහුට අනුව නීතීන් යනු 'කලින් බලෙන් පැහැර ගැනීමක පාප ශෝධනයටත් නව බලෙන් පැහැර ගැනීමක් වැළැක්වීමටත්' සකස් කළ ඒවාය. ඔහු පවසන්නේ සත්‍යයකි. පැරණි ප්‍රාථමික සමාජයේ සමාජය සතුව තිබූ පොදු දේපළ, එම සමාජය තුළ බලවත් වූ පිරිසක් විසින් බලෙන් පැහැර ගනු ලැබීය. පෞද්ගලික දේපළ බිහිවූයේ එසේය. එම අතීත බලෙන් පැහැර ගැනීම සාධාරණය කර ගැනීමට ඔවුන්ට අවශ්‍ය වූ අතර යළි ඔවුන්ගෙන් එම දේපළ පැහැර ගැනීම වළක්වා ගැනීමටද ඔවුනට අවශ්‍ය විය. ඔවුන් නීති සකස් කළේ ඒ සඳහාය. 'නීතීන්ගේ ජීවය දේපළ' (පෞද්ගලික) වන්නේ ඒ අනුවය.

> "පැරණි ප්‍රාථමික සමාජයේ සමාජය සතුව තිබූ පොදු දේපළ, එම සමාජය තුළ බලවත් වූ පිරිසක් විසින් බලෙන් පැහැර ගනු ලැබීය. පෞද්ගලික දේපළ බිහිවූයේ එසේය. එම අතීත බලෙන් පැහැර ගැනීම සාධාරණය කර ගැනීමට ඔවුන්ට අවශ්‍ය වූ අතර යළි ඔවුන්ගෙන් එම දේපළ පැහැර ගැනීම වළක්වා ගැනීමටද ඔවුනට අවශ්‍ය විය. ඔවුන් නීති සකස් කළේ ඒ සඳහාය."

කිසියම් යුගයක පවත්නා නීතිය වූ කලී එම යුගයේ පාලක පංතියේ කැමැත්ත වන්නේ යැයි මාක්ස්වාදය අපට උගන්වයි. ඉන් කියවෙන්නේද කලින් පැහැදිලි කළ කරුණමය. එබැවින් නීතිය 'අපක්ෂපාතී' හා 'සාධාරණ' ලෙස පෙනී සිටීමට උත්සාහ කළද එය හැමවිටම එක් පංතියකට එරෙහිව එනම් දේපළ අහිමි පංතියට එරෙහිව දේපළ හිමි පංතියේ කැමැත්ත ප්‍රකාශ වීමකි.

### නූතන ධනවාදය තුළ නීතිය

අවසාන විග්‍රහයේදී නූතන ධනවාදය තුළද නීතිය පක්ෂපාතී වේ. දැන් ලංකාවේ අප දකිමින් සිටින්නේ එයය. ලෝකය ධනවාදයට පා තැබූ විට, පැරණි සමාජයේ නගන ලෙසම පාලක පංතියට පක්ෂපාතීව තිබූ නීතියත් නෛතික ආයතනත් වෙනස් කර ඊට පොදු හා සාධාරණ මුහුණුවරක් දීමට කටයුතු කළේය. නීතිය කාටත් සාධාරණය, නීතිය ඉදිරියේ කවුරුත් සමානය යන අදහස තහවුරු කිරීමට ධනවාදය කටයුතු කළේය. ඒ අනුව ධනවාදයේ නීති පෙර පැවති සමාජයේ නීතිවලට වඩා මදක් යහපත් විය. සමහර අවස්ථාවල ධනවාදයේ හෝ ප්‍රාග්ධන හිමි පංතියේ පැවැත්මට අභියෝගයක් නොවන අවස්ථාවල නීතිය හා ඒ හා සම්බන්ධ ආයතන අපක්ෂපාතී බව පවත්වා ගෙන යාමට කටයුතු කරනු දැකිය හැක. දියුණු ධනපති රටවල මෙය වඩාත් පෙනේ. යුරෝපා රටවල අගමැතිවරයා මාර්ග නීති කඩකළ විට ඔහුටද දඩ ගසන්නේ ඒ නිසාය. එය ධනේශ්වර නීතිය 'පොදු' හා 'සමාන' බව පෙන්වීමට හොඳ උදාහරණයකි. ඒ මගින් ධනේශ්වර පාලනය තමන්ට වාසි මතයක් ජනතාව තුළ තහවුරු කරයි. එහෙත් එය හැමවිටම කළ නොහැකි අතර නීතියේ පොදු පෙනුම බිඳවැටී ඊට යටින් ඇති සැබෑ යථාර්ථය මතුවන අවස්ථා ඇතිවේ. දැන් අපේ රට තුළ අප දකිමින් සිටින්නේ එයය.

### නීතියේ සළුපිළි ගැලවීම

ධනවාදය අර්බුදයට නොයන තාක්කල්, ධනපති පාලනයන් අර්බුදයට පත් නොවී සිටින තාක් නීතියටද සාධාරණත්වයේ සළු පැළැඳ සිටිය හැක. එහෙත් ධනවාදය සමාජ ක්‍රමයක් ලෙස පිරිහෙන විට, එය අර්බුදයට යනවිට, ධනවාදය තුළ ක්‍රමවත්ව හා නොපෙනෙන ලෙස කළ 'කොල්ලකෑම' වෙනුවට 'කොල්ලකෑම' ප්‍රසිද්ධියේ හා එළිපිට කිරීමට පාලකයන් පෙළඹෙන විට, ශුද්ධ වූ සියල්ල කෙළෙසෙන විට ධනවාදය තුළ නීතියද කෙළෙසෙන්නේය. එවිට නීතියට සාධාරණත්වයේ හා අපක්ෂපාතීත්වයේ සළුපිළි උනාදමා නිරුවතින් කටයුතු කිරීමට සිදුවන්නේය. මේ අප දකින්නේ එයයි.

තාජුඩීන් ඝාතනයේදී ඝාතකයින් නිදැල්ලේ සිටියෙදී එම ඝාතනයට අදාළ තොරතුරු සැඟවූ උසස් පොලිස් නිලධාරියාට රක්ෂිත බන්ධනාගාරයේ සිටීමට සිදුවන්නේත් වසර තුනකට බරපතළ වැඩ ඇතිව සිර දඬුවම් ලබාදුන් 'සිල්රෙදි' වංචාවේ 'වරදකරුවන්' දින 10ක් තුළ ඇප ලබා ගෙදර යන්නේත් ඉතාම කුඩා සොරකමක් කළ අය ඇප නැතිව මාස ගණන් සිරගෙවල දුක්විඳින්නේත් ධනවාදය තුළ නීතිය පාලක පංතියට හා පීඩිත පංතියට වෙනස් ලෙස ක්‍රියාවට නැගෙන නිසාය. අර්බුදයට පත් නූතන කොල්ලකාරී ධනවාදය තුළ අධිකරණයේ ගරු රඟපෑම්වලට තවදුරටත් ඉඩ නැති බව පාලක පංතිය භාවිතයෙන්ම පෙන්වා දී තිබේ. නීතිය තමන්ට අවශ්‍ය ලෙස ක්‍රියාවට නොනැඟීම නිසා හිටපු අගවිනිසුරුවරිය තනතුරෙන් ඉවත් කිරීමෙන් එය ඔප්පුකර තිබේ.

යකඩ බාල්ක ගිනිගත් නිවසක පුළුන් සෙවීම නිශ්ඵල බවත්, යකඩ මල්ලට ගුල්ලන් විදි කල හාල් මල්ල නොබලාම ඉවත් කළ යුතු බවත් අපේ ජනවහරේ දක්වේ. එය ධනවාදය තුළ නීතියටද අදාළය. සමස්ත සමාජයටම පිරිහී අර්බුදයට ගොස් ම්ලේච්ඡත්වයට ගමන්කරන විට ඒ තුළ නීතියට පමණක් ඉන් ගැලවී සිටීමට නොහැක. මේ පෙන්වන්නේ, ධනවාදයේ රෝගය නීතිය දක්වාම ඔඩුදුවා ඇති බවය. නීතිය එහි උපතින්ම පාලක පංතියේ කැමැත්ත හා පංති පීඩක උපකරණයක් විය. එහෙත් එය කිසියම් කලක තම සත්‍යය ස්වරූපය නොපෙන්වා පොදු හා සාධාරණ බවත් පෙන්වීමට කටයුතු කළේය. ඒ සඳහා වූ ගෞරවය ඊට හිමි විය යුතුය. එහෙත් දැන් තවදුරටත් එයට එසේ රඟපෑමට නොහැකිව තිබේ. ධනවාදී අර්බුදයේ පිරිහීම නීතිය තුළින්ද ප්‍රකාශ වන්නට පටන්ගෙන තිබේ.

ඉදින් නීතියේ ස්වාධීනත්වය අපේක්ෂා කරන සාධාරණය බලාපොරොත්තුවන අය කළ යුත්තේ කුමක්ද? නීතියේ සළුපිළි උනා දමා එයද දූෂ්‍ය කළ ධනපති පාලක පංතියත් ධනවාදී සමාජ ක්‍රමයත් පරාජය කිරීමය. එසේ නොවී කොල්ල කල්ලියක් රටක් පාලනය කරද්දී නීතියෙන් සාධාරණත්වය ඉල්ලා සිටීම හාස්‍යජනකය.

# මනුෂ්‍යත්වයේ වසන්තය වූ කලී සෝවියට් රුසියාවයි

*ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ සියවස් සමරුව වෙනුවෙන් 27වැනි දින සිදුකළ කෘති එළිදැක්වීමේ වේදිකාවේදී ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවියන් විසින් දක්වන ලද අදහස්වල කාලීන වැදගත්කම සලකා එම දේශනයෙන් උපුටාගත් කොටසක් මෙහි ඇතුළත් කිරීමට නියමුවා අපි තීරණය කළෙමු.*

"රුසියානු විප්ලවයට වසර සීයයි!" මේක අපේ ජීවිත කාලය තුළ උච්චාරණය කරන්න ලැබුණු ඉමිහිරිම වැකියක්. දේශපාලන ක්‍රියාධරයන් හැටියට රසිකයන් හැටියට එහෙමත් නැත්නම්, පුරවැසියන් හැටියට කම්කරුවන්, ශිෂ්‍යයන්, ධීවරයන් වගේ විවිධ කොටස්වල අය හැටියට ඔබ ඓතිහාසිකයි. ඒ වාගේම මේ ප්‍රදර්ශනය සංවිධානය කළ ජනතා විමුක්ති පෙරමුණේ සියලුම දෙනාත්, මේ කතා කරන අපත් සැම දෙනාම මේ රටේ ඓතිහාසික මොහොතක් සමරන චරිත බවට පත් වෙනවා. මා එසේ කියන්නේ, මනුෂ්‍ය ඉතිහාසයේ සුන්දරම ප්‍රයත්නය, බලගතුම ප්‍රයත්නය අපි මේ දවසේ ස්මරණය කරමින් ඉන්න නිසා.

මනුෂ්‍යයා උදෙසා යහපත් සමාජයක් නිර්මාණය කර ගන්න, පුද්ගල ගරුත්වය, පුද්ගලයාගේ වගකීම් සහ අයිතිය වාගේම අනෙකාගේ ජීවත් වීමේ අයිතිය සුරැකීම වෙනුවෙන් දිවි පරදුවට තැබූ සටනක් රුසියානු විප්ලවය. ඒ ප්‍රයත්නයේදී මුළු ලෝකයම සෙලවුණා. ජෝන් රීඩ් කියන ඇමෙරිකානු මාධ්‍යවේදියා සම්පාදනය කළ Ten Days that shook the world 'ලොව හෙල්ලූ දස දවස' කියලා සිංහලට පරිවර්තනය කරලා තියෙනවා. ෆොරන්ට් බැටී සිනමා අධ්‍යක්ෂවරයා මේ කෘතිය පදනම් කරගෙන 'ද රෙඩ්' (The Red) කියලා චිත්‍රපටයක් නිර්මාණය කරලා තියෙනවා. රෙඩ් කියන්නේ 'රත්තෝ' කියන එකයි. දවස් දහයක් ඇතුළත මුළු ලෝකයම හෙල්ලුවේ ඒ අය. ඒ මිනිස් සමූහය ඇත්තටම ඓතිහාසිකයි.

සමහර ඓතිහාසික දේවල් සිහිපත් කරන කොට හැඟෙන්නේ පුදුමයක්. 1818 කාල් මාක්ස් කියන දේශපාලන ආර්ථික දාර්ශනිකයා ඉපදෙනවා. අපි මේ පුංචි දූපතේ උඩරට කැරැල්ල ගසමින් ඉන්නවා. ඒ කියපු කාල් මාක්ස් 1848 කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය ලියමින් ඉන්නවා. අපි මෙහෙ මාතලේ කැරැල්ල ගසමින් ඉන්නවා. මේවා අපූරු ඓතිහාසිකයන් නොවේද? දැන් මේ මොහොතේ අපි විහාරමහාදේවී උද්‍යානයේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය සමරමින් ඉන්නවා.

මීට හරියටම අවුරුදු සීයකට එපිට ශාන්ත පීටර්ස්බර්ග් නගරය කොහොම තියෙන්නට ඇද්ද? ලොව හෙල්ලූ දස දවසේ විප්ලවවාදීන්ගේ ප්‍රාර්ථනා මොන තරම් උණුසුම්ව තියෙන්නට ඇද්ද? ඒ වෙනුවෙන් දිවි පිදූ, සදාකාලිකව අංගවිකලභාවයට පත්වූ, ප්‍රේමය දෙකඩවී ගිය, මව්වරුන්ට දරුවන් අහිමිවී ගිය අතිශය බරපතළ කැපවීමක් කළ විප්ලවවාදීන් අවුරුදු සීයකට පස්සේ සමරන්නට ලැබීම ඉතාමත් ඓතිහාසිකයි කියලයි මම හිතන්නේ.

'රුසියානු සාහිත්‍යය' කියන්නේ, 'ඔක්තෝබර් විප්ලවය' වාගේම එබඳුම උණුසුම්, අපේ ජීවිතවල තිබෙන ඉතාම බලගතු වචන දෙකක්. විප්ලවීය සාහිත්‍යය රුසියානු සාහිත්‍යය ලෙසත් පශ්චාත් විප්ලවීය සාහිත්‍යය සෝවියට් සාහිත්‍යය ලෙසත් දළ වශයෙන් අපට හඳුන්වන්න පුළුවන්. මේ බෙදීමේ සංකීර්ණතා නොතිබෙනවා නොවෙයි. සෝවියට් සාහිත්‍යය අඩුම තරමින් ලංකාවේ පරම්පරා තුන හතරක ජීවිත ඉතාම වෙනස් මාර්ගයකට ප්‍රවේශ කරවන්න නිරනුමානවම ඉවහල් වුණා. එතරම්ම බලපෑම් සහගත සාහිත්‍යයක් ඒක.



## ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි

මෙතැනදී කිසියම් උපකල්පනයක් (Hypothesis) කරන්න මට හිතෙනවා. සෝවියට් රුසියානු සාහිත්‍යය ඉතාම පුළුල්ව ඇසුරු කළ ලාංකිකයා සහ ඒ සාහිත්‍යය පුළුල්ව ඇසුරු කරන්නට වරම් නොලැබුණු ලාංකිකයා කියන සමාජ කොටස් දෙක ගැන අපට සලකා බලන්න පුළුවන්. සමාජ ජීවීන් හැටියට අප තුළ තිබෙන්නට ඕනෑ ලක්ෂණ, ජීවගුණය, චරිත ලක්ෂණ, පුරුෂාර්ථ අනුව කල්පනා කර බැලුවොත්, රුසියානු සාහිත්‍යය ඇසුරු කළ පිරිස යම් කිසි දැමුණු බවක්, යහපත් මනුෂ්‍ය සමාජයක් නිරන්තරව ප්‍රාර්ථනා කළ බවක් තිබුණා. මනුෂ්‍යයා වෙනුවෙන් ලෝකය වෙනස් කරන්නට ඉතාම සුළුවෙන් හෝ තම තමන්ගේ පරිශ්‍රයන් තුළ දායකත්වයක් ලබා දෙන්නට ඔවුන් කල්පනා කළා.

ඒ අයගේ චරිත ලක්ෂණ තුළ තවත් දෙයක් වූයේ, ජීවන කොන්දේසි හැටියට අප කරා පතිතවී තිබෙන යථාර්ථය නැත්නම්, ලැබෙන දේ උරුමය හැටියට භාර නොගෙන සිටීමයි. අද මෙය 'උරුමය' හැටියට භාර ගන්නා නිවට ස්වරූපය දුටුවාම අපට ඇති වන්නේ කම්පනයක්. බර්ටි බී. කුඩාහෙට්ටි වගේ කවියෙකුට 'නිවටෝය මුන් හැම දෙන' කියලා ලියන්න වෙන්නේ, ලැබෙන දේ ප්‍රශ්න කිරීමකින් තොරව භාර ගන්නා පුරවැසි සමාජය ගැන කම්පනයෙන්. මා කලින් කියූ පරපුර එහෙම භාර ගත්තේ නැහැ. එය වෙනස් විය යුතුයි කියා එය වෙනස් කරන්න පුංචි හරි දහදිය බිඳුවක් හෙළන්න ඉදිරිපත් වුණා.

දෙවැනි කොටසට රුසියානු සාහිත්‍යයේ මහා 'සද් ආශ්‍රය' නොලැබුණු පරම්පරාවක් හෝ දෙකක් අයිති වෙනවා. මේ අයට සිද්ධ වුණේ ආත්මාර්ථය, ධන ලෝභය, තරගය වගේ මූලික සිල්පද බවට පත් වුණු සමාජයක ජීවත් වෙන්න. ඒ මූලික සිල්පදවල තිබෙන අපුල, අමිහිර වටහා ගැනීම රුසියානු සාහිත්‍යයෙන් වියෝ වීමෙන් පමා වෙනවා. අනෙකාගේ නිදහස වෙනුවෙන් කතා නොකරන, වැඩි වැඩියෙන් කේවලත්වය වැළඳ ගත් සමාජය තමයි, මේ දෙවැනි පරම්පරාවේදී හමු වන්නේ. ඒ වාගේම දෛනික අරගලය ඉක්මනින්ම අත්හැරලා, ධනේශ්වර සමාජයේ තිරශ්චීන කොන්දේසි ඉතා ඉක්මනින්ම ප්‍රශ්න නොකර වැළඳ ගන්නා පරම්පරා දෙක තුනක් අද නිර්මාණය වෙමින් තිබෙනවා.

මා මේ බව කියන්නේ, ඒ අයට දොස් කියන රළු පරළු අදහසකින් නොවෙයි. එබඳු සමාජයක් ඒ අයට උරුම වුණේ තනිකරම ඒ අයගේ කේවල වරදකින් නොවෙයි. මේ සමාජයේ නිර්මාණයක් තමයි, ඒ අය. දේශපාලන නායකත්වයට ඕනෑ වුණේ අයාලේ යන සමාජයක් නිර්මාණය කරන්න. උපක්‍රමශීලීව ඒ අයාලේ යන සමාජය ගොඩනැඟුවා. නමුත්, රුසියානු සාහිත්‍යය ආශ්‍රය කරපු මනුෂ්‍ය සමාජය කොයි වගේ වුණාද? **මනුෂ්‍ය සමාජය ජඩ පක්ෂය, මනුෂ්‍ය සමාජයේ තිබෙන අඩුපාඩුකම් ඒ සාහිත්‍යයෙන් විවෘත කර පෙන්වා දුන්නා. අඳුරු අගාධවලට වාගේම සොඳුරු තැනිබිම්වලටත් ඒ සාහිත්‍යය අපව යොමු කළා. ලාරාගේ අපේක්ෂාභරිත ප්‍රේමයටත් ඒ වාගේම දුයිෂෙන් කැපවීම සහ ඉවසීම වැනි දේටත් ඒ තුළින් අපව යොමු කළා. මේ වාගේ ආදර්ශ අපට ලැබුණේ, සෝවියට් රුසියානු සාහිත්‍යයෙන්. ජීවිතය, සමාජය වටහාගෙන යහපත වෙනුවෙන් ඒ මනුෂ්‍ය සමාජයම වෙනස් කිරීමට කැප වෙන්න අපට කියා දුන්නේ, සෝවියට් සාහිත්‍යයෙන්.**

මේ සාහිත්‍යයේ ගැබ් වෙන්නේ මේ කියන මානයන් විතරක්ද? ඔක්තෝබර් විප්ලවයෙන් නව සමාජයක් බිහි කරන්න කැප වූ නායකත්වයට ඉතා ඉක්මනින්ම ප්‍රවේශ වෙන්න සිද්ධ වුණේ සංස්කෘතියට සහ අධ්‍යාපනයට. මේ දෙකම ඉක්මනින්ම ගොඩනඟන්න ඕනෑ වුණා. මා මෙහෙම කියන කොට අපේ රටේ සංස්කෘතියට සහ අධ්‍යාපනයට වෙන් කර තිබෙන තැන ගැන ඔබ කල්පනා කළ යුතුයි. නායකකාරකාදීන් මේ සම්බන්ධයෙන් කරන කැපවීම කොතරම් නිර්ලජ්ජිත තැනකද තියෙන්නේ? ඇනටෝලි ලුනාචාර්ස්කි වාගේ පළපුරුදු අධ්‍යාපනඥයකුට සංස්කෘතිය සහ අධ්‍යාපනය රුසියානු විප්ලවයෙන් පසු භාර දුන්නා. ඔවුන් කැපවීමෙන් හැම අතින්ම ඒ වෙනස සිදු කළා.

මාගේ වැඩිපුර අවධානය තිබෙන සිනමාවේ සිදුවුණු වෙනස්කම් ගැන මට මතක් වෙනවා. මොස්කව් චිත්‍රපට ඇකඩමිය ඉතා ඉක්මනින්ම ගොඩනැඟුවා. ලෙනින් නායක සහෝදරයාට සිනමාව ගැන විශාල විශ්වාසයක් තිබුණා. චිත්‍රපට ඉගැන්වීමේ අත් පොතක් බඳුවූ ක්‍රිෂෝව් ක්‍රිටනොව්ස්කිගේ 'කැමරා බග්' කියන චිත්‍රපටය නිෂ්පාදනය කෙරුණා. කැමරා බග් චිත්‍රපටයේ එක්තරා තරුණයෙක් තමන්ගේ බිරිඳට දරුවා ලැබීම සිනමා කැමරාවකින් රූ ගත කරනවා. පුංචි දරුවා ගෙදර ගෙන යන්නට පෙර මොහු වෛද්‍යවරයාව මුණගැහෙනවා. වෛද්‍යවරයා මේ තරුණයාගෙන් "ඔබ මේකෙන් මොකද කරන්නේ?" කියලා අහනවා. "මා මගේ දරුවාගේ මුළු ජීවිතයම මේකෙන් රූ ගත කරනවා." කියන උත්තරය ලබා දෙනවා. එතකොට වෛද්‍යවරයා "ඔව්. ඔබ හරි. සියලු කලාවන් අතර සිනමාව තමයි, ශ්‍රේෂ්ඨ වන්නේ." කියලා කියනවා. එතකොට තරුණයා අහනවා, "කවුද ඒක කිව්වේ?" කියලා. වෛද්‍යවරයා කියනවා, "ලෙනින්." කියලා. Cinema is the super part කියලයි ලෙනින් කීවේ.

> **මනුෂ්‍ය සමාජය ජඩ පක්ෂය, මනුෂ්‍ය සමාජයේ තිබෙන අඩුපාඩුකම් ඒ සාහිත්‍යයෙන් විවෘත කර පෙන්වා දුන්නා. අඳුරු අගාධවලට වාගේම සොඳුරු තැනිබිම්වලටත් ඒ සාහිත්‍යය අපව යොමු කළා. ලාරාගේ අපේක්ෂාභරිත ප්‍රේමයටත් ඒ වාගේම දුයිෂෙන් කැපවීම සහ ඉවසීම වැනි දේටත් ඒ තුළින් අපව යොමු කළා.**

ලෙනින්ගේ පොත් කියැවීම කොයි වාගේද කියලා ඔබ දන්නවාද? එක මොහොතක 'කළ යුත්තේ කුමක්ද?' කියන කෘතිය ලියමින් ඉන්න කාලේදී ලෙනින්ට පණිවිඩයක් ලැබෙනවා, පැය දෙක තුනක් ඇතුළත ඉවත් වෙන්න. නැත්නම්, අත්අඩංගුවට ගනී කියලා. කෘෘප්ස්කායාට සහ ලෙනින්ට ඉබේම කියැවෙන්නේ "එහෙම යන්නේ කොහොමද?" කියලයි. නමුත්, දේශපාලන කොන්දේසි මත පිටත්ව යන්නට සිද්ධ වෙනවා. ඒ වෙන කොට ලබාගෙන තිබුණු පුස්තකාල පොත් හැම එකක්ම ආපහු භාර දීලයි, කෘෘප්ස්කායා පිටත්ව යන්නේ. ඒ තරම් කියැවීමක් ඔවුන්ට තිබුණා. අලුත් රුසියාවට සිද්ධ වුණා බලගතුම සාහිත්‍යධරයා කවුද කියලා තෝරා ගන්න. තොල්ස්තෝයිද නැත්නම් දොස්තයෙවුස්කිද යන ප්‍රශ්නය මතු වුණා. ජෝර්ජ් ස්ටයිනර් මේ ප්‍රශ්නය ගැන ලිපියක් ලියලා තියෙනවා. ඒ ලිපිය පාදක කරගෙන එරික් ඉලයප්පාරච්චි සිනමාවට ගලපලා, වෙනත් ලිපියකුත් ලිව්වා. සෝවියට් සිනමාවේ මූලික දශක තුන හතර ඇතුළත බලගතුම සිනමා න්‍යායයන් දෙකක් එකතු වෙනවා. මේ න්‍යායයන් දෙකම උපදින්නේ සෝවියට් දේශයෙන්. අයිසෙක් මයින් කියන සිනමාකරුවා 'මොන්ටාජ්' නැත්නම්, සමෝධායනික කියන රීතිය ඉදිරිපත් කළා. වසර කිහිපයක් යන තුරු සිනමාවේ බලගතුම රීතිය වුණේ ඒක.

ඉන් තරමක කාලයකට පස්සේ අන්ද්‍රෙයි තල්තොව්ස්කි මේ මූලික රීතිය උඩු යටිකුරු කරනවා. සිනමාවේ මූලික ඒකකය සමෝධානය හෝ රූප රාමු නොව කාලය බවයි, තල්තොව්ස්කි ප්‍රකාශ කළේ. සෝවියට් සාහිත්‍යයේ ක්‍රියාත්මක වුණු ඒ යුගයේ යම් යම් ලක්ෂණවලට අවනත වෙලා රටෙන් බැහැර වෙන්න තල්තොව්ස්කිටත් සිද්ධ වෙනවා. ඔහුගේ සිනමා කෘති පහක් හයක් නිෂ්පාදනය කෙරෙන්නේ රුසියාවෙන් බැහැරව ගියාට පසුවයි. 1985දී ඔහුගේ අන්තිම කාලයේ සිනමා කාලය මිනීම සම්බන්ධයෙන් පොතක් ලියා පළ කළා. මේ වැනි දේත් සෝවියට් සාහිත්‍යය ගැන කතා කරන කොට සිහිපත් වෙනවා.

රුසියානු විප්ලවයේ කැඩපත තොල්ස්තෝයි කියලා ලෙනින් කිව්වේ, රුසියානු සාහිත්‍යයේ කාර්යභාරය සමාජවාදී යථාර්ථය ඉලක්ක කරගෙන තිබුණු නිසා නොවෙයි. ඒක ඉතාම සංකීර්ණ තත්ත්වයක්. මහාචාර්ය ලියනගේ අමරකීර්ති පරිවර්තනය කළ 'මහා පුරුෂයකුට බිරිඳක්ව' කියන කෘතියෙන් මේ සංකීර්ණ තත්ත්වයන් ගැන ඔබට කියවන්න පුළුවන්. තොල්ස්තෝයි කියන මහා සාහිත්‍යවේදියා තුළ මොන තරම් සංකීර්ණ චරිතයක් ගැබ් වෙනවාද කියන එක ඔහුගේ ප්‍රතිවිරෝධ සිතුවිලිවලින් ගහණ සංකීර්ණ ජීවිතය ගැන එහි සඳහන් වෙනවා. තොල්ස්තෝයිගේ සාහිත්‍යයේ ගැබ් වෙන්නේ මේ කියන සංකීර්ණම තත්ත්වයයි. ඒ නිසා ඔහු නියෝජනය කළ සංකීර්ණත්වය සහ ඒකාකාරී නොවන එකිනෙකට වෙනස් අතිශය සුවිශාල චරිත සම්භාරයෙන් කියැවෙන්නේ, මහා රුසියාවේ ප්‍රතිබිම්බයක්. ඒ යුගයේ තිබුණු ගැටලුවල ප්‍රතිබිම්බයක්. රුසියානු විප්ලවයේ කැඩපත යනුවෙන් ලෙනින් හඳුන්වන්නේ ඒ නිසයි. සමාජය වෙනස් කළ හැකි වන්නේ සමාජවාදී යථාර්ථය (Socialist Reality) ගැබ් වුණු කෘතිවලින් විතරක්ම නොවෙයි. නමුත්, සමාජවාදී යථාර්ථය පිළිබිඹු කළ සාහිත්‍යයේ වටිනාකම අදටත් අංශු මාත්‍රයකින් හරි වෙනස් නොවී තිබෙන බවත් කියන්නට ඕනෑ.

**අප සාහිත්‍යයෙන් ග්‍රහණය කර ගත යුත්තේ, විශ්වීය යථාර්ථයයි. මානව සෞන්දර්යය හා මානව භක්තියයි. මෙය රැක ගන්නට නම්, ඊට එරෙහිව එල්ල වෙලා තියෙන සියලුම තර්ජනවලින් අපි අවබෝධයක් ලබා ගන්න ඕනෑ. එයට එරෙහිව සටන් කරන්න තමයි, සාහිත්‍යකරුවා පෙරමුණ ගෙන සිටින්නේ.** ඒ සටන තමයි, සාහිත්‍යයේ සහ කලාවේ විප්ලවය. ලියොන් ට්‍රොට්ස්කි කියන්නේ, පක්ෂය සෘජුවම අණ දීමක් කරන ක්ෂේත්‍ර තිබුණත්, පක්ෂයේ සෘජුවම අණ දීමක් නොකරන ක්ෂේත්‍රත් තියෙන බවයි. සාහිත්‍ය කලාව කියන්නේ, එබඳු සෘජුවම අණ දීමක් නොකරන ක්ෂේත්‍රයක්. සාහිත්‍ය කලාවේ නියුතු අයම එහි කොන්දේසි අනුව එහි ගමන් මාර්ගය හදා ගත යුතු බවයි, ඔහු කියන්නේ.

අපේ කාලයේ තරුණ කවියකු වන පියංකාරගේ බන්දුල 'යට කඩේ උඩ ගෙදර' කියලා කවි පොතක් ලියලා තියෙනවා. මේ කෘතියෙන් සමාජයේ තිබෙන යථාර්ථය ග්‍රහණය කර ගන්න අමාරු නැහැ. පදනම සහ මතු මහල පිළිබඳ ගැඹුරුම කතාව මේ පුංචි රූපකයට ගේනවා. පදනම තමයි, ආර්ථිකය. උඩ තියෙන ගෙදර තමයි, සංස්කෘතිය, කලාව, නීතිය, අධ්‍යාපනය ආදී පුරුෂාර්ථ. ඔබ දන්නවා අපේ රටේ තත්ත්වය මොකක්ද කියලා. අපේ රටේ දැන් තියෙන්නේ, 'යට කඩේ උඩ ගෙදර' නොවෙයි. මුළු ගෙදරම කඩයක් වෙලා. මෙතැනයි ප්‍රශ්නය තියෙන්නේ. සාහිත්‍යය මිනිසුන්ගෙන් ඈත් කරන්නේ, මුළු ගෙදරම කඩයක් වීම නිසයි.

සෝවියට් සාහිත්‍යයෙන් එදා වැළැක්වූයේ, මුළු ලෝකයම 'කඩයක්' වීමේ අනතුරයි. එදා අපට මාසිකව තැපෑලෙන් ආව 'සෝවියට් දේශය' කියන සඟරාව ඇතුළේ 'සමාජවාදය' කියලා පුංචි පොතක් තිබුණා. ඒවා තමයි, අපේ ජීවිත වෙනස් කරන්නට හේතු වුණේ. ඒ සෝවියට් දේශය ගැන ගැටලුවක් උද්ගත වෙලා තිබෙන බව අපි ඒ දවස්වල දැනගෙන හියේ නැහැ. 1988-89 කියන්නේ අපේ රටේ උණුසුම් දෙවසරක්. අපි සාමාන්‍යපෙළ සහ උසස්පෙළ හදාරමින් හිටිය කාලේ. හැබැයි, 1991 වන කොට ඒ ශ්‍රේෂ්ඨ විප්ලවීය භූමිය වෙනස්වීම්වලට ලක්වී තිබුණු බව පසු කාලයකදී අපි තේරුම් ගත්තා.

විප්ලවයේ කවියාවූ මායාකොව්ස්කි විටෙක සඳහන් කරන්නේ,

මනුෂ්‍යත්වයේ 15 පිටුවට

# ස්පාඤ්ඤය: කැටලෝනියාව වෙන් වී යාමේ ඉමක




පසුගිය ඔක්තෝබර් පළමුවැනිදා පැවත්වුණු කැටලෝනියාවට ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම සඳහා වන ජනමත විචාරණය ව්‍යවස්ථා විරෝධී බව ස්පාඤ්ඤයේ ව්‍යවස්ථාදායක අධිකරණය ඒකමතිකව තීරණය කර තිබේ. මෙම ජනමත විචාරණය පැවැත්වූයේ එය පැවැත්වීම නීති විරෝධී බවට ස්පාඤ්ඤය විසින් ප්‍රකාශ කරනු ලැබ තිබියදීය. ජනමත විචාරණය පැවැත්වීම වැළැක්වීම සඳහා ස්පාඤ්ඤය රාජ්‍ය බලය යෙදවූවද සමස්ත ඡන්ද දායකයින්ගෙන් 42.5%ක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි. ඇතිවූ ගැටුම්වලින් 890 දෙනෙක් තුවාල ලැබීය. ඡන්දය ප්‍රකාශ කළ අයගෙන් 90%ක් කැටලෝනියාව ස්පාඤ්ඤයෙන් වෙන්වීමට පක්ෂව ඡන්දය ප්‍රකාශ කර තිබූ අතර විරුද්ධව ඡන්දය ප්‍රකාශ කර තිබුණේ 7.8%ක ප්‍රමාණයකි.

කැටලෝනියාව මධ්‍යධරණී මුහුදට හා ප්‍රංශයට මායිම්ව නැගෙනහිර ස්පාඤ්ඤයේ පිහිටා ඇති වර්ග කි.මී 32,105ක පමණ ප්‍රමාණයකින් යුක්ත ප්‍රදේශයකි. එය බාසිලෝනා, ගිරෝනා, ලෙයිඩා, ටැරගෝනා නම් පළාත් 4කින් යුක්ත ස්පාඤ්ඤයේ ස්වයං පාලිත ප්‍රදේශයකි. එහි අගනුවර වන බාසිලෝනාව ස්පාඤ්ඤයේ දෙවන විශාලතම ජනාකීර්ණ නගරයයි. කැටලෝනියාව ස්පාඤ්ඤයේ භූමි ප්‍රමාණයෙන් 6.3%කි. ජනගහනය ස්පාඤ්ඤයේ සමස්ත ජනගහනයෙන් 16%කි. ස්පාඤ්ඤයේ ඇති සශ්‍රීකම පළාත වන කැටලෝනියාව ස්පාඤ්ඤයේ සමස්ත දළ ජාතික නිෂ්පාදිතයෙන් 20.1%ක් නිපදවයි. ස්පාඤ්ඤයේ සමස්ත අපනයනයන්ගෙන් 25.6%ක් සිදුකෙරෙනුයේ කැටලෝනියාවෙනි. කැටලෝනියාව ස්පාඤ්ඤයේ සමස්ත බදු ආදායමෙන් 20%ක් උපයාදෙයි. මීට අමතරව සංචාරක ව්‍යාපාරයෙන් 23.8%ක් සිදුකරන ස්පාඤ්ඤයේ අඩුම විරැකියා අනුපාතය වන 13.2%ක් වාර්තා වන්නේද කැටලෝනියාවෙනි.

කැටලෝනියාව තුළ ස්පාඤ්ඤ හා කැටලෝනියා යන භාෂා ද්විත්වයම නිල භාෂා ලෙස සැලකේ. එහි ජනතාවගෙන් 46.53%ක් ස්පාඤ්ඤ භාෂාව මවු භාෂාව ලෙස සලකන අතර 37.26% කැටලෝනියානු භාෂාව මවු භාෂාව ලෙස සලකයි. 11.95%ක පිරිසක් භාෂා ද්විත්වයම භාවිතා කරති.

කැටලෝනියාව වෙනම පාලන ඒකකයක් ලෙස පැවත එන්නේ වර්ෂ 988 පමණ සිටය. මධ්‍ය කාලීන යුගයේදී එය වෙනම රාජධානියක් ලෙස පැවතුණි. අද ස්පාඤ්ඤයට අයත් ප්‍රදේශය 1469 වන විට කැස්ටිලා ලියොන්, ඇරගන් ( වත්මන් කැටලෝනියාවද අයත් ප්‍රදේශය), ඉස්ලාමීය ග්‍රෙනෙඩා සහ නවාරේ ලෙස රාජධානි 4කින් යුක්ත විය. කැස්ටිලා ලියොන් රාජධානියේ රැජින වූ ඉසබෙලා හා ඇරගන් රාජධානියේ රජ වූ ෆර්ඩිනැන්ඩ්ගේ විවාහයත් සමග මෙම රාජධානියන් දෙකම එක රාජධානියක් බවට පත් විය. පසුව ෆර්ඩිනැන්ඩ් රජු අනෙක් රාජධානි දෙක යටත්කර ගැනීමෙන් වත්මන් ස්පාඤ්ඤය බිහි කෙරුණි.

ස්පාඤ්ඤය ජනරජයක් බවට පත්වූ 1931-1939 සමයේ දී කැටලෝනියාව ස්පාඤ්ඤය තුළ ස්වයං පාලිත ආණ්ඩුවක් සහිත ප්‍රදේශයක් බවට පත්විය. 1939 ස්පාඤ්ඤ සිවිල් යුද්ධයෙන් පසු ජෙනරාල් ෆ්‍රැන්කෝගේ පාලන සමයේ කැටලෝනියාව දරුණු මර්ධනයකට මුහුණ පෑවේය. එහි ස්වයංපාලිත තත්වය අහෝසි කරනු ලැබූ අතර කැටලෝනියානු භාෂාව භාවිතය මුළුමනින්ම තහනම් කෙරුණි. ජෙනරාල් ෆ්‍රැන්කෝගේ මරණින් පසු ස්පාඤ්ඤය යළි ප්‍රජාතන්ත්‍රවදයට පිවිසීමේදී එයට යළි ස්පාඤ්ඤය තුළ ස්වයං පාලන තත්වය ලබාදෙනු ලැබිණි.

කැටලෝනියාව තුළ වෙනම රාජ්‍යයක් සඳහාවූ වෙන්වීමේ ව්‍යාපාරය නව පණක් ලබන්නේ 2008 වසරේ ඇරඹි ලෝක ආර්ථික අර්බුදයත් සමගය.

සමාජවාදී සභාගය කැටලෝනියානු ස්වයංපාලිත ආණ්ඩුවේ බලය හොබවන අතරේ කැටලෝනියාවට වැඩි බලතල ප්‍රමාණයක් ලබා දීමට මධ්‍යම රජය එකඟ විය. එය 2006 වසරේ සිට ක්‍රියාත්මක වූ අතර එතැන් සිට කැටලෝනියාව වෙනම 'ජාතියක්' ලෙසද හැඳින්වීමට පටන් ගැනුණි.

2009-2011 වසර අතරතුරදී කැටලෝනියානු ජාතිකවාදීන් වෙන්වීම සඳහා නිල නොවන ජනමත විචාරණයන් ගණනාවක්ම පැවැත්වීය. එහෙත් ඒවා ව්‍යවස්ථා විරෝධී යැයි ව්‍යවස්ථාදායක අධිකරණය ප්‍රකාශයට පත් කළේය.

2010 වසරේ අගදී පළාතේ බලය ජාතිකවාදීන් අතට පත්විය. 2013 වසරේදී ස්වයංපාලිත ආණ්ඩුව ස්වාධීනතා ප්‍රකාශනය තම පාර්ලිමේන්තුවේදී අනුමත කරගනු ලැබුණි. 2014 නොවැම්බරයේ දී මේ සඳහා ජනමත විචාරණයක් තීන්දු කළද මධ්‍යම රජය එය ව්‍යවස්ථා විරෝධී ලෙස ප්‍රකාශ කළේය. 2015 වසරේ දී යලිත් වරක් වෙන්වීමේ ව්‍යාපාරය නියෝජනය කරන පක්ෂ ස්වයංපාලිත ආන්ඩුවේ බලයට පත්විය. මෙවර පැවැත්වූ ජනමත විචාරණය තීන්දු කෙරුනේ එම ආණ්ඩුව විසිනි.

ස්පාඤ්ඤයෙන් කැටලෝනියාව වෙන්වී යාම හුදෙක් ස්පාඤ්ඤය තුළ පමණක් නොව ජාත්‍යන්තර දේශපාලනයේද තවත් එක් තීරණාත්මක සිදුවීමක් බවට පත්වෙමින් තිබේ.

එක්සත් ජනපදයත් යුරෝපා සංගමයත් කැටලෝනියාව වෙන්වීයාම නොපිළිගන්නා ස්ථාවරයක සිටී. 2015 වසරේදී එවකට එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා ප්‍රකාශ කළේ එක්සත් ජනපදය කැටලෝනියාව ස්පාඤ්ඤයෙන් වෙන්වීයාම අනුමත නොකරන බවය. එම වසරේදීම යුරෝපා සංගමය ප්‍රකාශ කළේ තමන් කැටලෝනියාව යුරෝපා සංගමයට ඇතුලත් කර නොගන්නා බවය. එහෙත් ඒ අතරම උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO) මේ වන විටත් කැටලෝනියාව වෙන්වී යාමෙන් පසු NATO සංවිධානයේ නාවික බලය මධ්‍යධරණී මුහුද තුළ තර කර ගන්නා ආකාරය පිළිබඳව අභ්‍යන්තර සාකච්ඡා ආරම්භ කර තිබේ. කැටලෝනියාවේ බෙදුම්වාදී කණ්ඩායම්ද NATO සංවිධානය සමග එක්වීම පිළිබඳවත් කැටලෝනියාව ලෙස යුද බලය අත්පත් කරගන්නා ආකාරය පිළිබඳවත් සාකච්ඡා ආරම්භ කර ඇති බව වාර්තාවේ.

ඒ කෙසේ වෙතත් කැටලෝනියාව ස්පාඤ්ඤයෙන් වෙන්වීම දෙකොටසටම අවාසිදායක වනු ඇති බවට බොහෝ සාධක තිබේ.

## නේපාලය: වම එකට



ඉදිරි නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී පැවැත්වීමට නියමිත ෆෙඩරල් හා පළාත් මැතිවරන ඉලක්ක කරගනිමින් නේපාලයේ වාමාංශික පක්ෂ එක් පෙරමුණකට ඒමට තීරණය කර තිබේ. ඒ අනුව නේපාලයේ එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයත් (CPM-UML) පුෂ්ප කමාල් හෙවත් ප්‍රචණ්ඩාගේ මාවෝවාදී කොමියුනිස්ට් පක්ෂයත් (CPM- MAOIST CENTRE) නේපාලයේ නායා ශක්ති පක්ෂයත් අනාගතයේ එකම පක්ෂයක් බවට පත්වීමේ අරමුණ ඇතිව මැතිවරණ සන්ධානයකට එළඹ තිබේ පසුගිය ඔක්තෝබර් තුන්වැනිදා ඔවුන් මේ බව මාධ්‍යයට අනාවරණය කළේය. එක් පක්ෂයක් බවට පත්වීම අරමුණු කර ගනිමින් පොදු මතවාදයක් ගොඩනැගීමටත් මැතිවරණය උදෙසා පොදු මැතිවරණ ප්‍රකාශනයක් සකස්කර ගැනීමටත් අපේක්ෂකයන් තෝරා පත්කර ගැනීමටත් අදාළ කරුණු හයකින් යුක්ත ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කරනු ලැබ තිබේ. මෙම මැතිවරණ සංවිධානය නේපාල කොමියුනිස්ට් පක්ෂය ලෙස නම් කිරීමටද ඔවුන් තීරණය කර තිබේ.

නේපාල ජනතාවගෙන් 2/3ක් පමණ වාමාංශික අදහස් දරන්නෝ වෙති. එහෙත් එරට වාමාංශික පක්ෂ බෙදී වෙන්වී කටයුතු කරන නිසා එහි වාසිය නේපාල කොන්ග්‍රසයට හිමි විය. මෙම ප්‍රවෘත්තියත් සමග නේපාල කොන්ග්‍රසය කලබල වී සිටිනා බවත් මෙම වාමාංශික සන්ධානයට එරෙහිව කුඩා පක්ෂ එක්කර ගනිමින් නේපාල කොන්ග්‍රසයේ නායකත්වයෙන් විකල්ප සන්ධානයක් ගොඩ නැගීමටත් වන සූදානම් වන බව වාර්තා වේ.

## යුනෙස්කෝව: එක්සත් ජනපදයේ වෛරයට ලක්වී




2016 වසරේ දෙසැම්බර් 31 දින සිට තමන් යුනෙස්කෝ (UNESCO) සංවිධානයෙන් ඉවත්වන බවට ඔක්තෝබර් 12වැනි බ්‍රහස්පතින්දා එක්සත් ජනපදය නිල වශයෙන් ප්‍රකාශයට පත් කළේය. ඊට හේතුව ලෙස එරට ඉදිරිපත් කළේ යුනෙස්කෝ සංවිධානය ඊශ්‍රායල විරෝධී ස්ථාවරයක් අනුගමනය කිරීමත් යුනෙස්කෝ සංවිධානයේ මූලික ප්‍රතිසංවිධානයක අවශ්‍යතාවයත්ය. කෙසේ වෙතත් ඔවුන් සාමාජිකත්වය නොදරණ නිරීක්ෂක රටක් ලෙස දිගටම යුනෙස්කෝව සමග සම්බන්ධව සිටිනා බවද එහිදී ප්‍රකාශ විය.

2011 වසරේදී පලස්තීනය සාමාජිකයෙකු ලෙස පිළිගැනීමත් සමග එක්සත් ජනපදය යුනෙස්කෝ සංවිධානය වෙත ආධාර ලබා දීම නවතා දැමීය.

මෙම වසරේ මුල් භාගයේදී යුනෙස්කෝ සංවිධානය දැනට ඊශ්‍රායලය විසින් අල්ලාගනු ලැබ ඇති බටහිර ඉවුරේ හෙබ්‍රොන් නගරය පලස්තීන රාජ්‍යය යටතේ ඇති ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කළේය.

මේ අතර එක්සත් ජනපදය ගත් මෙම තීරණය එඩිතර හා සදාචාරත්මක තීරණයක් ලෙස ඊශ්‍රායලය අගය කළේය. එක්සත් ජනපදය අනුව යමින් ඊශ්‍රායලයද 2018 වසරේදී යුනෙස්කෝ සංවිධානයෙන් ඉවත්වීමට බලාපොරොත්තු වේ.

## ඉන්දියාව: හිමාලයෙන් නව ශිෂ්ටාරයක් එළියට



හිමාලය ප්‍රදේශයේ ගවේශණයේ යෙදෙන ඉන්දියානු හා රුසියානු විද්‍යාඥයින් පිරිසකට මෙතෙක් හඳුනානොගත් ශිෂ්ටාචාරයක නටඹුන් සොයා ගැනීමට හැකිවී තිබේ. රුසියානු විද්‍යා ඇකඩමියේ සාමාජිකාවක් හා ඉන්දියානු හා රුසියානු ගවේෂණ කණ්ඩායමේ ප්‍රධාන ගවේශකයා වන නතාලියා පොලොස්මැක්ට අනුව මෙම නටඹුන් ඉහළ මධ්‍යතන යුගයට අයත් ඒවාය.

ආගමික ප්‍රතිමාසේ සැලකිය හැකි මෙම නටඹුන් හිමාලයේ ඈත උස්බිමක් පුරා විසිරී ඇති අතර එහි අශ්වාරෝහක ප්‍රතිමා 200ක් පමණ දක්නට ලැබේ. මෙය ඔවුන්ගේ විශ්වාසය අනුව ආගමික සංකීර්ණයකි.

## චීනය: ක්ෂී ජින් පින්ග්ට තවත් වසර පහක්



චීන කොමියුනිස්ට් පක්ෂයේ 19වැනි සමුළුවේදී ඉදිරි පස් වසර සඳහා පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ලෙස ක්ෂී ජින් පින්ග් සහෝදරයාව නැවත තෝරා පත්කර ගනු ලැබ ඇත. මීට අමතරව එහිදී හත්දෙනෙකුගෙන් යුක්ත දේශපාලන බලමණ්ඩලයේ ස්ථාවර කොමිටියක්ද පත්කරගෙන තිබේ.

ඔවුන් නම් ක්ෂී ජින්ග් පින්ග්. ලී කෙකුයැන්ග්, ලී 'සැන්ෂු, වැන්ග් යැන්ග්, වැන්ග් හුනින්ග්, ෂා ඕලෙජි සහ හැන්ග් ෂෙන්ග්ය. මෙම සමුළුව පක්ෂය විසින් ක්ෂී ජින් පින්ගේ භූමිකාවට අනුමැතිය පළ කිරීමක් මෙන්ම ඔහුගේ දූෂණ විරෝධී වැඩපිළිවෙළ ශක්තිමත් කිරීමක් ලෙසද හඳුනා ගැනේ.

කවුළුව හැරමි තබමි

# මිනිසුන් වෙනුවෙන් දිවි පිදූ සැබෑ මිනිසුන්

ඔවුහු ප්‍රබන්ධාර්ථද නොවෙති. සාහිත්‍යමය ගොඩනැංවීම්ද නොවෙති. නවකතාවල හෝ චිත්‍රපටවල මැවූ වීරයෝද නොවෙති; මහ පොළොවේ ජීවත් වූ එය වඩා යහපත් තැනක් කිරීමට වෙර දැරූ මිනිස්සු වෙති. ඔවුහු මිනිසාගේ යහපත වෙනුවෙන් අලුත් ලොවක් තැනීමට සටන් වැදුණු මහපොළවේ දේශපාලනය කළ මිනිසුන්ය. ඔවුන් ඔවුන්ගේ කතාව සිතින් මවාගත් මිත්‍ය කථාවක්ද නොවේ. එනම් ජීවත් වීම සඳහා වැඩ කළ, මහපාරේ ගමන්-බිමන් ගිය, කන-බොන, අඳින, විනෝද වූ, ආදරය කළ, සටන් කළ ඇත්තටම මිනිසුන්ට ආදරය කළ ඇත්තම ඇත්ත මිනිසුන්ය. පට්ට පල් හොරු මහ රජුන් වන මේ රටේ ඔවුන් සටන් කළේ ජනතා දේපළ හොරා කන ඔවුන්ට විරුද්ධවය. උන්ගේ අයුක්තියට, අසාධාරණයට එරෙහිවය. හඬන්නේ කුමටද, වැළපෙන්නේ කුමටද කියා නොදැන හඬන, වැළපෙන මිනිසුන්ගේ ජීවිතවලට සිනහවක් ලබාදීම වෙනුවෙනි, ඔවුන් දිවි පිදුවේ. මිනිස්සු මරණය වෙනුවෙන් කඳුළු



සාගරයක් වගුරති. මාක්ස්වාදියා මරණය වෙනුවෙන් කඳුළු නොසලයි. ඔහුගේ ඒකායන පරමාර්ථය ජීවිතයට සිනහවක් දීමය. එය අසීරුම කාර්යයයි. අතවනන මරණයත් විපිලිසර වූ ජීවිතත් අතර අතරමං වූ මිනිසුන් සහිත සමාජයක් ඉන් ගලවාගෙන සුවපත් කිරීම සඳහාය, ඔවුන් සටන් වැදුනේ. ඔවුහු සියලු සම්ප්‍රදායික අධානග්‍රාහී බැමි කඩා දැමූහ. ඇත්ත මිනිස් බැඳීම් සහිත සමාජයක් වෙනුවෙන් සටන් වැදි ඔවුහු නව යොවුන් වියේදීම තම දිවි කුසුම අත්හළහ.

රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු හැට දහසකට අධික විරුවන් පාලකයන් විසින් අමු අමුවේ මරාදමනු ලැබුවේ ඔවුන් මිනිසුන්ට ප්‍රේම කළ නිසාවෙනි. එහෙත් එම මරණයන්ට ඔවුන් වළලා දැමිය නොහැකි විය. ඒ මරණයන් ඔවුන් මෙලොව තව තවත් අලෝකමත් කළේය. අඳුරු මරණය වෙනුවට එළිය දෙන මරණයක ඔවුහු හිමිකරුවෝය. ඒ ඉල්මහ විරුවෝය.

# මහින්දගේ නගුල සහ මෛත්‍රීගේ නගුල

මේ රටේ රාජ්‍ය නායකයෝ කිහිප දෙනෙක්ම වගා සංග්‍රාම පටන් ගත්තෝය. "අපි වවමු රට හදමු" කීවෝය. ඒත් සිදුවූයේ රට වනසා උන් හැදීමය. මහින්දගේ නගුලෙන් හෝ මෛත්‍රීගේ ට්‍රැක්ටරයෙන් මේ රටේ ගොවියන්ට අමුතු ආදර්ශ දිය යුතු නැත. ගොවියෝ මඩ ගා ගනිති. වපුරති. එළ අරන් දෙති. ඔවුන් බොරුවට මඩ නාන්නෝ නොවෙති. රටකට අධික අස්වැන්නක් ලැබීම ඒ රටට ආශිර්වාදයකි. එහෙත් අපේ රටට නම් එය ශාපයකි. පසුගිය කාලයේ එවැනි අවස්ථාද අපි අත්දුටුවෙමු. එවිට රාජ්‍ය පාලකයින් කීවේ වී ගොවිතැන සීමා කරන්න කියාය. නැතිනම් නවතා දමන්න කියාය. ඒ අතර වැඩි වූ අස්වැන්නෙන් සමහරක් ගබඩාවල දිරා ගියේය. කොටසක් විකුණා ගැනීමට නොහැකිව විනාශ කර දැමිණි. වී අස්වැන්න වැඩිවන විට තොග ගණනේ විනාශ කෙරේ. එළවළු අස්වැන්න වැඩි වූ විටද තත්වය එසේමය. ඇත්ත ප්‍රශ්නය ඇත්තේ, ගොවියන් වගා නොකිරීම නොවේ. ඔවුන්ට 'වගා කරපියෝ' කියා අමුඩ කෙටි ගසාගෙන පාලකයන් විසින්







කෑ මොර දියයුතු නැත. කවුරු කීවත් නොකීවත් ඔවුහු වගා කරති. ප්‍රශ්නය ඇත්තේ එතැන නොව,ඔවුන්ගේ එළදාවට සාධාරණ වෙළඳපොළක් නොතිබීමය; සාධාරණ මිලක් නොලැබීමය. නියම පාලකයන්නම් කළ යුත්තේ ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සැකසීමය; ඊට අවශ්‍ය යටිතල පහසුකම් ගොවියන්ට සලසාදීමය. ඒ වෙනුවට සිදු කර ඇත්තේ, ඔවුන් සදාකාලික ණයකරුවන් කිරීමය. වස බී මිය යාමට සලස්වීමය. පාලකයෝ සරම් කොට ඇඳගෙන 'වවපියෝ' කියා කුඹුරට බහින විට ගොවියෝ වස බී මැරෙති. මේ රටේ සිදුවන්නේම එවැනි හතරබීරි වැඩය. පාලකයින් කුඹුරට බහින විට හාල් මිල අඟහරු ග්‍රහයා මතය. පොල් සහ එළවළු ඊටත් එහා ග්‍රහලෝකයකය. මේ අපූරු රටේ දේවල් සිදුවන්නේ එසේය. මහින්දගේ නගුලෙන්වත් මෛත්‍රීගේ නගුලෙන්වත් මේ රට අස්වැද්දිය නොහැක. ඒ සඳහා ගැලපෙන අලුත් නගුලක් සොයා ගත යුතුමය.

# අනේ අප්පේ මේව නම් සහගහන වැඩ...

"ජේ.ආර්.වත් ප්‍රේමදාසවත් කවදාවත් මන්ත්‍රීවරු හිරේ දැම්මෙ නෑ." මේ වෙන කාගෙ 'වත් නොව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ප්‍රකාශයකි. "ඔවුන් මන්ත්‍රීවරු හිරේ දැම්මෙ නෑ තමයි. ඒත් මේ රටේ තරුණ තරුණියෝ දස දහස් ගණන් අමු අමුවේ මරාදැම්මා" යැයි කියා කීමට ඔහුට එක්කෝ අමතක වෙලාය. නැතිනම් ඩීල්වලට බාධාවනු ඇතැයි සිතා චුවමනාවෙන්ම මඟහැරලාය.

මහින්දගේ කථාවෙන් තවදෙයක් ගම්‍ය වේ. ඒ මේ රටේ මන්ත්‍රීලාට, ඇමතිලාට ඕනෑම පහත් වැඩක්, තක්කඩිකමක් කළ හැකිය. ඔවුන් ලයිසන් ගත් හොරුය. ඒ නිසා ඔවුන්ට දඬුවම් දිය නොහැක. හිරේ දැමිය නොහැක. එය 'සාපරාධී', 'පාපකාරී' වැඩකි. ඔවුන්ට ඕනෑ විදිහකට, ඕනෑතරම් කැමති කැමති පරිදි



ජනතා දේපොළ, පොදු දේපොළ කොල්ල කෑ හැකිය. ඒ සඳහා 'ශුද්ධ වූ' අයිතියක් ඔවුන්ට ඇති පරිදිය. ඒ නිසා ඔවුන් හිරේ දැමීම බරපතළ අපරාධයකි. ඒවා දේව ශාපයට, දේව උදහසට ලක්වන වැඩය. මේවා හිටපු ජනාධිපතිගේ රාජතාන්ත්‍රික කතාය. රටේ සියලුම දරුවන්ගේ 'අප්පච්චිගේ' කතාය. රටේ ජනයාට අබමල් රේණුවකින්වත් වරදක් නොකළ මහරජාගේ කතාය.

විමල් කියන්නේ මේ රට ගලවාගන්න නම් නැවත මහින්දට රට දිය යුතු බවය. මේ රට විමල්ගේ නම් එසේ කිව හැක. ඔවුන් බලය තියෙනකොට වැඩකළේද එසේ සිතාය. එක් අතකට මෙබඳු ද්විත්ව කාර්ය මුඛයන්ගෙන් කියවෙන කතා ගැන පුදුම විය යුතුද නැත. කෙසේ නමුත් හොරුන්ගේ ෆයිල් සැඟවූ පල්හොරෙකුට නැවත මේ රට දෙන්නැයි කියන විට නැගෙන දුර්ඝන්ධය ඉන්දියානු සාගරයෙනුත් එපිටටද ගලා යනු වැළැක්විය නොහැකිය. නිල මැස්සන්ට අසූචි ගඳ නැතැයි කවුරුන් හෝ කියා තිබේ.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පරක්කු අතරේ කට්ටිය කඩදාසි බෝල ගැහිල්ලක් කරගෙන ගියා. කවුරුහරි කඩදාසි බෝලයක් එව්වාම ඒකට කොපි පොතෙන් ගහන එක තමයි සෙල්ලම. වැඩෙත් එක්කම සද්දෙත් නැගල ගියා. හිස්ටීරියාව පංතියට එබිල ටික වෙලාවකින් පොලිටික්ක කැන්ටිමේ ඉඳල දුවගෙන ආවා.

"ගුඩ් මෝනිං ළමයිනේ, මොකද ඔයාල සද්ද කරනව කියන්නෙ?" කවදාවත් නැතුව පොලිටික්කම ගුඩ් මෝනිං කියල කතාව පටන් ගත්ත.

"ගුඩ් මෝනිං සර්. කවුද ඒ බොරු කිවුවෙ. අපි සද්ද කළේ නෑ" අනුරුද්දිය පංතියටම චරිත සහතිකයක් දුන්න.

"කොහොම හරි සද්දෙ වැඩියි කිවුවා..." පොලිටික්ක කර්තෘ අඥාත වාක්‍යයක් දැම්ම.

"ආ... අපි පාර්ලිමේන්තුවක් දැම්ම සර්. මේ දවස්වල එතන ටිකක් විතර සද්දෙ ඒකයි." මංජුව කොළේ වැහුව.

"ආ පාර්ලිමේන්තුවක් නේද? එහෙනම් කමක් නැහැ..." පොලිටික්කට තමන් කියන්න හිටපු දෙයක් මතක් වුණා. "පාර්ලිමේන්තුව කියන්නෙ ජනතාවගෙ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක වෙන තැන. උත්තරීතර තැන."

"එහෙනම් ඒ...ක තමයි සමහරු ඒ...ක ගිලෙනකම් බලන් ඉන්නෙ." කනිය ලස්සනට ඇද...ල කිවුව.

"ඒකම තමයි සමහරු මන්ත්‍රීවරුන්ට වෙඩි තියන්න බලාගෙන ඉන්නෙ." මංජුව වෙඩි තියන්න වගේ කියල දැම්ම.

"ඇයි ඔය ළමයිට කවුරු හරි එහෙම දෙයක් කිවුවද?" පොලිටික්ක අන්දුන් කුන්දුන්.

"ඇයි සර් අර තමන්ට ඕනෙ දේවල් පාර්ලිමේන්තුවෙන් කරගන්න බැරි වුණාම ඒකට බෝම්බ දාන්න ඕනෙ කිවුවෙ. අන්න එයා තමයි ගිල්ලන කතාව කිවුවෙ. අර ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට විරුද්ධව පාර්ලිමේන්තුවෙ නඩු අහපු කෙනානෙ. එතකොට මහින්දලගෙ පාර්ලිමේන්තුව පාවිච්චි කළේ මහජනතාවගෙ බලය." සමන අටුවා ටීකා ලෙහුව. "කන්න ඕනෙ වුණාම කබරයත් තලගොයා කරනවා. එපා වුණාම තලගොයත් කබරයා කරනව."

"දැන්නම් ළමයිනේ, සයිටම් ප්‍රශ්නෙ ඉවරයක් වෙයි නේද?" වැඩේ ජොන් බාස්ට යනව දැනිල පොලිටික්ක දකුණට කැපුව.

"මහින්දල අනල තියල, දැන් මෛත්‍රීලා රනිල්ලා නාගෙන යන ප්‍රශ්නෙ නේද? ඒක මහ ... කේස් එකක්නෙ සර්!" කනියට උන් හිටිතැන් අමතක වුණා.

"තටමලා තටමලා මෛත්‍රී බිත්තරේ දැම්මට ඒක පුස්සක්" චමියත් ඩෑෂ් එකක් දුන්න.

"ඒ වුණාට ළමයිනේ දැන් කොහොම හරි සයිටම් වහනව නේද?" පොලිටික්ක තාමත් බේරන්න හදනව.

"අනෙක ඕක මහ ලොකු අලුත් යෝජනාවක් නෙමෙයිනෙ... පීඑච්අයිලා පැනලා කුණු මස් මාළු අහුවුණාට පස්සෙ ඕනැම කබල් හෝටලයක් කරන වැඩේනෙ... බිත්තිවල අලුතෙන් තීන්ත ගාලා වෙන නමකින් රෙජිස්ටර් කරල ආයෙත් පටන් ගන්නව. ආදායම් බදු ගෙවන්න කියල ලියුම ආපුවහමත් කරන්නෙ ඔය වැඩේ. ලේබර් එකෙන් ඊපීඑෆ් ගෙවන්න කියල ආවහමත් කරන්නෙ ඕකම තමයි. ආණ්ඩුව කරලා තියෙන්නෙ පනින රිලවුන්ට ඉණිමං බැඳපු එක. ඇත්තටම මෙතන විසඳුම දීල තියෙන්නෙ නෙවිල්ට," සමන ආණ්ඩුවෙ නිවේදනේ කාටත් තේරෙන්න සාරාංශ කළා.

## ජනතාව හරි දේ...

03 පිටුවෙන්



බැහැ. ගම වෙනුවෙන් සමාජ සේවයක් කරන්න සාමාන්‍ය තරුණයෙකුට, විශ්‍රාමික නිලධාරියෙකුට, ප්‍රගතිශීලී පුරවැසියෙකුට, කාන්තාවකට පරණ ඡන්ද ක්‍රමය ඇතුළෙ අවස්ථාවක් තිබුණෙම නැහැ. දැන් අපි ගෙනාව අලුත් ඡන්ද ක්‍රමයෙන් ගමට සේවය කරන්න පුරවැසියන්ට අවස්ථාවක් ගන්න පුළුවන්. යූ.ඇන්.පී.-ශ්‍රී ලංකා දේශපාලනය විසින් විනාශ කරපු රට ගොඩනැඟීමේ වැඩපිළිවෙළට ආරම්භයක් ගන්න, බිම් මට්ටමෙන් ගම් මට්ටමෙන් පොදුජන බලයක්, පුරවැසි ශක්තියක් ගොඩනගන්න පුළුවන්. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. එන්න අපිත් එක්ක අත්වැල් බැඳගන්න. රට හදන්න ගමනක් යන්න පටන් ගන්න.

***නියමුවා:- වත්මන් ආණ්ඩුවේ ආර්ථික ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජනතාව තුළ ප්‍රබල විරෝධයක් ගොඩනැඟෙමින් තිබෙනවා නේද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** ඔව්. මීට කලිනුත් තිබුණෙ මේ ප්‍රතිපත්තියම තමයි. මීට කලින් ආණ්ඩුවලටත් ජනතාවගේ ප්‍රබල විරෝධයන් ගොඩ නැඟුණා. ගොඩ නැගුවා. 1980 ජූලි වර්ජනය ගත්තත් දැවැන්ත විරෝධයක් තමයි. කටුනායකදී, හලාවතදී ප්‍රබල සටන් ඉදිරියට ආවා. 77 ආණ්ඩුව ඉවර වුණේ, විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දෙන්න. "යළි පුබුදමු ශ්‍රී ලංකා" රනිල්ගෙ ප්‍රතිගාමී ආර්ථික ප්‍රතිපත්තිය එදා පස්සට තල්ලු කළා. අද අම්පාරෙ - මොනරාගල ගොවි ජනතාව උක් වගාවෙන් බැටකනවා. උක්ගොවි වහල් ක්‍රමයට විරුද්ධව සටනක් අඛණ්ඩව යනවා. ඉඩම් මංකොල්ලකාල, උක් වගා කරන්න යනවට විරුද්ධව බිබිල, රිදීමාලියැද්ද, මැදගම වගේ ප්‍රදේශවල සටනක් යනවා. බදුල්ල, මොනරාගල, අම්පාර, දිස්ත්‍රික්කවල විශාල ප්‍රදේශයක් පුරා එම සටන ඉදිරියට ඇවිත්. සයිටම් සටනත් ආර්ථික ප්‍රතිපත්තිය එක්ක ගැටෙන එකක්. හැම තැනම සටන්වලින් අඩුවක් නැහැ. මේක හොඳ තත්වයක්. තවත් සටන් වැඩිකරන්න ඕනෑ. ඒක අපේ වගකීමක්. අපි ඒක කරනවා.

***නියමුවා:- මේ තත්වයන් තුළ රටේ ඉදිරිය කෙසේ වෙනු ඇද්ද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** ඉදිරිය සටන්ම තමයි. පළමුව විරෝධතා සටන්. එම සටන්වල කෙළවර ප්‍රගතිශීලී පොදු ජනතාවගේ ආණ්ඩුවක් සහ රජයක්. ආර්ථිකය දිගටම කඩාගෙන වැටෙනවා. සමාජය කඩාගෙන වැටෙනවා. මිනීමැරුම්, අපරාධ වැඩිවෙනවා. කුඩු මත්පැන් රට වෙළාගන්නවා. ජීවත්වෙන්න ඕන දෙයක් කරන්න සූදානම්, ජරාවැඩක් කරන සමාජයක් දැනටම ඇවිත්. බල්ලො මරල සල්ලි හොයපු කාලෙ දැන් ඉවරයි. මිනී මරල සල්ලි සොයන කාලෙ මේ. මිනියෙනුත් සල්ලි හොයනවා. ගන්න දෙයක් මේ සමාජයේ දැන් නැහැ. කුණු වෙලා ඕජස් ගලනවා.

අලුත් සමාජයක් නැතිව මේකෙ ඉන්න බැහැ කියල තේරුම් අරන් අලුත් සමාජයක් හදන්න බලයක් හදමු. සමාජවාදය විතරයි උත්තරේ.

## අයවැය කයිවාරු...

07 පිටුවෙන්

සිදුවූයේ කුමක්ද?



අයවැය අතරමැද කාලවලදී ඉදිරිපත් කරනු ලබන අමතර වියදම සඳහා මුදල් වෙන්කිරීමේ පරිපූරක ඇස්තමේන්තු සඳහා මෙම වියදම නොකළ මුදල් බොහෝ ප්‍රමාණයක් වෙන්කරනු ලැබ ඇත. එසේම බොහෝ ප්‍රතිඵලදායක නොවන මහා පරිමාණ ව්‍යාපෘති මුවාවෙන් වියදම් කර ඇත.

ජනතාවට අත්‍යාවශ්‍යම සේවා සපයන අමාත්‍යාංශවල වියදම 50%ක්වත් නිසි පරිදි යොදවා නැතත්, ණය ගෙවීමේ කටයුත්ත තම අඩුපාඩුවකින් තොරව නිසි කලට ආණ්ඩුව සිදුකළ බව පෙනේ. 2017දී ණය වාරික ගෙවා පියවිය යුතු ප්‍රමාණය බිලියන 1626ක් වූ අතර, අයින් 82%ක් එනම්, බිලියන 1337ක්ම 2017 සැප්තැම්බර් 30 වන විට ගෙවා අවසන් කර ඇත.

### 2018 වෙන්කිරීම

මේ වන විට 2018 අයවැය යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැතත්, වියදම් සීමාවන් ලකුණු කරන විසර්ජන පනත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, ආණ්ඩුවේ මුළු වියදම 2018 වසර සඳහා රු:බිලියන 1977ක් ලෙසත් ණය ගැනීමේ අවශ්‍යතාවය බිලියන 1813ක් ලෙසත් දක්වා ඇත. ඉන් පැහැදිලි වන්නේ, 2017 වසරට වඩා වියදම අඩු කර, ණය ගැනීම වැඩිකර ඇති බවයි.

### 2018 ආණ්ඩුවේ අසීරුම ඡන්ද වර්ෂයක්

විශේෂයෙන්ම ජනවාරියේ පළාත් පාලන ඡන්දය පවත්වන නිසාත්, අයවැය යෝජනා මගින් ජනතාව පිනවන කැරට් මල්ලක් දික්කිරීමේ හැකියාව ඇතත්, ඒ සඳහා මුදල් ඉපැයීමට ආදායම් යෝජනා ලෙස බදු පැනවීමටද, ආණ්ඩුවට සිදුවනු ඇත. විශේෂයෙන් ණය ප්‍රභවයන් සීමාවීමත් ආදායම් මාර්ග හැකිළී ඇති නිසාත් නාස්තිකාර වියදම් ඉහළ යාමෙන් ඇති කළ අර්බුදයට විසඳුම් නැති තත්වය යටතේ කඩා වැටෙන ආර්ථිකයට විසඳුම් මාර්ගයක් මෙවර අයවැය මගින්ද අපේක්ෂා කිරීම ඵල රහිත වෑයමකි. අයවැයද ජනතාව රැවටීමේ ධනේශ්වර මෙවලම්වල යල්පැන ගිය තවත් එක් උපකරණයක් පමණි.

## ආණ්ඩු විරෝධයේ...

05 පිටුවෙන්



පාර්ලිමේන්තුවේ ප්‍රබල විවේචනයක් කළේද නැත. රාජපක්ෂ කල්ලිය පාර්ලිමේන්තුවේ ඝෝෂාකර ඇත්තේ, තම කල්ලියේ වුවමනාඑපාකම් සඳහාය. වරක් තමන්ට විපක්ෂ නායකකම ලබා ගැනීමට පාර්ලිමේන්තුවේ කලබල කළ ඔවුහු යළි තමන්ට එරෙහිව වංචා දූෂණ පිළිබඳ නිතිය ක්‍රියාත්මක වන විට එය වළක්වා ගැනීමට ඝෝෂා කළෝය. එසේ නැතිව ජනතාවගේ ප්‍රශ්නවලදී රාජපක්ෂවරු පාර්ලිමේන්තුවේ නිහඬය. සත්‍යය එයයි. එහෙත් එම රාජපක්ෂ කල්ලිය ආණ්ඩු විරෝධී යැයි සමහරු සිතති. පුදුමය එයයි.

අනෙක් අතට හොරකම්වලට එරෙහිව නිතිය ක්‍රියාත්මක වෙන ආකාරය දෙස බලනවිට ඉතාම පැහැදිලි වන්නේ, මහින්ද රාජපක්ෂ මහතා හා රනිල් වික්‍රමසිංහ මහතා අවබෝධයෙන් ක්‍රියාකරන බවය. ඊට උදාහරණ ඕනෑතරම් තිබේ. වීරවංශ මන්ත්‍රීවරයා සිය අමාත්‍යාංශයේ දේපළ අයථා පරිහරණය නිසා රක්ෂිත බන්ධනාගාර ගත වී බන්ධනාගාරයේ සිටීමට නොහැකිව එළියට ඒමට දඟලමින් සිටි වීරවංශ මන්ත්‍රීවරයාට ඇප ලබා ගත්තේ මහින්ද - රනිල් හමුවීමක ප්‍රතිඵලයකින් බව ප්‍රසිද්ධ රහසකි. එසේම හිටපු ජනාධිපතිවරයාගේ ලේකම් ලලිත් වීරතුංග, ජනාධිපතිවරණ සමයේ සිල් රෙදි බෙදීමේ වංචාවට වරදකරු වී අනූෂ පැල්පිටද සමගින් වසර තුනක සිර දඬුවමකට යටත්වූ විට දින 10ක් යාමට පෙර අභියාචනාවක්ද ඉදිරිපත් කර ඇප ලබා එළියට ආවේ රනිල් වික්‍රමසිංහගේ මැදිහත් වීමෙන් නීතිපතිවරයා ඇපදීමට විරුද්ධ නොවූ නිසා බව ප්‍රසිද්ධ රහසකි.

රුපියල් මිලියන 30ක වංචාවක් කර රටින් පිටව සිටියෙදී වරෙන්තු පවා නිකුත්කොට අබුඩාබියේදී "අත්අඩංගුවට" ගත්, නාමල් රාජපක්ෂගේ හිටපු ලේකම්වරියට අධිකරණයේ 'ඇප' ලැබුණේද ආණ්ඩුවේ ප්‍රබලයන්ගේ මැදිහත්වීම නිසා බව ප්‍රසිද්ධ කරුණකි. ඒ අනුව බලනවිට නාමල් රාජපක්ෂ මහතාද ඇතුළු මහින්ද පාර්ශ්වයේ බොහෝ දෙනා 'එළියේ' සිටින්නේ රනිල්ගේ 'ඇප' මතය. රනිල්ගේ 'ඇප' මත එළියේ සිටි අය ජනතා විමුක්ති පෙරමුණට රනිල් වික්‍රමසිංහ සමඟ 'ඩීල්' තිබේයැයි පැවසීම සරල විහිළුවක් නොව දේශපාලන තක්කඩිකමකි.

රාජපක්ෂවරුන්ට බලතණ්හාවක් ඇති බව සැබෑය. සිරගත කරනු ලැබීමේ බියක්ද තිබෙන බව සැබෑය. ඒ නිසාම ඔවුන්ට ඇත්තේ, එක්සත් ජාතික පක්ෂය සමග විරෝධයක් නොව සබඳතාවකි. ඔවුන්ගේ ආණ්ඩු විරෝධය ව්‍යාජයකි. ඔවුන්ගේ සැබෑ විරෝධය පවතින්නේ, ආණ්ඩුව සමග නොව මෙම ආණ්ඩුව වැටෙන විට තමන්ට ආණ්ඩුවක් හදා ගැනීමේ අවස්ථාව අහිමි කරමින් ජනතාවගේ ආණ්ඩුවක් හැදීම සඳහා බලවේග පෙළගස්වන ජනතා විමුක්ති පෙරමුණට එරෙහිවය. සත්‍යය එයයි. මෙම පැහැදිලි සත්‍යය වටහා ගැනීමට අපේ රටේ බහුතර ජනතාවක් සමත් වුවහොත් රටේ අනාගතය සැබවින්ම සුබ එකක් වනු ඇත.

## මුළු රටම නියෝජනය වන...

16 පිටුවෙන්

පවත්වා ගන්න. මොකද, ආණ්ඩුව පිළිබඳව ජනතාවගේ ඇගයීමක් ගන්න හොඳ අවස්ථාවක් තමයි එකවර මුළු රටේම ඡන්දයක් පැවැත්වෙන එක.

ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස ජනතාවගේ ඡන්ද අයිතිය තහවුරු කිරීමටත් මැතිවරණයේදී ජනතා නියෝජනය සාධාරණ ලෙස ප්‍රකාශ වීමේ අයිතිය වෙනුවෙනුත් අඛණ්ඩ අරගලයක නිතර වෙනවා. දැන් නිසි පරිදි පළාත් පාලන මැතිවරණය පවත්වා ගැනීමට ඉඩ විවර වෙලා තිබෙනවා. ඒ අරගලය සම්බන්ධයෙන් අපිට සතුටක් තිබෙනවා. අපේ දායකත්වය මත ජනතාවට සාධාරණ ඡන්දයක් ලබාදීමට හැකිවුණා.

## පාදඩ දේශපාලන සංස්කෘතිය...

දේශපාලන පක්ෂයකට පමණක් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. සාමාන්‍ය ජනතාව පෙරට එන්න ඕනෑ. අද අපේ රටේ තිබෙන අර්බුදය පොදු ජනතාව බහුතරයක් නිහඬතාවයක, මිත්‍යාවක ගිලිලා, රැවටිලා සිටීමයි. අර්බුදය දැක දැක ජනතාව වෙනත් පැත්තකට ගමන් කරමින් ඉන්නවා. ජනතාවගෙන් බහුතරයක් මේ ඇත්ත තත්වය තේරුම් ගන්න තුරු අපේ රටට ගොඩ එන්න බැහැ. ජනතාව මිත්‍යාවෙන් මුදවා ගන්න ඕනෑ. අපේ රටේ ගුරු පරපුරට ඒ වෙනුවෙන් කාර්යභාරයක් තිබෙනවා. මාක් ට්වේන් කියන ඇමරිකානු ජාතිකයා කියා තිබුණා ජනතාව රැවටීමෙන් මුදවා ගන්නවාට වඩා ඔවුන් රැවටීම පහසුයි කියලා. එජාපය ශ්‍රීලනිපය අද කරමින් ඉන්නේ ඒ පහසු වැඩේ. ජ.වි.පෙ. අපි කරමින් ඉන්නේ ජනතාව රැවටීමෙන් මුදවා ගැනීමේ අසීරු කාර්යයි. කොපමණ අසීරු වුවත් අපි එය කරනවා."

## බඩු මිල ඉහළ යෑම

ඇස්තමේන්තු සඳහා වෙන් කරන්න මුදල් තිබෙනවා. නමුත් ජනතාවගේ ජීවන වියදමට උත්තර හොයන්න ආණ්ඩුවට සල්ලි නැහැ. ආණ්ඩුවට අපි කියනවා විහිළු සපයන්න එපා කියලා. මොකද අද ජනතාව ඉන්නේ හිනාවෙන්න පුළුවන් තත්වයක නෙවෙයි".

## මනුෂ්‍යත්වයේ වසන්තය...

12 පිටුවෙන්

වසන්තයවූ කලී සමාජවාදී රුසියාවයි. (Spring time of humanity) කියලයි. ඉරීනා මලෙන්කෝ ලියූ 'සෝවියටිකා' කෘතියේ ඇය දුටු සෝවියට් දේශය ගැන සඳහන් කරනවා. සෝවියට් දේශයේ බිඳවැටීම ගැන ලෝකයේ පැතිරුණු ව්‍යාජ කතන්දරවලට ඇ උත්තර දෙනවා. ලෝකය තනි යායක් හැටියට මිනිස්කමෙහි කොන්දේසි සුරැකුණු අපූරුව ඇ සඳහන් කරනවා. වසර විස්සකට මිනීමැරුම් දෙකයි ඇයට අසන්න ලැබෙන්නේ. අනෙකාගේ නිදහස ඒ තරම් තිබූ සමාජයක් ගොඩනගන්න ඔවුන්ට පුළුවන් වුණා නම්, ඒ මූලධර්මයේ අදට තියෙන ගැටලුව මොකක්ද? ගුණදාස අමරසේකර හෝ නලින් ද සිල්වා වගේ කෙනෙකු කලබල වෙන්නේ නැතිව ඒ ගැන පැහැදිලි කරනවා නම් හොඳයි.

අපි මේ කරමින් ඉන්නේත්, ඒ ගැටලුව ගැන හොයන එක. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය ස්මරණය කරන්නේත් ඒ වෙනුවෙන්. මායාකොව්ස්කි විප්ලවයට වසරකට පසු 1918දී Left March කෘතිය ලිව්වා. විප්ලවයට දස වසරක් ගත වුණාම සර්ජි අයිගෙසිටයිසින් 'ඔක්තෝබර්' කියලා චිත්‍රපටයක් අධ්‍යක්ෂණය කළා. 1930 ගණන් වන විට සමාජවාදී යථාර්ථවාදය කේන්ද්‍රීය සාහිත්‍ය දර්ශනය බවට පත්වී තිබුණා. 1924දී සිදුවූ ලෙනින්ගේ අකල් මරණය නිසා ශ්‍රේෂ්ඨ සෝවියට් රාජ්‍යය වෙනත් පාරකට යොමුවී නිර්මාණවලට බලපෑම් ආවා. නමුත්, මැක්සිම් ගෝර්කි වගේ කේන්ද්‍රීය රචකයකු පිරිවරාගෙන සෝවියට් සාහිත්‍යය ගොඩනැගෙන ආකාරයත් ඒ තුළම දකින්නට පුළුවන්.

සෝවියට් වේවා, රුසියානු වේවා, සාහිත්‍යය වෙත නැවත හැරෙන්නට වකවානුවක් එළැඹී තිබෙනවා. ඇලෙක්සැන්ඩර් පුෂ්කින්ගෙන් පටන් ගත්තාම 1799 ඉඳලා 1824 වෙනකම් අවුරුදු තිස්හයක් තුළ ලියූ සියලුම දේවල් ගැන ඔවුන්ගේ විචාරකයන් කියන්නේ, "අපගේ සියලුම ආරම්භයන්ගේ ආරම්භය පුෂ්කින්" කියලයි. ඒ වාගේම නිකොලායි ගොගොල් අවුරුදු හතළිස්තුනයි හිටියේ. මේ කාලය ගැන ලියන්නේ, ගොගොල්ගේ කබායෙන් ඉපැදුණු ලේඛකයෝ වශයෙනුයි. තොල්ස්තෝයි අවුරුදු අසූදෙකක් ජීවත් වුණා. සිටුවරයකු වුණාට මහ පාරට බැහැලා ගිහිල්ලා, දුම්රිය වේදිකාවක මිය යන්නේ. ඔහු මිය යන මොහොතේ අසල සිටි කම්කරුවෙක් දුම්රිය වේදිකාවේ තිබූ ඔරලෝසුවේ කටු නතර කළා. පසු කාලයක ඒ ඔරලෝසුව කෞතුක භාණ්ඩයක් බවට පත් කළ බව මා කියවා තිබෙනවා. තොල්ස්තෝයි මිය ගිය මොහොත සටහන් වෙන්නේ ඒ ඔරලෝසුවේ.

පියදෝර් දොස්තයෙවුස්කි ජීවත් වුණේ අවුරුදු හැටයි. මේ හැම දෙනාමත් හරි මිහායිල් ලෙර්මන්තොෆ් අවුරුදු විසිහයක් ජීවත්වී 'අපේ කාලයේ වීරයෙක්' වගේ කෘති ලිව්වා. ඉවාන් තුර්ගේනෙෆ් අවුරුදු හැටහතරක් ජීවත්වී 'පියවරු සහ පුත්තු' වගේ කෘති ලිව්වා. ඇන්ටන් චෙකොෆ් අවුරුදු හතළිස්හතරක් තුළ මහා සාහිත්‍යයක් ගොඩනැඟුවා. චෙකෝෆ් ලංකාවට ඇවිත් 'ග්‍රෑන්ඩ් ඔරියන්ටල්' හෝටලයේ රාත්‍රියක් නතරවී සිට ගොස් තිබෙනවා. මිහයිල් ෂොලහොෆ් 1984 වෙනකම් ජීවත්ව සිටියා. 'දොන් නදිය නිසලව ගලා බසී' නවකතාව කාණ්ඩ හතරකින් නිර්මාණය කළ මහා සාහිත්‍ය කෘතියක්. මහින්ද සෙනරත් ගමගේ එය මේ නමින් සිංහලයට පරිවර්තනය කර තිබෙනවා. මේ කෘතියේ පිළිගැන්වීම නැවත කියවන්න කියලා ආරාධනය කරන්න මම කැමැතියි. එය පිළිගන්වා තිබෙන්නේ, අසූඅට අසූනවය කාලයේ සටන් වැදුණු ඇතැම් සගයන්ට.

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි අන්ධභාවයට පත් වුණත්, "මා නැවතත් මිනිසුන් අතරට ආවා" කියලා කිව්වේ සාහිත්‍ය නිර්මාණයෙන් අලුත් ජීවිතයක් ලබා ගත් නිසයි. සිදුරු කපා ගත් කාඩ්බෝඩ් එකක් කඩදාසියක් මත තියලා, ඔහු ලේඛනයේ යෙදුණේ අපේ ජී. බී. සේනානායකයන් වගේ අපරිමිත ප්‍රයත්නයක් දරමින්. ඔස්ත්‍රොව්ස්කි කියන්නේ, "මිනිසාගේ ජීවිතය මිනිසාට ලැබෙන්නේ එක් වරක් පමණි. ඔහු මිය යන විට මෙසේ කියන්නට පුළුවන් වෙන්න ඕනෑ ජීවත් වෙන්න යුහුසුළු වෙන්න මක් නිසාද හදිසි රෝගාබාධයන් නිසා ජීවිතය කෙටි කර දමන්න පුළුවන්." කියලයි ඔහු අවවාද කළේ. මේ සෝවියට් ලේඛකයන් ආදර්ශයට ගනිමින්, අද මේ වේදිකාවේ ඉන්න ටෙනිසන් පෙරේරා සූරීන් ඇස් පෙනීම ඉතාම දුර්වලවී තිබියදීත්, අරාබි නිසොල්ලාසය මහා කෘතිය සිංහලට පරිවර්තනය කරමින් ඉන්නවා. ඇන්තනි ජීවා මහලු වෙලා සිටියදීත් සාහිත්‍යයට ඇප-කැපවී ඉන්න බව අපි දන්නවා.

එදා ඔස්ත්‍රොව්ස්කි කිව්ව වාක්‍යය මේ අයට කියන්න පුළුවන්. "මගේ මුළු ජීවිත කාලයත්, ශ්‍රමයත් මිනිසුන්ට විමුක්තිය ලබා දීමේ ශ්‍රේෂ්ඨ සටන වෙනුවෙන් මා කැප කළා." කියලා අඩු-වැඩි වශයෙන් ඔය හැම දෙනාටම කියන්න පුළුවන්. විවිධ තැන්වල ඉඳගෙන අපි කරමින් ඉන්නේ, ඒ කර්තව්‍යය. ඇතැම් විට ස්වරූපය වෙනස් වෙන්න පුළුවන්. අප ශාස්ත්‍රාලයේත්, ඔබ මහ පාරේත් වෙන්න පුළුවන්. එහෙත්, රත්න ශ්‍රී කිවිඳුන් කීවා වාගේ කොහේදී හෝ නොවෙයි, එකම තැනකදී අප මුණගැහෙන්න නියමිතයි.

සෝවියට් සාහිත්‍යයට ජාත්‍යන්තර සම්මාන හිමි වීමට පටන් ගත් කාලයේ විවිධ සංකීර්ණතා සහිතව අපි අතරේ සැරිසරමින් තිබෙනවා. සෝවියට් සිනමාවත් එහෙමයි. රුසියාවේ සහ සෝවියට් දේශයේ නොබෙල් ත්‍යාගයෙන් පුද ලද සාහිත්‍යවේදීන් හත් දෙනෙකු සිටිනවා. ඉවාන් බුකින්, බොරිස් පැස්ටර්නැක්, මිහයිල් ෂොලහොව්, ඇලෙක්සැන්ඩර් සොස්කිනෙට්සික් හා ජෝශප් රොඩ්ස්කි කියන අය. මාගේ කතාව සමාප්ත කරන්නේ, ඉතාමත් සතුටින්. අපේ ජීවිතයේ අති ශ්‍රේෂ්ඨත්වයෙන් හා උණුසුමින් ස්මරණය කරන ඔක්තෝබර් විප්ලවයට අවුරුදු සියයක් පිරෙන මොහොත මේ විදියට ස්මරණය කරන ඓතිහාසික මොහොත නිර්මාණය කළ ජනතා විමුක්ති පෙරමුණේ සියලුම සහෝදරවරුන්ට මාගේ ස්තුතිය පුද කරනවා. මා කලින් කීවා වාගේ කඩයක් වෙලා තියෙන අපේ ගෙදර, ගෙදරක් බවට පත් කරගෙන පදනමත්, මතු මහලත් වෙන වෙනම හඳුනා ගන්නට උදවු වෙන ශ්‍රේෂ්ඨ ඔසුවක් සාහිත්‍යය කියන්නේ. ඒ ඖෂධය වැඩි වැඩියෙන් ඔබ කරා ලැබේවායි පතමින් මා නිහඬ වෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ගුරුසේවා සංගමයේ සමුළුවට සහභාගි වෙමින්...



අධිවේගයට යටවෙන ඉඩම්වලට වන්දි ඉල්ලා...



පෙරපාසල් සඳහා උපකරණ ලබාදෙමින්..




ඉතාලියේ මානව හිමිකම් පෙළපාලියක...




ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට සහභාගි වී...



50වැනි සමරුවේදී චේට උපහාර දක්වමින්...

## මුළු රටම නියෝජනය වන ඡන්දයක් ලබාගත හැකිවීම ජනතා ජයග්‍රහණයක්

### ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස ජනතාවගේ ඡන්ද අයිතිය තහවුරු කිරීමටත් ජනතා නියෝජනය සාධාරණ ලෙස ප්‍රකාශ වීමේ අයිතිය වෙනුවෙනුත් අඛණ්ඩ අරගලයක නිතර වන ප්‍රකාශ කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා මේ වන විට නිසි පරිදි පළාත් පාලන මැතිවරණය පවත්වා ගැනීමට ඉඩ විවර වී තිබෙන බවත් එම අරගලය සම්බන්ධයෙන් සහ සිය පක්ෂයේ දායකත්වය මත ජනතාවට සාධාරණ ඡන්දයක් ලබාදීමට හැකිවීම පිළිබඳව සතුටක් තිබෙන බවත් කියා සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 10වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"2012දී බැසිල් රාජපක්ෂ මැදිහත් වෙලා සකස් කළේ විකෘති ඡන්ද ක්‍රමයක්. එම ඡන්ද ක්‍රමයේ බහුපක්ෂ දේශපාලනයට ඇති ඉඩ අහුරා ද්විපක්ෂ දේශපාලනයට ඉඩ හැදුවා. පළාත් පාලන මැතිවරණය ප්‍රධාන පක්ෂ දෙකකට කේන්ද්‍රගත කිරීමට බැසිල් රාජපක්ෂලා උත්සහ කළා. එම සීමා නිර්ණය නිවැරදි කිරීම සඳහා අසෝක පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත්කළා. කමිටුව වසර එක හමාරක් පමණ කාලයක් ඇතුළත ජනතා අදහස් සැලකිල්ලට ලක් කරමින් සීමා නිර්ණයන් නැවත සකස් කළා.

දෙවන අභියෝගය වුණේ විකෘතිසහගත ඡන්ද ක්‍රමය වෙනස් කිරීමයි. ඒ සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීම්වලදී දීර්ඝ අරගලයක් සිදුකොට ඒ අනුව සෑම ඡන්දයකටම සාධාරණ බලයක් ලැබෙන කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් ලැබෙන, කාන්තා නියෝජනය ශක්තිමත් වන, මනාප ක්‍රමය අහෝසි කළ නව ඡන්ද ක්‍රමය පාර්ලිමේන්තුවේදී සම්මත කරගන්න හැකිවුණා. නමුත් එම ඡන්ද ක්‍රමය සර්වසාධාරණ එකක් කියලා අපි කියන්නේ නැහැ. නමුත් සාපේක්ෂව හොඳ තත්වයක්.

පසුගිය කාලයේ රාජපක්ෂ කණ්ඩායම විසින් විශාල චෝදනාවක් එල්ල කළා ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභා ඡන්ද කල්දාන්න ආණ්ඩුවට උදව් කළා කියලා. අපි ඒ කණ්ඩායම වගේ එක එක වෙලාවට එක එක දේවල් කිවුවේ නැහැ. අපි සැලසුමක හිටියා රටේම පැවැත්වෙන පළාත් පාලන මැතිවරණයක් 15 පිටුවට

## පාදඩ දේශපාලන සංස්කෘතිය වෙනුවට රට හදන්න කැමති අය අපිත් එක්ක එන්න

### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී ජ.වි.පෙ. අපේක්ෂකයින්ට අමතරව නව දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් පෙනී සිටින, පෞද්ගලිකත්ව අරමුණු නැති, වංචා දූෂණවලට එරෙහි දැනුම හැකියාව තිබෙන අයට අවස්ථාවක් දීමට තම පක්ෂය සූදානම් බව පැවසූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ඒ වෙනුවෙන් ජනතාවට ආරාධනා කරන බවත් එම වුවමනාව තිබෙන සියලු දෙනාට පක්ෂය විවෘත බවත් කියා සිටියේය.

ටිල්වින් සහෝදරයා මෙසේ පැවසුවේ, පසුගිය 13වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පැවති ලංකා ගුරුසේවා සංගමයේ 19වැනි වාර්ෂික සමුළුව අමතමිනි. වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සහෝදයා මෙසේද පැවසීය.

"අද අපේ රටේ දේශපාලනය පිරිහිලා. දේශපාලඥයා හොරෙක් තක්කඩියෙක් ස්ත්‍රී දූෂකයෙක් වංචාකාරයෙක් බවට පත්වෙලා. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස ඒකෙන් මිදිලා තිබෙන්නේ. තක්කඩිකමට, හොරකමට, පෞද්ගලික අරමුණුවලට කරන දේශපාලනය වෙනුවට සමාජයට සේවය කිරීමේ අරමුණ පෙරදැරි කරගත් දේශපාලනයක් අපේ සමාජයට එකතු වෙන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ ඒ කටයුත්ත ඉටු කරලා තිබෙනවා. ඒ සඳහා හොඳ මිනිස්සු දේශපාලනයට එන්න ඕනෑ. නරක මිනිස්සු දේශපාලනයට එන වළක්වන්න ඕනෑ. වැඩිපුර දැනුම තියෙන අය දේශපාලනයට එන්න ඕනෑ. හොරකම් කරන, තක්කඩිකම් කරන පුද්ගලයින් ස්ත්‍රී දූෂකයින්, ගුරුවරු දණගස්වන අය, රාජ්‍ය සේවකයින් ගස් බඳින අය දේශපාලනයට එනවා වෙනුවට ගුරුවරයා රාජ්‍ය සේවකයා වැනි සමාජයට වැඩක් කරන්න පුළුවන් පුද්ගලයින් දේශපාලනයට අතට ගන්න ඕනෑ.

මිනිසුන්ගේ මනස හැදීම කුඩා කාලයේ සිට ආරම්භ කළ යුතු වගේම මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම බිම්මට්ටමින් ආරම්භ කළ යුතුයි. ඒ සඳහා හොඳම අවස්ථාව තමයි පළාත් පාලන මැතිවරණය. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකත්වයට එන්න පුළුවන් අයට එන්න කියලා අපි ආරාධනා කරනවා. ඉදිරියේදී රට වෙනස් කරන්න පුළුවන් දිගු ගමනක් ජ.වි.පෙ. විසින් ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා මේ වනවිට බොහෝ පිරිසක් සහාය දෙමින් ඉන්නවා. ඒ දේශපාලන බලවේගය සඳහා ඔබේ දායකත්වයත් ලබාදෙන්න කියලා අපි ඉල්ලනවා.

මේ සමාජය මුහුණදීලා තිබෙන තත්වය වෙනස් කරන්න ඕනෑ. මේ වෙනස වෘත්තීය සමිතිවලට, 15 පිටුවට

## බඩු මිල ඉහළ යෑම පාලකයින්ට දැනෙන්නේ නැහැ

### ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



ආණ්ඩුවට නිසි ආර්ථික ප්‍රතිපත්තියක් හෝ කළමනාකරණයක් නැතිකමින් ජනතාව බරපතළ ලෙස ආර්ථික පීඩනයකට ලක්වී ඇතැයි චෝදනා කළ ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, එහෙත් ජීවන බර වැඩිවීමට, ණය පොළී වැඩිවීමට ගෙවන්නට සිදුවී ඇත්තේ, රටේ ජනතාවට බව පෙන්වා දුන්නේය.

ඔහු මෙම අදහස් පළ කළේ, පසුගිය 04වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හඳුන්නෙත්ති සහෝදරයා, මෙසේද කීය.

"මේ වනවිට ආණ්ඩුවට පාලනය කරගත නොහැකි ලෙස රුපියල කඩාවැටිලා. ඩොලරය රුපියල් 155ක් දක්වා ඉහළ ගිහින්. වසර දෙකකට පෙර ගත් ණය සඳහා ඩොලරයකට රු.25ක් වැඩිපුර ගෙවන්න සිදුවෙලා. . සෑම පාරිභෝගික භාණ්ඩයක්ම මිල ඉහළ ගිහින්. බඩු මිල ඉහළ යෑම පාලකයින්ට දැනෙන්නේ නැහැ. කොළඹ පාරිභෝගික මිල දර්ශයකයට අනුව 2013 පදනම් වර්ෂය ලෙස ගත්තද දෙමව්පියන් සහ දරුවන් දෙදෙනෙකු සිටින කොළඹ ජීවත් වන පවුලකට මසකට රු.60,364ක් දැරීමට සිදුවෙනවා. එසේ තිබියදී එස්.බී. දිසානායක ඇමතිවරයා කියනවා, සිව්දෙනෙකුගෙන් යුත් ගෘහ ඒකකයකට වියදම වන්නේ රු.17,308ක් බව. ඔහු එය ගණනය කොට තිබෙන්නේ ඒකපුද්ගල දරිද්‍රතා රේඛාවට අනුවයි. ඒකපුද්ගල දරිද්‍රතා රේඛාව යනු නොමැරී ජීවත් වීම සඳහා එක් පුද්ගලයෙකුට අවශ්‍ය කැලරි ප්‍රමාණය ලබාගැනීමට වැය රු. 4,327ක මුදලයි. එය ගණනය කරන්නේ අධ්‍යාපනය, විනෝදාස්වාදය, ප්‍රවාහනය, සෞඛ්‍ය සඳහා වියදම සලකන්නේ නැතිවයි. එහෙමනම් ආණ්ඩුව කියන්නේ නොමැරී ඉන්න පමණක් අවශ්‍ය කැලරි ප්‍රමාණය ගනිල්ලා කියලද?

ආණ්ඩුවට වාහන ගෙන්වන්න, කාර්යාල නඩත්තු කරන්න පරිපූරක 15 පිටුවට







බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.